


2016
වාර්ෂික වාර්තාව

CEYLON PETROLEUM STORAGE TERMINALS LIMITED


සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්


කන්කසන්තුරේ තොග ගබඩාව
අනුරාධපුර තොග ගබඩාව
මඩකලපුව තොග ගබඩාව
කුරුණෑගල තොග ගබඩාව
සරසවි උයන තොග ගබඩාව
පේරාදෙණිය තොග ගබඩාව
මුතුරාජවෙල පර්යන්තය
බදුල්ල තොග ගබඩාව
කොළොන්නාව නිමාව
කොටගල තොග ගබඩාව
හපුතලේ තොග ගබඩාව
ගාල්ල තොග ගබඩාව
මාතර තොග ගබඩාව

පටුන

	පිටුව
1. අප ගැන	2
2. දැක්ම, මෙහෙවර	3
3. සභාපති තුමාගේ පණිවුඩය	6
4. අධ්‍යක්ෂ මණ්ඩලය	7
5. කළමණාකරන කණ්ඩායම	12
6. සංස්ථාපිත තොරතුරු	16
7. කළමණාකරන සාකච්ඡාව සහ විග්‍රහය	18
8. ප්‍රධාන ව්‍යාපෘති	25
9. අවදානම් කළමණාකරනය	27
10. සමාප්ත වගකීම	30
11. සංස්ථාපිත යහ පාලනය	32
12. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව	36
13. විගණන කමිටුවේ වාර්තාව	38
14. සම්මාන සහ ප්‍රදානයන්	40
15. මූල්‍ය තොරතුරු	44
- විගණකාධිපති තුමාගේ වාර්තාව	
- මූල්‍ය තත්ව ප්‍රකාශය	
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	
- ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය	
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය	
- වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති	
- මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්	
16. වසර පහක සංක්ෂිප්තය	80

නිෂ්පාදිත අනුව සාරාංශය



අප ගැන

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාරික ආයතන පොදු සමාගම් වලට හැරවීමේ පනතේ 2 (1) කොටස ප්‍රකාරව විධිමත් ලෙස සංස්ථාපනය කරන ලද සමාගමක් වන අතර එයට 2003 ඔක්තෝබර් 13 දිනැති අංක 1318/8 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති තෙල් පර්යන්ත, ගබඩා පහසුකම්, නළ මාර්ග සහ ඉන්ධන ප්‍රවාහන වාහන යනාදියෙන් සමන්විත පොදු භාවිත පහසුකම් වල අයිතිය ඇත.

ශ්‍රී ලංකාවේ බණිජ තෙල් නිෂ්පාදිත හැසිරවීම සඳහා වූ උසස් තත්වයේ යටිතල පහසුකම් වලින් සමන්විත බණිජ තෙල් තොග ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ නියුක්ත සමාගමක් වන්නෙමු. රටේ සිල්ලර පාරිභෝගිකයන්ගේ සහ රටේ ආර්ථික සංවර්ධනයේ නියුක්ත විවිධ කාර්මික අංශ වල තොග පාරිභෝගිකයන්ගේ බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා ලංකා බණිජ තෙල් සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම සතු දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම් හල් දහසකට පමණ අපි සේවය සපයන්නෙමු. මේ සඳහා සමාගමේ විවිධ කටයුතු වල ක්‍රියාකාරී ලෙස සහභාගී වන 3000 පමණවන සේවකයින් සමගින් ගබඩා කිරීමේ බෙදාහැරීම් ජාලයේ නියුක්ත තොග ගබඩා 11 ක් ප්‍රධාන පර්යන්ත දෙකට සහායවේ

ප්‍රධාන පර්යන්තයන්

කොලොන්නාව නිමාව

මුතුරාජවෙල පර්යන්තය

තොග ගබඩා

අනුරාධපුර

බදුල්ල

මඩකළපුව

ගාල්ල

හපුතලේ

කන්කසන්තුරේ

කොටගල

කුරුණෑගල

මාතර

පේරාදෙනිය

සරසවි උයන

කොලොන්නාව නිමාව බණිජ තෙල් නිෂ්පාදන 12 ක් හසුරුවන අතර මුතුරාජවෙල පර්යන්තය බණිජ තෙල් නිෂ්පාදන පහක් හසුරුවයි.

සීපීඑස්ටීඑල් හි බෙදාහැරීමේ අංශය ලංකා බණිජ තෙල් සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම යන අලෙවි සමාගම් දෙක වෙනුවෙන් නිෂ්පාදන බෙදාහැරීමේ කටයුතු ඉටුකරනු ලබයි. කොලොන්නාව සහ මුතුරාජවෙල ප්‍රධාන පර්යන්තයන් දිවයින පුරා බණිජ තෙල් නිෂ්පාදන බෙදාහැරීම ශක්තිමත් කිරීමට දිවයින පුරා තොග තෙල් ගබඩා **11 ක් සීපීඑස්ටීඑල්** මෙහෙයවයි. මෙම ස්ථාන සහ දුම්රියපස තොග ගබඩා වෙත බණිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය කරනු ලබන්නේ කොලොන්නාව පර්යන්තයෙන් පුරවනු ලබන දුම්රිය ටැංකි සහ ප්‍රධාන පර්යන්තවලින් පුරවනු ලබන **සීපීඑස්ටීඑල්** ආයතනයේ සහ කුලී පදනම මත ලබාගත් ටැංකි රථ මගිනි. ගුවන්යානා ඉන්ධන කොලොන්නාව පර්යන්තයේ පමණක් ගබඩාකර ඇති අතර දුම්රිය මගින් බණ්ඩාරණායක ගුවන්තොටුපල වෙත දිනපතා ප්‍රවාහනය කරනු ලැබේ. ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් මෙහෙයවනු ලබන රත්මලාන සහ අනෙකුත් ගුවන්තොටුපලවලට ඔවුන්ගේ අවශ්‍යතා මත මහා මාර්ග හරහා ගුවන්යානා ඉන්ධන ලබාගනී. ගෙන්දගම් අඩු දැවිතෙල් මුතුරාජවෙල පර්යන්තයේ පමණක් ගබඩා කරන අතර එකම පාරිභෝගිකයා වන කෙළවරපිටිය බලශක්ති නිශ්පාදනාගාරය වෙත ඒ සඳහාම වෙන්වූ නළ මාර්ගයකින් ප්‍රවාහනය කරනු ලැබේ.

කොලොන්නාව පර්යන්තය පිරිපහදුව සහ කොළඹ වරායේ ඩොල්පින් ජැටියේ දී ගොඩබානු ලබන ආනයනික තෙල් නැව් මගින් නිෂ්පාදිත ලබාගනී. මුතුරාජවෙල පර්යන්තය කෙළවරපිටිය වෙරළේ සිට ආසන්න වශයෙන් කිලෝ මීටර් 06 ක් පමණ ඈත මුහුදේ එකස්ථාන පාවෙන බෝයාව (SPBM) මගින් ගොඩබානු ලබන ආනයනික පිරිපහදු තොග පමණක් ලබාගනී.




දැක්ම


දකුණු ආසියාවේ වඩාත්ම කාර්යක්ෂම තෙල් ක්‍රියාකරවුම් පර්යන්තය බවට පත්වීම




මෙහෙවර


පාර්ශව කරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කරමින්
දිවයිනේ වඩාත්ම කාර්යක්ෂම හා ක්‍රියාකාරී සේවාවක් පවත්වා
ගැනීමටත්, පාරිභෝගික අවශ්‍යතා සපුරාලමින් සපයන්නාවූ බණිජ
තෙල් නිෂ්පාදන ධාරිතාවේ ගුණාත්මකභාවය සහතික කරමින්,
අඛණ්ඩව වර්ධනයකින් යුතු පාරිභෝගිකයා තෘප්තිමත් කරන්නාවූ
සේවයක් සැලසීමටත්, කැපවීමටත්, මහජන හා පාරිභොගිකයන්ගේ
ප්‍රතිචාර හා මාර්ගෝපදේශකත්වය මත පදනම් වූ පරිසරයට ගෞරවය
දක්වමින් හා එහි ප්‍රමිතීන් සුරකිමින්, නීතිගරුක තෘප්තිමත් මනා
පුහුණුවක් හා කැපවීමකින් යුත්, ශ්‍රම බලකායේ සහභාගිත්වය
ලබාදීමත්, අපගේ මෙහෙවරය





ප්‍රධාන මූල්‍ය ත්‍රීව්‍යාලෝකය	2016 රු. '000	2015 රු. '000	වැඩිවීම් (අඩුවීම්) රු. '000
අයභාරය	12,663,445	11,687,263	976,182
දළ ලාභය	6,001,755	5,271,850	729,905
බදු පෙර ලාභය	2,330,073	1,715,646	614,427
බදු පසු ලාභය	1,738,629	1,373,984	364,646
ජංගම වත්කම්	10,809,703	10,174,620	635,083
මුළු වත්කම්	28,058,891	27,269,765	789,126
ජංගම වගකීම්	2,057,201	2,487,082	(429,881)
ප්‍රධාන මූල්‍ය අනුපාත			
දළ ලාභ අනුපාතය %	47	45	2
මෙහෙයුම් ලාභ අනුපාතය %	18	15	4
ශුද්ධ ලාභ අනුපාතය %	14	12	2
ROCE (යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ අනුපාතය) %	8	6	1
ද්‍රවශීලතා අනුපාතය	5	4	1
කොටසකට ශුද්ධ වත්කම්	30	29	2







සභාපති තුමාගේ පණිවුඩය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, 2016 මූල්‍ය වසර සඳහා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ ප්‍රගතිය පිළිබඳ පණිවුඩය ගෙන එන්නේ ඉමහත් සතුටිනි.

දිවයිනේ බණිජ තෙල් නිෂ්පාදිත හසුරුවන ප්‍රධානතම සමාගම ලෙස, අපගේ වගකීම වන්නේ ගුණාත්මකභාවය රැකගනිමින් පර්යන්ත පහසුකම් භාවිතකරන්නන්ට/පාරිභෝගිකයනට බණිජ තෙල් නිෂ්පාදිත තත්‍ය ප්‍රමාණය ගෙනගොස් බාරදීම සහතික කරමින් පක්ෂපාතී, කාර්‍යක්ෂම සහ හොඳින් පුහුණුව ලත් ශ්‍රම බලකායේ කැපවූ සහභාගිත්වය තුලින් බලාත්මක සෞඛ්‍ය, පාරිසරික සහ ආරක්ෂණ ප්‍රමිතයන්ට ගරුකරමින් පාරිභෝගිකයාට බණිජ තෙල් නිෂ්පාදිත ලැබෙන්නට සැලැස්වීමයි. අපගේ සේවකයන් ආරක්ෂාකරන, පරිසරය සුරකින, රටේ ආර්ථිකය ශක්තිමත් කරන ආකාරයට අපගේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අප කැපවී සිටින්නෙමු..

අපගේ සමස්ත උපක්‍රමය වන්නේ අපගේ ප්‍රාග්ධන පිරිවැයට වඩා ඉතාමත් ඉහළ ප්‍රතිලාභ සපුරාගන්නා අතරම, දීර්ඝකාලීන අගය ජනිතකරවන ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමයි. මෙහෙයුම් අනර්ඝත්වය සහ මූල්‍ය විනයට කැපවීම පවත්වාගනිමින් උසස් තත්වයේ වත්කම් පරාසයක් තුලින් අගය එකතු-කරන වර්ධනයකට අප යොමුවී සිටිමු..

අපගේ අරමුණු කරා ලඟා වීමට ඵලදායී ලෙස මෙහෙයවීමට අපට හැකියාව ලබාදෙන සේවකයින් 3,000 කට වැඩි දක්ෂතා ඇති අපගේ සේවා බලකාය මෙම හැකියාව ඇති කරයි. අලෙවිකරණ සමාගම් දෙකට සේවා සපයන්නෙකු ලෙස අපගේ පාර්ශවකරුවන්ට උපරිම සේවය ලබාගැනීම සහතික කිරීමට සමාගමක් වශයෙන් අපි කැපවී වැඩ කරමු.

අපගේ කැපවීම තහවුරු කරමින්, අප මූල්‍ය වසර පුරා ගෞරවාන්විත සම්මාන කිහිපයකින්, **එනම් ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලයේ කර්මාන්ත අනර්ඝත්ව සම්මාන උත්සවයේදී ජාතික ලෝකඩ සම්මානයෙන්ද සමාජ සංවාදය හා වැඩබිමෙහි සහයෝගීතාව පිළිබඳ ලෝකඩ සම්මානයෙන්ද පිදුම් ලැබුවෙමු**.

අභ්‍යන්තර හා බාහිර විගණන කාර්යයේ නිරන්තර පරීක්ෂාව යටතේ ගිණුම්කටයුතුභාවය නිසිලෙස ඉෂ්ටකරමින් යහපාලන මූලධර්මවලට සමාගම කැපවී සිටියි.

ජාතියට අපගේ සේවය වර්ධනය කිරීමට වසර තුලදී ඇතිකරන ලද ප්‍රධාන ව්‍යාපෘති අතරට මාර්ග, දුම්රිය මාර්ග හරහා 12' විශ්කම්භය සහිත නල මාර්ග කොටස් ස්ථාපනය කිරීම, සීපීඑස්ටීඑල් දත්ත මධ්‍යස්ථානය සඳහා ආපදා ප්‍රතිපාජති හා කළමණාකරණ මධ්‍යස්ථානය, අනුරාධපුරයේ තොග ගබඩාව සංවර්ධනය කිරීම, මාගාල්ල තොග ගබඩාව සංවර්ධනය කිරීම, කොලොන්නාව තෙල් පර්යන්තයේ අභ්‍යන්තර මාර්ග ජාල පද්ධතිය වැඩි දියුණු කිරීම, කොලොන්නාව නිමාවේ 1-4 කලාපයේ බැම් ආරක්ෂාව, කොලොන්නාව නිමාවේ ටැංකි අංක 5 ට අලුත්වැඩියා කිරීම ඇතුලත් වේ..

වෙහෙස නොබලා කටයුතු කල සීපීඑස්ටීඑල් කාර්යමණ්ඩලය, අධ්‍යක්ෂවරු, විගණකවරු සහ තවත් බොහෝ අයගේ දායකත්වය නොමැතිනම් මෙම වාර්තාව මෙලෙස අප සමාගම ගැන උනන්දුවන්නන් හට පත්කිරීමට නොහැකිවනු ඇත. ඒ සියලුම දෙනාට මම ස්තුති කරමි.

අවසාන වශයෙන්, 2016 වසර තුලදී සමාගම දීර්ඝ කාලීන අරමුණු කරා ලඟාවීමට ප්‍රධාන පියවර ඉදිරියට ගෙන ඇති අතර පොදු මහජනතාවට අපගේ වගකීම් ඉටුකරමින් ලාභ උපදවන රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස සමාගම පවත්වාගෙන යාමට හැකිවනු ඇතැයි මට හැඟියයි.

ඩී සී ෂෙහාන් සෙනෙවිරත්න

සභාපති සහ කළමණාකරණ අධ්‍යක්ෂ

අධ්‍යක්ෂක මණ්ඩලය



ෂෙහාන් සෙනෙවිරත්න මහතා

ෂෙහාන් සෙනෙවිරත්න මහතා 2015 ඔක්තෝබර් සිට සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (සීපීඑස්ටීඑල්) හි සභාපති/කළමණාකරණ අධ්‍යක්ෂ ලෙස ද ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද සේවය කරයි.

2001 වසරේදී ඔහු සිය ප්‍රධාන අභිප්‍රාය සාක්ෂාත්කර ගත්තේය. එය ශ්‍රී ලංකාවේ විශාලතම බිම් ගල් නිෂ්පාදකයා වන සීමිත එස්එම්එස් හෝල්ඩින්ස් (පෞද්) සමාගම පිහිටුවා එහි සභාපති/කළමණාකරණ අධ්‍යක්ෂ බවට පත්වීම වන අතර පසුව සීමිත ග්‍රීනරි කොම්පැනි (පෞද්) සමාගම, සීමිත බ්ලැක් ඩයමන්ඩ් සෙකියුරිටි (පෞද්) සමාගම සහ සීමිත එස්එම්එස් ප්ලාන්ටේසන්ස් (පෞද්) සමාගම පිහිටුවා ඒවායෙහි කළමණාකරණ අධ්‍යක්ෂ බවට පත්ව ඔහුගේ ව්‍යාපාරික විශේෂඥතා ලක්ෂණ, දක්ෂතා සහ දැනුම මෙන්ම රටේ ආර්ථිකය ඉහළ නැංවීමට කරන ලද අඛණ්ඩ ප්‍රත්‍යක්ෂම ශක්තිය පිලිගැනීම ලෙස කීර්තිමත් සම්මාන දිනාගත් දේශීය සහ ලොව පුරා පිළිගත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික නායකයෙකි.

ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයා 2010 ලෙස ඔහු ගෞරවයට පාත්‍රවූ අතර, 2012 සහ 2014 වසරවලදී ආසියා ශාන්තිකර ව්‍යවසායක සම්මාන උළලේ දී ප්‍රාප්තේක්ෂ්‍ය ව්‍යවසායකයා ද විය. බොහෝ පලාත්බද සහ ජාතික සම්මාන වලින් ගෞරව ලැබීය. ගුණාත්මක පර්යේෂණ සඳහා වන යුරෝපා සමාජය විසින් සංවිධානය කරන ලද ඕස්ට්‍රියාවේ වියානා හිදී පැවති සම්මාන උළලේ දී "2015 ගුණාත්මක බවේ විශිෂ්ටත්වය ජාත්‍යන්තර දියමන්ති සම්මාන" යෙන් පිදුම් ලබා එහි වාර්ෂික පිළිගැනීම් වැඩසටහනේ දී "ගුණාත්මක සම්මානය" ලැබීය.

නිෂ්පාදන ඩිප්ලෝමාවක් ද ව්‍යාපාර කළමණාකරන ඩිප්ලෝමාවක් ද ඔහු හිමි කරගෙන ඇත.



ටී පී ජයසිංහ මහතා

ටී පී ජයසිංහ මහතා ශ්‍රී ලංකා සැලසුම් සේවයේ පළමුවන පංතියේ නිලධාරියෙක් වන අතර 2007 ජනවාරියේ දී මූල්‍ය කොමිසමේ ලේකම් ලෙස විශ්‍රාම ගත්තේය. ඔහු 1985 දී ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය තායිලන්තයේ බැංකොක් හි ආසියානු තාක්ෂණික ආයතනයෙන් ලබාගත් අතර "ප්‍රාදේශික මට්ටමේ සැලසුම්කරණයේ ප්‍රාදේශීය ප්‍රතියමානය" යටතේ ඉදිරිපත්කල නිබන්ධනයට "විශිෂ්ට" ප්‍රශංසාවක් ලබාගත්තේය. ඔහු 1982 දී එක්සත් රාජධානියේ වේල්ස් විශ්ව විද්‍යාලයෙන් සංවර්ධන ප්‍රතිපත්ති හා සැලසුම්කරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද, 1990 දී නගෝයා UNCRD ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇත. ඔහු ශාස්ත්‍රවේදී උපාධිය ලංකා විශ්ව විද්‍යාලයෙන් 1967 දී ලබාගත්තේය.

කැපීපෙනෙන වෘත්තීය සහ තාක්ෂණික සාක්ෂාත්කරගැනීම් තුලින් කලාපයට වූ සේවය හඳුනාගැනීම වෙනුවෙන් රාජ්‍ය අංශය සඳහා වූ විශිෂ්ට උපාධිධරයන්ගේ සම්මානයෙන් AITAA (2005) ජයසිංහ මහතා පිදුම් ලැබීය.

ඔහුට ජාතික මට්ටමේ සැලසුම්කරණය සහ ක්‍රියාත්මකකිරීම පුළුල් පුහුණුවක් ඇති අතර ප්‍රධාන දේශීය සහ විදේශීය උපදේශන කාර්යපැවරුම් වල කණ්ඩායම් නායක සහ ව්‍යාපෘති කලමණාකරන විශේෂඥ වශයෙන් ක්‍රියාකර ඇත.

ජයසිංහ මහතා දැරූ අනෙකුත් තනතුරු අතර 2006 ජුනි සිට තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ සභාපති, 2006 ජුනි සිට තාක්ෂණික අධ්‍යාපන පිළිබඳ ජාතික ආයතනයේ උප සභාපති, 2006 ජුනි සිට ජාතික අධ්‍යාපන කොමිසමේ සාමාජික ද වේ. සැලසුම්කරණය සහ විමර්ෂණ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ලෙස වැඩකර ඇති අතර දැනට දකුණු පළාත් ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර දරයි. (ADB Loan No.1128 Sri-SF).

ඔහුට කැපීපෙනෙන රාජ්‍ය සේවා වාර්තාවක් ඇති අතර විශ්ව විද්‍යාලයේ මෙන්ම පාසලේදීද විෂයෙන් පරිබාහිර විවිධ කටයුතු වල යෙදී ඇත.



ආචාර්ය ලලිත් ලියනගේ

ආචාර්ය ඉංජිනේරු ලලිත් ලියනගේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ සීමාසහිත ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලොජීස් (LLTL) සමාගමෙහි ප්‍රධාන විධායක වන අතර මෙම තනතුරට පත්වීම සමාගමේ තොරතුරු තාක්ෂණ ප්‍රධානියා ලෙස සේවය කළේය. LLTL යනු ත්‍රිවිධ හමුදා සහ ශ්‍රී ලංකා පොලිසිය සඳහා ආරක්ෂණ සහ ජාතික ආරක්ෂාව සම්බන්ධ ව්‍යාපෘති වල ව්‍යාපෘති කළමණාකරනය සහ උපදේශන සේවා සැපයීම මෙන්ම ආරක්ෂක හමුදා මෙවලම් ප්‍රසම්පාදන සඳහා වූ ආරක්ෂක අමාත්‍යාංශයේ විධායක බාහුවයි. සෝවියට් දේශයේ ඩොනට්ස්ක් රාජ්‍ය තාක්ෂණික විශ්ව විද්‍යාලයෙන් අනර්ග සාමාර්ථයන් සහිතව විදුලි ඉංජිනේරු පදවිය සහ පශ්චාත් උපාධි ලබාගත් ආචාර්ය ලියනගේ තොරතුරු තාක්ෂණය සහ ඉංජිනේරු ක්ෂේත්‍රයේ කීර්තිමත් වෘත්තිකයෙක් වන අතර, පළමුව ඔහු ඩොනට්ස්ක් රාජ්‍ය තාක්ෂණ විශ්ව විද්‍යාලයෙන් (USSR) විදුලි ඉංජිනේරු උපාධි සහ පශ්චාත් උපාධිය විශිෂ්ට ලෙස සමත්ව ඇත. පසුව ඔහු ඉන්දියාවේ ඔරිස්සා හි නිෂ්පාදන කළමණාකරණය පිළිබඳ ඉන්දියානු ආයතනයෙන් (IIPM) නඩත්තු ඉංජිනේරු සහ කළමණාකරනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් කුසලතා සාමාර්ථයක් සහිතව ලබාගත් අතර එක්සත් රාජධානියේ එසෙක්ස් විශ්ව විද්‍යාලයෙන් පළමුපෙල ගෞරව සාමාර්ථයක් සහිතව පරිගණක අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබාගැනීම ඔහුව, විදුලි ඉංජිනේරු අංශය වෙතින් තොරතුරු තාක්ෂණයට හැරවීමට සිදුවීම නිසා තම වෘත්තීය රැකියාවේ හැරවුම් ලක්ෂය විය. මොරටුව විශ්ව විද්‍යාලයෙන් සියලුම A සාමාර්තයන් සහ 3.97 ක ශ්‍රේණිගත සාමාන්‍යය ක් සහිතව විද්‍යුත් යහපාලනය (e-governance) පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය ලබාගත් පසු තම අධ්‍යාපනයේ ඉහලම ස්ථානය වූ එක්සත් රාජධානියේ නෝතම්බ්‍රියා විශ්ව විද්‍යාල ඉංජිනේරු සහ පරිසර පීඨයෙන් වැඩ මත පදනම්වූ ඉගෙනුම සඳහා ජාලගත ඉගෙනුම පිළිබඳ ආචාර්ය උපාධිය ලබාගත්තේය.

පසුගිය වසර 20 සඳහා ආචාර්ය ලියනගේගේ වෘත්තීය රැකියාවට ආවරණයවන ක්ෂේත්‍ර යටතට විදුලි ඉංජිනේරු (පැල්වත්ත සීනි කර්මාන්තය 1996-99), පුහුණු පරිපාලනය (වෘත්තීය පුහුණු අධිකාරිය 1999-2004), දේශන පැවැත්වීම (ස්ලීඩා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය 2007-09 සහ නෝතම්බ්‍රියා විශ්ව විද්‍යාලය 2010-11), ව්‍යාපෘති කළමණාකරනය (වෘත්තීය පුහුණු හා කාර්මික අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ආසියානු සංවර්ධන බැංකු අරමුදල් සැපයූ ව්‍යාපෘති 2000-04 සහ උසස් අධ්‍යාපනය 2004-09) අයත්වේ.

ඔහු 2015 සිට සිට සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කරයි. ඔහු මෙම සමාගමේ තොරතුරු තාක්ෂණය/ආයතන සම්පත් සැලසුම්කරණ කමිටුවේ සභාපති, ඉන්ධන සැපයුම් කමිටුවේ සභාපති, ගරු අමාත්‍ය තුමාගේ මාධ්‍ය ඒකකයේ සභාපති සහ ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයෙකු ලෙස සේවය කරයි. ඊට අමතරව ආචාර්ය ලියනගේ මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පරීක්ෂකවරයෙකු ලෙසද, 2013 සිට බ්‍රිතාන්‍ය පරිගණක සමාජය මගින් සංවිධානය කරන ජාතික ඉතා ගුණාත්මක තොරතුරු තාක්ෂණය සම්මාන (National Best Quality ICT Award) විනිශ්චය මණ්ඩල සාමාජිකයෙකු ද වේ.

ඔහු කරන ලද ජාතික මට්ටමේ දායකත්වයන් අතුරින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ජාතික අන්තර්ජාල දුරස්ථ අධ්‍යාපන පද්ධතිය (NODES) පිහිටුවීමට පුරෝගාමී වීම සහ වෘත්තීය පුහුණු හා කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය (NCICI) සහ ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඩිප්ලෝමා (NDICI) හඳුන්වාදීම වැදගත්ය.

2011 වසරේදී නෝතම්බ්‍රියා විශ්ව විද්‍යාලය දෙවන වසර හොඳම ආචාර්ය උපාධි ශිෂ්‍යයා ලෙස ඔහු සම්මාන ලැබීය, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආරක්ෂාවට වූ දායකත්වය වෙනුවෙන් 2013 වසරේදී CISO සම්මානය, 2013 උසස් අධ්‍යාපන සඟරාවේ හොඳම පර්යේෂණ පත්‍රිකාව, වැඩ මත පදනම්වූ ඉගෙනුම පිළිබඳ එක්සත් රාජධානියේ ප්‍රමුඛස්ථානය ඔහු දිනාගත් සම්මාන වේ.

ආචාර්ය ලියනගේ ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ අධි සාමාජිකයෙකු වන අතර 2007 සිට විධායක කමිටු සාමාජිකයෙකු ලෙස සේවය කරයි. ඔහු බ්‍රිතාන්‍ය පරිගණක සමාජය, ශ්‍රී ලංකා පරිගණක සමාජය, ශ්‍රී ලංකා ඉංජිනේරු තාක්ෂණ ආයතනයන්හි සාමාජිකයෙකු ද වේ.



දුමින්ද රාජපක්ෂ මහතා

වෘත්තියෙන් නීතිඥයකු වන දුමින්ද රාජපක්ෂ මහතා ඔහුගේ නීතිවේදී උපාධිය ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයෙන් 1999 දී ලබාගත්තේය.
2000 ඔක්තෝබර් සිට ප්‍රසිද්ධ නොතාරිස් වරයෙකු ලෙස සේවය කරන අතර 2000 සිට 2015 දක්වා දකුණු පලාතේ අපරාධ නීතිඥයකු ලෙස කටයුතු කර ඇත.
ඔහු 1996/1997 දී නීති පීඨ ශිෂ්‍ය සංගමයේ සභාපති, 2004/2005 ගාලු නීති සංගමයේ ලේකම්, කරාපිටිය වකුගඩු ආරක්ෂණ සංගමයේ සභාපති (2012/2014) ලෙස කටයුතු කර ඇත.
ඔහු සමාදාන විනිශ්චයකාරයෙකු සහ නීල නොලත් මහේස්ත්‍රාත් ලෙසද සේවය කරයි.
ඔහු සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයෙකු ලෙස 2015 ඔක්තෝබර් හිදී පත්වීම ලැබූ අතර එතැන් සිට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කරයි.



එෂාන් පෙරේරා මහතා

පෙරේරා මහතා එක්සත් රාජධානියේ වරලත් කළමණාකරන ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙක් වන අතර අවුරුදු 30 කට වඩා විවිධ කර්මාන්තවල මූල්‍ය සේවා, කාලගුණය වෙනස්වීම, සිල්ලර වෙළඳාම, දේපල සංවර්ධනය, ඇඟලුම් නිෂ්පාදනය, මෘදුකාංග සංවර්ධනය ,ආගන්තුක සත්කාරය හා විනෝදාස්වාදය යන ක්ෂෙත්‍රවල ආරම්භක ව්‍යාපාර මෙන්ම විශාල පරිනත සංවිධානවල මූල්‍ය, මෙහෙයුම් හා පොදු කළමණාකරනය පිළබඳ ප්‍රවර්ධන පළපුරුද්ද ඇති ජ්‍යේෂ්ඨ මට්ටමේ විධායක නිලධාරියෙකි.

ඔහු වර්ධනය ප්‍රාප්තය කරන සහ කාර්යක්ෂමතාවය සහ පහල මට්ටමේ ලාභ වැඩිකරන ව්‍යාපාර මෙහෙයුම් අනුකූලන කිරීමේ හැකියාව පෙන්වා ඇති අතර ඵලදායීතාවය සංවර්ධනය කිරීම සහ වෙනස්කම් කළමණාකරනයට අමතරව පොදු කළමණාකරණය, ව්‍යාපාර සැලසුම්කරණය, මූල්‍ය පාලන සහ ක්‍රියාවලින් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඉහළ සුදුසුකම් ඔහුට ඇත.

එක්සත් රාජධානිය, එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, චීනය, ජර්මනිය, කසකස්තානය, එක්සත් අරාබි රාජ්‍යය, ඉන්දියාව, නේපාලය, ඉන්දුනීසියාව, සිංගප්පූරුව, මැලේසියාව සහ නවසීලන්තය ඇතුලත් විදේශ රටවල චාරිකා කර ඉතා වැදගත් කාර්යයන් සහ කතිකාවත් කරගෙනයාමේ පළපුරුද්ද සහිත අයෙකි.



සුනිල් පී කලෙශ්වරී මහතා

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු වන සුනිල් පී කලෙශ්වරී මහතා 2013 සැප්තැම්බරයේ සිට ලංකා ඉන්දියන් තෙල් සමාගමේ (LIOC) මෙහෙයුම් හා ඉන්ධන සැපයුම් අංශයේ ප්‍රධානියාය. ඔහු 1995 දී ඉන්දියානු තෙල් සමාගමට සම්බන්ධ වූ අතර තම රැකියාවේ මුල් කාලය තුලදී විවිධ මුහුදුබඩ පර්යන්තවල මෙන්ම රට අභ්‍යන්තර බණිජතෙල් පර්යන්ත මෙහෙයුම් වල වැඩකර ඇත. වසර 2009 සිට 2013 දක්වා ඉන්දියානු තෙල් සමාගම විසින් ජාත්‍යන්තර වෙළඳාම මෙහෙයවීම ඔහුට භාර කල අතර වායු තෙල්, වාහන තෙල්, ඉන්ධන තෙල්, නැප්තා සහ තාර සඳහා ජාත්‍යන්තර වෙළඳාම සහ ගිවිසුම් සාකච්ඡා කිරීම පිළිබඳ විශේෂඥතා ගොඩනගා ගත්තේය.

2013 වසරේ සිට ලංකා ඉන්දියන් තෙල් සමාගමේ (LIOC) මෙහෙයුම් හා ඉන්ධන සැපයුම් අංශයේ ප්‍රධානියා වන අතර ගිවිසුම් සාකච්ඡා කිරීම හා දේශීය රථ වාහන ඉන්ධන අංශයට ශ්‍රී ලංකාවේ ඉන්ධන සැපයුම් සඳහා නාවික මෙහෙයුම් මනා සැකසුම්, නාවික විකුණුම් හා මෙහෙයුම්, ඉන්ධන නැව් හා බත්තල් ක්‍රමානුකූලව යෙදවීම, රථ වාහන ඉන්ධන සිල්ලර වෙළඳාමේ සහ නාවික ඉන්ධන මිළ අවධානම් කළමණාකරනය රැක බලාගනී.

ඉන්දියාවේ සහ පිටරටවල 1995 සිට වසර වලදී ලබාගත් විශාල පළපුරුද්ද නාවික ඉන්ධන සැපයුම් හා මෙහෙයුම් මෙන්ම බණිජතෙල් පර්යන්ත මෙහෙයුම්, ක්‍රියාවලි ස්වයංක්‍රියකරනය, සංකලනිත තෙල් සැපයීම, වෙළඳාම් කිරීම, නාවික කටයුතු පිළිබඳ විශේෂඥතාවය ඔහුට ඇත.



කේ ඩී ආර් ඔල්ගා මිය

කේ ඩී ආර් ඔල්ගා මියට රාජ්‍ය අංශයේ සහ රාජ්‍ය මූල්‍ය කළමණාකරණය පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇත. ඇය ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයට 1990 දී එක්විය. එතැන් සිට ඇය රජයේ විවිධ සංවිධානවල සේවය කර ඇත. ඇය දැනට රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ සහ මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ තනතුර දරයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන උපාධි පලමු පෙළ සාමාර්ථයක් ඇයට ඇත. ඇය 1987 දී වරලත් ගණකාධිකාරී ආයතනයේ වරලත් ආවසරික විභාගය සමත්වූවාය.

ඇය සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරියක ලෙස 2015 මාර්තු වේදී පත්විය. එයට අමතරව ඇය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ සහ මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනයේ අධ්‍යක්ෂවරියකි. ඉහත කී ආයතන තුනෙහි විගණන හා කළමණාකරන කමිටුවේ සභාපතිනියයි.



ශ්‍යාම් බෝරා මහතා

බණ්ඩජතෙල් අංශයේ අවුරුදු 26 කට වඩා වැඩි විශේෂඥතාව ඇති බෝරා මහතාට ෆෝචූන් 500 ගෝලීය සමාගමක් හා ඉන්දියාවේ ප්‍රධාන සමාගම වන ඉන්දියානු තෙල් සංස්ථාවේ සිල්ලර, ආයතනික විකුණුම්, මෙහෙයුම් හා සැකසුම් ආදී විවිධ දෙපාර්තමේන්තුවල විවිධ කාර්යයන්හි පුළුල් පලපුරුද්දක් ඇත. ඔහුට සැලකියයුතු අනාවෘතකිරීම් ඇති අතර ලංකා ඉන්දියන් තෙල් සමාගමෙහි කළමණාකරණ අධ්‍යක්ෂ ලෙස වැඩ බාරගැනීමට පෙර මහාරාෂ්ඨ සහ ගෝව ප්‍රදේශ වල ඉන්දියානු තෙල් සංස්ථාවේ සිල්ලර අංශයේ ප්‍රධානියා විය,

බැංගලෝර් විශ්ව විද්‍යාලයෙන් සිවිල් ඉංජිනේරුවරයෙකු වී කළමණාකරන සංවර්ධන ආයතනයේ කීර්තිමත් "ජාතික කළමණාකරන වැඩසටහනෙ" න් පශ්චාත් උපාධි කළමණාකරන ඩිප්ලෝමා ලාභී බෝරා මහතා ඉන්දියානු තෙල් සමාගමේ ඉතා ප්‍රධාන තනතුරු වල සේවය කොට ඇත, ක්ෂෙත්‍ර මට්ටමේ දිගු හා සාර්ථක වැඩකොටසක් කරමින් එකිනෙකට වෙනස් විකුණුම් අංශ තුනක ප්‍රධානියා වූ ඔහු මෙහෙයුම් අංශයේ මනා සැකසුම් රැකබලා ගනිමින් ද සේවය කර ඇත.



අනුජ් ජයින් මහතා

වර්තමානයේ දී අනුජ් ජයින් මහතා ලංකා ඉන්දියන් තෙල් සමාගමේ මූල්‍ය අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන අතර, සමාගමේ මූල්‍ය සහ වාණිජ කටයුතු ප්‍රෙක්ෂාවලිය රැකබලා ගනී.

ජයින් මහතා වෘත්තියෙන් ඉන්දීය වරලත් ගණකාධිකාරී ආයතනයෙන් වරලත් ගණකාධිකාරීවරයෙකි.1992 දී ඔහුගේ වාණිජවේදී ගෞරව උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු 1995 දී ඔහුගේ වරලත් ගණකාධිකාරී සුදුසුකම සම්පූර්ණ කර ඉන්පසු වහාම සීමාසහිත ඉන්දීය තෙල් සමාගමට එක්විය. ඔහු සහතිකලත් තක්සේරුකරුවකු වන අතර ව්‍යාපාර කළමණාකරනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ICAI ආයතනයෙන් ලබාගෙන ඇත.

ජයින් මහතා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි විගණන හා කළමණාකරන කමිටුවේ සාමාජිකයෙකි.

සීමාසහිත ඉන්දීය තෙල් සමාගමේ විවිධ කාර්යාලවල අතීත වසර 20 ක සේවා කාලයේදී ප්‍රධාන කාර්යාලය ඇතුලුව සීමාසහිත ඉන්දීය තෙල් සමාගමේ විවිධ කාර්යාලවල වැදගත් කාර්යයන් භාරව සිට ඇති අතර සංස්ථා මූල්‍ය, භාණ්ඩාගාර සහ බැංකු කටයුතු,ඉල්ලුම් සහ සැපයුම් දාමය ප්‍රශස්තිකරණය, නාවිකකටයුතු, ජාත්‍යන්තර ගිණුම් ප්‍රමිත, සැප් SAP ගිණුම් මෘදුකාංග, අවදානම් කළමණාකරනය, ව්‍යාපාර සංයෝජන, අයවැයකරනය, ණයගැති කළමණාකරනය, රක්ෂණය, සංස්ථා සහ චක්‍ර බදු, ප්‍රාග්ධන සහ අයහාර යෝජනාවල මූල්‍ය සංගමනය, උපක්‍රමික මණ්ඩල රැස්වීම් සඳහා ඉදිරිපත් කිරීම්, විගණන කමිටු හා මණ්ඩල රැස්වීම්, ලාභ ප්‍රශස්තකරණය සඳහා විශේෂ අධ්‍යයන ආදියට අදාලව ඉතා ප්‍රධාන කාර්යපැවරුම් මෙහෙයවා ඇත.

ඔහු උද්‌යෝගිමත් ක්‍රීඩකයකු වන අතර සංගීත ලැදියෙකි.



රන්දීර් සිං මහතා

රන්දීර් සිං මහතා ලංකා ලංකා ඉන්දියන් තෙල් සමාගමේ ජ්‍යෙෂ්ඨ උප සභාපති (මෙහෙයුම් හා ඉන්ධන සැපයුම්) වේ.

රන්දීර් සිං මහතා කුරුක්ෂේත්‍ර ජාතික තාක්ෂණ ආයතනයෙන් කාර්මික තාක්ෂණික යාන්ත්‍රික ඉංජිනේරු උපාධියද , නව දිල්ලි දුම්රිය ප්‍රවාහන ආයතනයෙන් බහු ආකෘතික මනා සැකසුම් පිළිබඳ උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

දැනට ඔහු ලංකා ඉන්දියන් තෙල් සමාගමේ මෙහෙයුම් හා නාවික ඉන්ධන සැපයුම් අංශ ප්‍රධානියා වන අතර සිල්ලර ව්‍යාපාර සහ කොළඹ සහ ත්‍රිකුණාමලය වරායන්හි නැව් ඉන්ධන සැපයුම සඳහා අවශ්‍ය වායු තෙල් සහ පෙට්‍රල් ආනයනය කිරීම ඔහුගේ වගකීම වේ.

කළමණාකරන කණ්ඩායම

ඉහළ කළමණාකරනය

සභාපති / කළමණාකරන අධ්‍යක්ෂ	ෂෙහාන් සෙනෙවිරත්න මහතා

ආයතනික කළමණාකරනය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)	ඕ පී කග්ගොඩ ආරච්චි මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සහ උපයෝගී සේවා)	පී අතුකෝරළ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පරිපාලන)	පී ඩී පී ධර්මවංශ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)	ඒ මාර්ටින් මහතා
ප්‍රධාන තොරතුරු නිලධාරී	රෝයි පෙරේරා මහතා

ජ්‍යෙෂ්ඨ කළමණාකරනය

ගබඩා කළමණාකරු	එස් වික්‍රමාරච්චි මිය
මූල්‍ය කළමණාකරු	පේ ඒ යු ආර් කේ ජයලත් මහතා
අභ්‍යන්තර විගණන කළමණාකරු	ඩී එම් එච් බී දසනායක මහතා
පර්යන්ත කළමණාකරු (මුතුරාජවෙල)	එම් එස් එම් නියාස් මහතා
මෙහෙයුම් කළමණාකරු (වාහන)	ඩී ඒ පේ එස් ධර්මප්‍රිය මහතා
මෙහෙයුම් කළමණාකරු (තොග වෙනස්වීම හා තොග සැකසීම)	ටී වී සරත්චන්ද්‍ර මහතා
කළමණාකරු (ආරක්ෂක)	එන් ජයවර්ධන මහතා
කළමණාකරු (ආයතන කටයුතු)	එස් ගමගේ මිය
කළමණාකරු (ප්‍රසම්පාදන)	ආර් එස් එස් ප්‍රේමකුමාර මහතා
මානව සම්පත් කළමණාකරු	කේ එම් එන් ඒ සී පෙරේරා මහතා
ප්‍රධාන නීති නිලධාරී (2016. 07. 16 දින සිට විශ්‍රාම ගන්වන ලදි)	ඩබ්ලිව් ටී ෆොන්සේකා මෙය
බෙදාහැරීම් කළමණාකරු	ඩබ්ලිව් එම් ටී ඩබ්ලිව් ඒ බණ්ඩාර මහතා
මෙහෙයුම් කළමණාකරු (අක් වෙරළ මෙහෙයුම්)	ආර් ඒ පී ඒ රණසිංහ මහතා
කළමණාකරු (පුහුණු කිරීම් හා මානව සම්පත් සංවර්ධන)	ඊ ඒ ආර් ඩී බණ්ඩාර මහතා
කළමණාකරු (පාරිශ්‍රය හා ඉංජිනේරු සේවා)	අජිත් විජේසූරිය මහතා
රසායනාගාර කළමණාකරු	කේ එන් රත්නායක මිය
ගිනි හා ආරක්ෂණ කළමණාකරු	ටී ඒ රේමන්ඩ් මහතා
වැඩබලන ඉංජිනේරු කළමණාකරු	පී එම් ඒ බණ්ඩාර මහතා
වැඩබලන විමර්ශන කළමණාකරු	ඩී ආර් කුමාසරු මහතා
වැඩබලන ප්‍රධාන නීති නිලධාරී (2016. 07. 18 දින සිට)	එල් ඩබ්ලිව් ගුණසේකර මහතා
වෛද්‍ය නිලධාරී	ආර් සුසිරිවර්ධන මිය
කළමණාකරු (තොරතුරු පද්ධති)	පේ පී පේ ඩබ්ලිව් ධර්මප්‍රේම මහතා



ඉදිරිපෙළ (අසුන්වල) - වමේ සිට දකුණට

ඕ පී කග්ගොඩ ආරච්චි මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය), පී අතුකෝරළ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සහ උපයෝගී සේවා), ෂෙහාන් සෙනෙවිරත්න මහතා - සභාපති / කළමණාකරන අධ්‍යක්ෂ, පී ඩී පී ධර්මවංශ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පරිපාලන), ඒ මාර්ටින් මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්), රෝයි පෙරේරා මහතා - ප්‍රධාන තෙරතුරු නිලධාරී

මැදපෙළ - වමේ සිට දකුණට

එස් වික්‍රමාරච්චි මිය - ගබඩා කළමණාකරු, ඩබ්ලිව් ටී ෆොන්සේකා මෙය – ප්‍රධාන නීති නිළධාරී, කේ එන් රත්නායක මිය – රසායනාගාර කළමණාකරු, එස් ගමගේ මිය – කළමණාකරු (ආයතන කටයුතු), ටී ඒ රේමන්ඩ් මහතා – ගිනි හා ආරක්ෂණ කළමණාකරු, කේ එම් එන් ඒ සී පෙරේරා මහතා – මානව සම්පත් කළමණාකරු, පේ ඒ යු ආර් කේ ජයලත් මහතා – මූල්‍ය කළමණාකරු, එම් එස් එම් නියාස් මහතා – පර්යන්ත කළමණාකරු (මුතුරාජවෙල), ආර් ඒ පී ඒ රණසිංහ මහතා - මෙහෙයුම් කළමණාකරු (අක් වෙරළ මෙහෙයුම්)

පසුපෙළ - වමේ සිට දකුණට

ඊ ඒ ආර් ඩී බණ්ඩාර මහතා –කළමණාකරු (පුහුණු කිරීම් හා මානව සම්පත් සංවර්ධන), එන් ජයවර්ධන මහතා – කළමණාකරු (ආරක්ෂක), ඩී එම් එච් බී දසනායක මහතා – අභ්‍යන්තර විගණන කළමණාකරු, අපිත් විජේසූරිය මහතා – කළමණාකරු (පරිශ්‍රය හා ඉංජිනේරු සේවා), ඩබ්ලිව් එම් ටී ඩබ්ලිව් ඒ බණ්ඩාර මහතා – බෙදාහැරීම් කළමණාකරු, ආර් එස් එස් ප්‍රේමකුමාර මහතා – කළමණාකරු (ප්‍රසම්පාදන), ටී වී සරත්චන්ද්‍ර මහතා – මෙහෙයුම් කළමණාකරු (තොග වෙනස්වීම හා තොග සැකසීම), ඩී ඒ පේ එස් ධර්මප්‍රිය මහතා – මෙහෙයුම් කළමණාකරු (වාහන)




LANKA
NISSAN DIESEL

සංස්ථාපිත තොරතුරු

සමාගමේ නම	සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජේ ටර්මිනල්ස් ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය	පී බී 1221
බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN)	134011157
ලියාපදිංචි කාර්යාලය	තෙල් නිමාව, කොලොන්නාව, වැල්ලම්පිටිය, ශ්‍රී ලංකාව
විගණකවරු	ශ්‍රී ලංකා විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව, 306 /72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
ලේකම්වරු	එකවුන්ටින් සිස්ටම්ස් සෙක්‍රටේරියල් සර්විසස් ප්‍රයිවෙට් ලිමිටඩ්, අංක 11, කාසල් පාර, කොළඹ 04
බැංකුකරුවෝ	ලංකා බැංකුව, ආයතන ශාඛාව, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, අංක 04, ලංකා බැංකු මාවත, කොළඹ 01
	මහජන බැංකුව, ජාත්‍යන්තර අංශය, අංක 91,, ACHC ගොඩනැගිල්ල, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02


අවතැන්වූවන්ට කෑම පාර්සල් 1500ක්
Ceylon Petroleum Storage Terminals Limited wins National Bronz
In Extra Large Category for Service
ගංවතුරෙන් තෙල් සංස්ථා නළවල කිසිම තෙල් කාන්දුවක් නෑ
ඇමැති චන්දිම වීරක්කොඩි
කොළඹින් කොලොන්නාවට අලුතින් තෙල් නළයක්
තෙල් ටැංකි ඉන්දීය සමාගමකට පැවරුවොත් දැඩි ක්‍රියා මාර්ග
ලංකා ඛනිජ තෙල් පොදු සේවක සංගමයේ සභාපති
16 පුවත් / NEWS
පුහුණුව නිම කළ පෙට්‍රෝලියම් ගිනි නටයන් 35ක් විසිර ගි
සේවා විශිෂ්ටත්වය වෙනුවෙන් ලෝකඩ සම්මානය සිලෝන් පෙට්‍රෝලියම්ට
16 පුවත් / NEWS
සිලෝන් පෙට්‍රෝලියම් ආයතනයේ සේවක සේවිකාවන්ගේ
ලුණුගම්වෙහෙර දහම් පාසල් දරුවන්ට පොත්පත්-උපකරණ
පෙට්‍රෝලියම් ආරක්ෂක බිලධාරීහු 48ක් විසිර යති
Passing out parade of CPST security officers
A passing out parade of 49 new security officers recruited to the Ceylon Petroleum Storage Terminals (CPST) was recently held under the patronage of its Chairman and Managing Director Shehan Seneviratne.
The recruits were trained for one month at the Kalutara Police Training College.
The best shooters were also presented with awards.
Mr. Seneviratne, Security Manager Nissanka Jayawardena, Police
Training College Training Director ASP Sarath Premalal, Chief Inspector Ruchira Karunanayake and Inspector Ramanayake inspected the passing out parade.
BY RAVEENDRA DEEYAGAHAGE

කළමණාකරන සාකච්ඡාව සහ විග්‍රහය

සීපීඑස්ටීඑල් විසින් අත්‍යවශ්‍ය මහජන සේවාවක් ඉටුකරනු ලබයි.

සීපීඑස්ටීඑල් හි ක්‍රියාකාරකම් ප්‍රසිද්ධ මාධ්‍යවල නිරන්තරව මතුකර දැක්වේ. එමගින් මෙම මහජන උපයෝගිතාවය අවශ්‍ය තැනට හා ස්ථානයට සපයාදීමට සමාගමේ ඇති කැපවීමට හාත්පසින්ම ප්‍රතිවිරුද්ධ වූ අහිතකර ප්‍රතිරූපයක් මැවිය හැක.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සුමටලෙස ගෙනගොස් බාරදීමට හෙදින් ව්‍යුහගත සංවිධාන ආකෘතියක් තුල සීපීඑස්ටීඑල් වගකිවයුතු ආකාරයෙන් ක්‍රියාත්මක වේ.

මහජනතාව නොදැනුවත්ව සිටිය හැකි සමාගමේ මෙම පැතිකඩයේ කතාන්තරය, මෙසේ කියමු.....

මෙහෙයුම් හා ව්‍යාපාරික විමර්ශනය

මෙහෙයුම් පරිසරය

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් මූලික වශයෙන්ම ශ්‍රී ලංකාවේ යටිතල නිෂ්පාදිත හැසිරවීම කළමණාකරණය කිරීම සඳහා බණිජතෙල් තොග ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ කටයුතුවල යෙදී සිටියි. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ නියුක්තවූ විවිධ අංශවල සිල්ලර සහ තොග පාරිභෝගිකයන්ගේ බලශක්ති ඉල්ලුම සපුරාලීමට, ලංකා බණිජතෙල් සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම සතු 1,500 කට වැඩි සිල්ලර වෙළඳ ස්ථාන වෙත අපි සේවය සපයන්නෙමු. අලෙවිකරණ සමාගම් දෙක වෙනුවෙන් නිෂ්පාදිත තොග ගෙනගොස් බාරදීම සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි බෙදාහැරීමේ අංශය විසින් ඉටුකරනු ලබයි.

බණිජතෙල් අංශයේ හැසිරීම

ශ්‍රී ලංකාවේ බණිජතෙල් අංශය ලංකා බණිජතෙල් සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම යන අලෙවිකරන සමාගම් දෙක අතර ද්විපාර්ශික සබඳතාවයක් පවතී. වෙළඳපොලින් ප්‍රධාන කොටස ලංකා බණිජතෙල් සංස්ථාව සතුවන අතර රජය මගින් පාලනය වන මිල තුලින් වෙළඳපොල අභිබවනය කරයි. ලංකා ඉන්දියන් තෙල් සමාගම හට ස්වාධීනව මිල තීරණය කිරීම සඳහා අවස්ථාව තිබියද ලංකා බණිජතෙල් සංස්ථාව වෙළඳපොල අභිබවනය කර ඇති නිසා එම මිල ගණන් අනුගමනය කිරීමට සිදුව ඇත. එම නිසා මිල පාලනය රජයේ ප්‍රතිපත්ති හා තීරණ මත ප්‍රධාන වශයෙන්ම රඳා පවතී. බණිජතෙල් මිල පහළ මට්ටමක තබා ගැනීමේ රජයේ ප්‍රතිපත්තිය නිසා ඉල්ලුම ස්ථායීලෙස වැඩිවෙමින් යයි. මේ අතරතුර කර්මාන්ත පාර්ශවකරුවන් විනිවිද භාවය සහතික කරමින් සහ දිගුකලක් පවතින ගැටළුවකට වෙළඳපොල පදනම් කරගත් විසඳුමක් දෙමින් සිල්ලර මිල තීරණය කිරීමට මිල සූත්‍රයක් හඳුන්වා දෙන්නැයි රජයට යෝජනා කර ඇත. එවැනි සූත්‍රයක් පාරිභෝගිකයාට සෘජු බලපෑමක් කරන අතර එනිසා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි ව්‍යාපාරික කටයුතු වලට බලපානු ඇත.


බණිජ තෙල් නිෂ්පාදිතයන් සඳහා ඉල්ලුම

වර්ෂ 2015 ජනවාරියේ දී, ලෝක මිල ගණන් පහත වැටීමට ප්‍රතිචාර වශයෙන් රජය දේශීය බණිජතෙල් සිල්ලර මිල අඩුකලේය. සියලුම බණිජ තෙල් නිෂ්පාදිතයන් සඳහා සාමාන්‍ය වශයෙන් 20% මිල අඩුකිරීමක් කර තිබූ අතර රටේ වාහන සංඛ්‍යාව වැඩිවීමත් සමඟ ඉල්ලුමේ හදිසි වැඩිවීමක් නිරීක්ෂණය විය. කෙසේ වුවද මෙම වැඩිවීම ඔක්ටේන් 92 සහ ඔක්ටේන් 95 පැට්‍රල් සඳහා සුවිශේෂී විය


2015 වසරට සාපේක්ෂව 2016 වසරේ සමාන්තර කාලය සඳහා ඔක්ටේන් වර්ධන වේගය 20% පමණ විය. ඩීසල් මගින් ධාවනය වන වාහන වලට වඩා ඉන්ධන කාර්යක්ෂමතාව වැඩි දෙමුහුන් වාහන ලංකා ඔටෝ . ඩීසල් වල ඉල්ලුම බොහෝවිට එකම මට්ටමේ පැවතුන අතර 2015-16 කාලපරිච්ඡේදය සඳහා ආන්තික වශයෙන් වැඩිව ඇත.

බෙදාහැරීමේ ක්‍රියාවලිය

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් පවත්නා සම්පත් කාර්යක්ෂමව භාවිතකරමින් වැඩිවූ ඉල්ලුම සාර්ථකව ආවරණය කලේය. බෙදාහැරීමේ ක්‍රමවේද සහ ඒවායේ විභජනය පහත දැක්වෙන පරිදි වේ.




ප්‍රධාන වශයෙන්ම බලශක්ති නිෂ්පාදන සහ ප්‍රවාහන අංශ වලින් ඉල්ලුම වැඩිවූ නිසා බණිජ තෙල් නිෂ්පාදිත සඳහා ඉල්ලුම 2016 දී ප්‍රමාණවත් ලෙස ඉහළ ගියේය. දේශීය වෙළඳපොලේ ඉන්ධන සඳහා ඉල්ලුමේ ප්‍රවනතාවය 2015 හා සසඳන විට 2016 දී සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි අයභාරය වැඩිවීමට හේතු විය..



මූල්‍ය සමාලෝචනය

පිරිවැටුම


පසුගිය වසර පහ තුලදී වැඩිම අගය වාර්තා කරමින් සමාලෝචිත වර්ෂය තුලදී මූලික අයභාරය රු. බිලියන 10.2 (2015 රු. බිලියන 9.3) දක්වා 9% කින් වැඩිවිය..





අනෙකුත් අයභාර මූලාශ්‍ර ප්‍රවාහන ආදායම සහ බංකර තෙල් මෙහෙයවීමෙන් ජනිතවේ. බංකර තෙල් නිෂ්පාදනය අඩුවීම නිසා 2015 දී බංකර තෙල් මෙහෙයවීම නවතාදමන ලදි..

දළ ලාභය

දළ ලාභය වර්ෂය තුලදී පසුගිය වසර පහ තුලදී වැඩිම අගය වූ රු. බිලියන 6 වාර්තා කරමින් (2015 රු. බිලියන 5.2) 13.9% කින් වැඩිවිය. ශුද්ධ ලාභය වර්ෂය තුලදී රු. බිලියන 2.3 වාර්තා කරමින් (2015 රු. බිලියන 1.7) 35.8% කින් වැඩිවිය.







මානව සම්පත

මානව සම්පත සමාගමේ ඉපයුම් හැකියාව, ඵළදායීතාව, සහ දිගුකල් පැවැත්ම ආදියෙහි ප්‍රාථමික සංරචකය වන අතර එය සමාගමේ මාහැඟි සම්පත යි.
සමාගම ඉන්ධන ගබඩා කිරීම සහ බෙදාහැරීම මගින් සමස්ත රටටම සේවය කරනවා පමණක් නොව සියලු වාර්ගික කණ්ඩායම් ආවරණය වන පරිදි අපගේ සේවක පිරිසට එක්වීමට අවස්ථාව සලසා දෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස වයස, ලිංගභේදය හෝ ආගම ගැන නොසලකා රටේ සියලු පුරවැසියන්ට සමාන අවස්ථා සලසා දෙයි. මානව සම්පත හොඳින් කලමණාකරනය සඳහා සමාගම පියවර කිහිපයක් ගෙන ඇත.

පුහුණුව හා සංවර්ධනය

වර්ධනයවෙමින් යන සිෂ්‍රතාවයකින් තාක්ෂණය වෙනස්වන විට, වෙනස්වන ලෝකය සමග තරඟ කිරීමට අළුත් දක්ෂතා අවශ්‍ය වේ. කාර්මික හා කාර්මික නොවන සේවකයින්ගේ ඉහල ඵළදායීතාව, නාස්තිය අවමකිරීම සඳහා, දැනුම, දක්ෂතා හා ආකල්ප ඉහල නැවීමට යොමුවු මානව සම්පත් සංවර්ධන කාර්යය කම්කරු ශ්‍රේණිවල සිට කළමනාකරන මට්ටම දක්වා විනය රකින සේවකයින් ගෙන් සමන්විත ආරක්ෂණ සංචිතය ගොඩ නගයි. එහෙයින්, කාර්මික හා කාර්මික නොවන සේවකමණ්ඩලයට වැඩසටහන් හා වැඩමුළු කිහිපයක් වසර තුලදී පැවැත්විණ.

විදෙස් පුහුණු වැඩසටහන් - 2016

වැඩසටහන	රට
කළමණාකරන පුහුණුව	
"ශ්‍රී ලංකාව සඳහා ආයතන කළමණාකරනය" පුහුණු වැඩසටහන	ටෝකියෝ, ජපානය
"උපක්‍රමික සේවක බලකා සැලසුම්කරනය" පිලිබඳ පාඨමාලාව	ක්වාලා ලම්පුර්, මැලේසියාව
"දකුණු ආසියානු රටවල කුඩා සහ මධ්‍යපරිමාණ ව්‍යාපාර සඳහා සැලසුම්කරනය" පිලිබඳ වැඩසටහන	ඔසාකා, ජපානය
ව්‍යාපෘති කළමණාකරනය පිලිබඳ ජාත්‍යන්තර වැඩසටහන	සිංගප්පූරුව
"විධායක නිළධාරීන් හා කළමණාකරුවන්ට කාර්යාල පරිපාලන කළමණාකරනය" පිලිබඳ වැඩමුළුව	සිංගප්පූරුව
"සිහින් ගබඩා අන්තර්ගතය " පිලිබඳ වැඩමුළුව	ඩුබායි, එක්සත් අරාබි එමිර් රාජ්‍යය
"ව්‍යාපෘති මූල්‍ය ආකෘති "පිලිබඳ ජාත්‍යන්තර වැඩසටහන"	සිංගප්පූරුව
"ද්‍රව තොග ගබඩා කළමණාකරනය" පිලිබඳ පුහුණු පාඨමාලාව"	ක්වාලා ලම්පුර්, මැලේසියාව
"ප්‍රසම්පාදන අවදානම් කළමණාකරනය " පිලිබඳ වැඩමුළුව	සිංගප්පූරුව
"තෙල්, ගෑස් හා බණිජ රසායන සඳහා ගොඩබෑමේ නිලධාරීන් සහතිකකරනය " පිලිබඳ වැඩමුළුව	ඩුබායි, එක්සත් අරාබි එමිර් රාජ්‍යය
වෘත්තීය සංවර්ධන වැඩසටහන්	
"මානව සම්පත් විගණන විශිෂ්ඨත්වය" පිලිබඳ සම්මන්ත්‍රණය	ඩුබායි, එක්සත් අරාබි එමිර් රාජ්‍යය
"ප්‍රධාන මූල්‍ය නිලධාන්ගේ ඉහලපෙලේ සමුළුව 2016"	ගෝල්ඩ් කෝස්ට්, ඕස්ට්‍රේලියාව
"9 වැනි වාර්ෂික අභ්‍යන්තර විගණනකවරු 2016" පිලිබඳ සම්මන්ත්‍රණය	ඩුබායි, එක්සත් අරාබි එමිර් රාජ්‍යය
රැකියාවේදී පුහුණුව	
"ගුවන්යානා ඉන්ධන හැසිරවීමේ රැකියාවේ පුහුණු වැඩසටහන"	
වෙනත්	
බෙන්තම් කම්හලට හුරුවීමේ චාරිකාව	







පුහුණුව



දේශීය පුහුණුව – 2016

	වැඩසටහනේ නම	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගිවූවන් සංඛ්‍යාව
01	වැඩ ආම්රහක පුහුණුව	01	174
02	කළමණාකරන පුහුණුව o සැපයුම් දාමය කළමණාකරනය o උපක්‍රමික කළමණාකරනය	02	91
03	තාක්ෂණික හා වෘත්තීය පුහුණුව o අකුණු සැර සහ අධි විදුලිසැර වැලක්වීම o ගුණාත්මකතාව කළමණාකරනය තුලින් ලාභ වැඩිකරන්නේ කෙසේ ද o "වායුසමීකරන පද්ධති නඩත්තුව" ප්‍රායෝගික නැඹුරුවක් සහිත වැඩමුළුව o ලංසුතැබීමේ ක්‍රියාවලිය සහ කොන්ත්‍රාත් පරිපාලනය o ලංසුතැබීමේ ලියවිලි සැකසීම o ආයතන පරීක්ෂණ කටයුතු පිලිබඳ නියාත්මක හා ප්‍රායෝගික අංශයන o ආයතන පරීක්ෂණ කටයුතු වැඩසටහන (උසස්) o අභ්‍යන්තර විගණන කටයුතු සංවර්ධනය o සමාගමේ අරමුණු සාක්ෂාත් කිරීමට ආරක්ෂක නිළධාරීන් පෙළගැස්වීම o දෙමුහුන් වාහන ගැන දැනුවත් කිරීමේ වැඩසටහන" o පෙට්"-1 ඉන්ධන හැසිරවීම	15	629
04	මෘදු කුසලතා සහ කණ්ඩායම් පුහුණුව o "රියදුරන්ගේ කාර්යභාරය සහ වගකීම" පිලිබඳ වැඩමුළුව o ඵලදායිතාව වර්ධනය කිරීමේ ශිල්පක්‍රම o සේවක ජේත්තුව o "ගීතය තුලින් එය දකිමු" o ඔබගේ රැකියාවට අගය එක්කරන්නේ කෙසේද? o "හරිත ඵලදායිතාව" o ධනාත්මක ශෝභන වැඩකරන ස්ථානයක් ඇතිකරන්නේ කෙසේද? o "රැකියා සංවර්ධනයට මානසිකත්වය" o ප්‍රතිඵලදායී කාර්යාල කළමණාකරනය ඵලදායිතාව o බලසම්පන්න හැදෑරුම් සංස්කෘතිය	17	1008
05	සෞඛ්‍ය හා ආරක්ෂණ පුහුණුව o ආයුර්වේද වෛද්‍ය වැඩසටහන o "සුම්බා" යෝග්‍යතා වැඩසටහන o ආරක්ෂණ රියපැදවීමේ වැඩසටහන o ගිනි හා ආරක්ෂා වැඩසටහන o මන්ද්‍රව්‍ය වැලක්වීමේ වැඩසටහන o සෞඛ්‍යමත් ජීවිතයක් සඳහා "යෝග"	06	286
06	බාහිර නැඹුරු පුහුණුව o ප්‍රයත්නය පදනම් වූ පුහුණුව - කොත්මලේ	01	27
	එකතුව	42	2,215



වෘත්තීය ප්‍රතිරූපය ගැන බාහිර නැඹුරු පුහුණුව

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කොත්මලේ පුහුණු පාසැලේ දී විධායක නිළධාරීන් හා කළමණාකරුවන් සඳහා වෘත්තීය ප්‍රතිරූපය ගැන වැඩසටහන පුහුණු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. සේවාදායකයන්, ගණුදෙනුකරුවන් සහ සමසේවකයන් බලවත් සිත්කාවැදීම් ඇති කිරීමට සහ හොඳ පෞරුෂත්වය, ආත්ම විශ්වාසය සහ සාථකත්වයකින් යුතුව ව්‍යාපාර කටයුතු කරගෙන යාමට කළමණාකරුවන් පුහුණු කිරීමට වැඩසටහන සැලසුම් කෙරින. සහභාගිවූවන් විසින් අන්තර් ක්‍රියාකාරීත්වයන් ව්‍යාපාර කටයුතු කිරීමට සහ ආත්ම විශ්වාසය සහ ප්‍රවීනත්වය සහිතව නව සහ අභියෝගකාරී ව්‍යාපාරික අවස්ථාවන් හැසිරවීමට අවශ්‍ය වටිනා දක්ෂතා ලබාගත්හ.





සේවක සුභසාධනය

නිවාස ණය සය වාහන ණය ඇතුලුව සේවකයින්ගේ බොහෝ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට පහසු පොලී අනුපාත යටතේ ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් කිහිපයක් ඇත. සේවකයන්ගේ පවුල්වල භාවිතය සඳහා සමාගම විසින් රටපුරා නිවාඩු නිවාස හතරක් පවත්වාගෙන යයි. සේවකයන් විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී අතිරේක පාරිතෝෂික ගෙවීමක් සහ මරණය සිදුවූවා නම් මරණ පාරිතෝෂිකයක් සකසුරුවම් සමිතියේ අරමුදල් වලින් ගෙවනු ලැබේ. සේවකයන් හා ඔවුනගේ පවුල් වල යහපත සඳහා සමාගමේ සකසුරුවම් සමිතිය මගින් වෛද්‍ය ආධාර ක්‍රමයක් පවත්වාගෙන යයි..

නිශ්චිත වසර සංඛ්‍යාවක් සේවය සාර්ථකව සම්පූර්ණකර උපහාර ලැබූ සේවකයන් මෙසේය.

සම්පූර්ණකල සේවා වසර ගණන	සේවා තිළිණය	උපහාර ලැබූ සේවකයන් සංඛ්‍යාව
අවුරුදු 20	රු. 10,000/-	312
අවුරුදු 25	රන් පවුම් 2.5 ක කාසියක්	26
අවුරුදු 30	රු. 20,000/-	30
අවුරුදු 35	රු.. 25,000/-	21

වසර තුලදී රජයේ විශ්ව විද්‍යාලවල උසස් අධ්‍යාපනය සඳහා තෝරාගත් සේවකයින්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව 92 ක් ප්‍රදානය කරන ලදි.

සේවක සෞඛ්‍ය හා ආරක්ෂාව





සමාගම ශ්‍රී ලංකාවේ විශාලතම බණිජතෙල් පර්යන්ත මෙහෙයවන්නා වන අතර නිෂ්පාදිත වහා ගිනිගන්නා සුළුය. මෙහෙයුම් කටයුතු ද ඉහල අවදානම් කොටස යටතට වැටේ. මෙහෙයුම් හැසිරවීමේ දී වන සුළු අත්වැරැද්දක් මගින් විශාල පරිමාණයේ ගින්නක් ඇතිවිය හැකිය. **සීපීඑස්ටීඑල්** යනු ආර්ථික වශයෙන් ඉතා සංවේදී මධ්‍යස්ථානයක් බැවින් විශාල පරිමාණයේ ගින්නක් මගින් රටේ ආර්ථිකය කඩාවැටෙනු ඇත. එම නිසා කාර්මික හා වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව **සීපීඑස්ටීඑල්** හි මෙහෙයුම් වල උපරිම වැදගත්කමකින් යුත් සාධකයකි. **සීපීඑස්ටීඑල්** සමාගමට ඒ වෙනුවෙන්ම කැපවුනු අභ්‍යන්තර, ප්‍රථමාධාර පුහුණුව, ගිනි සරඹ, ආරක්ෂණ පුහුණුව සහ දැණුවත් කිරීමේ වැඩසටහන් පවතී.

සේවකයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් වන කැපවීම සහ උනන්දුව වැඩිකිරීමට සෑම වසර දෙකකටම වරක් ගිනි සහ ප්‍රවේසම් කාර්යාංශය මගින් ආරක්ෂණ තරඟය පවත්වයි. තරඟය දියත් කරමින් වරක් ගිනි සහ ප්‍රවේසම් කාර්යාංශය "ආරක්ෂණ වසර" ප්‍රකාශයට පත්කරයි.

නිරීක්ෂණය මගින් එකිනෙක අංශයෙන් "ආරක්ෂණ වසර" හි එකිනෙක මාසය සඳහා ආරක්ෂිතම සේවකයා තෝරා ගැනේ.

මාසය සඳහා වූ ආරක්ෂිතම සේවකයන් අතරින් ආරක්ෂිතම "වසරේ සේවකයා" තෝරා ගැනේ.

කොලොන්නාව නිමාවේ වැඩහල් වලින් වසරේ ආරක්ෂිතම වැඩහල තෝරා ගැනේ..

සීපීඑස්ටීඑල් හි තොග ගබඩා වලින් ආරක්ෂිතම තොග ගබඩාව තෝරා ගැනේ.

අළුත්ම ප්‍රවනතා සහ සිදුවීම් පිළිබඳව සේවකයන්ගේ දැණුම වර්ධනය කිරීමට ගිනි සහ ආරක්ෂණ අංශය මගින් "ආරක්ෂණ විවරණිකාව" ක් ප්‍රකාශයට පත්කොට සෑම අංශයකටම නොමිලයේ ලබාදෙයි.

සීපීඑස්ටීඑල් හි සියළුම මෙහෙයුම් බණිජතෙල් බෙදාහැරීමේ කර්මාන්තයේ පිළිගත් ව්‍යවහාරයන්ට සහ පරිසර ආරක්ෂණ පණතේ නියමකර ඇති රෙගුලාසි සහ මගපෙන්වීම් වලට අනුව සිදුකෙරේ.

ප්‍රධාන ව්‍යාපෘති

බණිජතෙල් නිෂ්පාදිත ගබඩාකිරීමේ හා බෙදාහැරීමේ වගකිවයුතු ආයතනය වශයෙන් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි අනාගත වර්ධනය සඳහා වේදිකාවක් ලෙස යටිතල පහසුකම් හා වැදගත් ප්‍රසාරණ ව්‍යාපෘති සංවර්ධනයට මුල් පිරීම් කිහිපයක් කර ඇත.

1. **විශ්කම්භය 12' වූ නළ මාර්ග කොටස් සවිකිරීම**

කොළඹ වරායේ දකුණු ජැටියේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා විශ්කම්භය 12' වූ නළ මාර්ගය දැන් නැවත සකස් කෙරෙමින් පවතින අතර මීටර් 2,471 (මුළු දුර වන මීටර් 6,166 න්) ක් විවෘත අගල් කැපීමේ තාක්ෂණය යොදාගනිමින් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් දැනටමත් ප්‍රතිසම්පාදනය කර ඇත. ඉතිරි කොටස ප්‍රතිසම්පාදනය සඳහා නව නළ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි ගබඩාවට දැනටමත් බාරදී ඇති අතර ඉතිරි කොටසින් මීටර් 3,111 ක් විවෘත අගල් කැපීමේ තාක්ෂණය නව නළ යොදා ප්‍රතිසම්පාදනය කිරීමට සැලසුම් කර ඇත.



2. **කුරුණෑගල තොග ඩිපෝව සංවර්ධනය.**

ගිනි හා එව් එස් ඊ සහ බණිජතෙල් කර්මාන්ත ප්‍රමිතයන් අනුකූලතාවය දැක්වීමට තොග ගබඩාවල දැනට ඇති පහසුකම් උසස් කලයුතු බව සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හඳුනාගෙන ඇත. මේ සම්බන්ධයෙන් කුරුණෑගල තොග ගබඩාවේ වැඩිදියුණු කල යුතු හා සංවර්ධනය කල යුතු දෑ කිහිපයක් හඳුනාගැන්නා ලදි. ඇතුලත කොටස බැමි බිත්ති යොදා ආරක්ෂා කිරීමට, ගිනි නිවීමේ පහසුකම් ටැංකි අංගනයෙන් ඉවතට ගැනීම, ටැංකි සහිත ප්‍රදේශයට ඇතුල්වීමට පහසු කිරීම, ගැසලින් පිරවීමේ අට්ටාලය මධ්‍ය ප්‍රදේශයකට ගෙනයාම, ආරක්ෂණ සංකේත සහ ප්‍රමිත හා ගැලපෙන ලෙස ගැසලින් ගබඩාව සහ ගබඩා ප්‍රදේශය යලි සැකසීම අවශ්‍ය වේ.

තට්ටු තුනකින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම, නව ගිනි නිවීමේ පොම්පාගාරයක් සහ ගිනි නිවීමේ කාර්‍යාලයක් ඉදිකිරීම, ගිනි නිවීමේ පොම්පාගාරය සහ ගිනි නිවීමේ මාර්ග වෙනත් තැනකට ගෙනයාම සහ බැමි බිත්ති ඉදිකිරීම කුරුණෑගල තොග තෙල් ගබඩාව වැඩි දියුනුකිරීමේ සහ සංවර්ධනය කිරීමේ වැඩ යටතේ කරන ලදි.

3. **මාගාල්ලේ තොග ඩිපෝව සංවර්ධනය**

අනාගත අවශ්‍යතාවයන් පිරිමැසීමට සහ බණිජතෙල් කර්මාන්තයේ ආරක්ෂණ අවශ්‍යතාවලට අනුකූලතාවය දැක්වීමට ගිනි නිවන පද්ධති උසස් තත්වයකට ගෙනඒමට මාගාල්ලේ තොග ඩිපෝව උසස් තත්වයට ගෙන ඒමට පියවර ගෙන ඇත. ටැංකි අංගනය සංවර්ධනය, නව ගිනි පොම්පාගාරයක් සහ ගිනි කාර්‍යාලයක් ඉදිකිරීම, කාර්‍යාල ගොඩනැගිල්ල සහ විවේකාගාරය නවීකරනය මාගාල්ල තොග ගබඩාවේ සංවර්ධනය යටතේ කරගෙනයන ලදි.



4. **කොලොන්නාව නිමාවේ අභ්‍යන්තර මාර්ග ජාල පද්ධතිය වැඩිදියුණු කිරීම**

පදික වේදිකා සහ කානු පද්ධතිය වැඩිදියුණු කිරීම සහ මාර්ගසේවා උපයෝගිතාවන් වෙන්කිරීම ඇතුලුව ආස්තරණ වැතිරීමෙන් ප්‍රධාන මාර්ග දෙකක් සහ වට මාර්ග වලින් සමන්විත කොලොන්නාව නිමාවේ අභ්‍යන්තර මාර්ග ජාලය සම්පූර්ණයෙන්ම පුණරුප්තාපනය කරන ලදි. මාර්ග ජාල පද්ධතිය වැඩිදියුණු කිරීම නිමාව තුල කාර්‍යක්ෂම වාහන සංසරනය සහ වර්ෂාකාලයේ දී හදිසි ජලගැලීම් අඩුකිරීම කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කල්ය.



5. **කොලොන්නාව නිමාවේ 1-4 කලාපයේ බැමි ආරක්ෂාව.**

1-4 කලාපයේ මායිම් තාප්පය අසල බැමි ප්‍රදේශය බෑවුම අසාර්ථක වීමෙන් බරපතල ලෙස හානිවී ඇත. වර්ෂා කාලයේ දී බොහෝ ස්ථානවල බෑවුම කඩාවැටී ඇති අතර අස්ථාවර ලෙස පෙනීයයි.

වර්ෂා කාලයේ දී තවදුරටත් ගෙවියාම ඇතිවිය හැකි අතර යාබදව ඉහලින් ඇති නිවෙස් වලට සහ මායිම් තාප්පය අසල ස්ථානයට අහිතකරලෙස බලපෑම් ඇතිකල හැකිය. එමනිසා මධ්‍ය පරිමානයේ ව්‍යසනයක් වැලැක්වීමට සහ ප්‍රදේශය ස්ථාවර තත්වයක තබාගැනීමට බෑවුම නිවරදිව කිරීමේ ක්‍රම හඳුන්වා දෙමින් ප්‍රතිකර්ම වැඩ ක්‍රියාවට නැංවිය යුතුව ඇත. ප්‍රතිකර්ම කටයුතු 2016 වසර අවසානයේදී ආරම්භ කරන ලදි.

6. කොලොන්නාව තෙල් ස්ථාපනයේ ටැංකි අංක 5 අළුත්වැඩියාව.

ඩීසල් ගබඩා කිරීමේ . ගබඩා පහසුකමේ සංකලනිකතාව සහතික කිරීමට කොලොන්නාව නිමාවේ ටැංකි අංක 5 සම්පූර්ණයෙන්ම පුනරුජ්ජීවනය කොට මෙහෙයුම් සඳහා යොදන ලදි.

7. දත්ත මධ්‍යස්ථානය සඳහා ආපදා ප්‍රතිසංවිධාන සහ කළමණාකරන මධස්ථානය

හදිසි හෝ චේතනාත්මක කඩාකප්පල් වීමක් නිසා **සීපීඑස්ටීඑල්** හි දත්ත මධ්‍යස්ථාන ආපදා ප්‍රතිසංවිධාන සහ කළමණාකරන මධස්ථාන ව්‍යාපෘතිය (DRHC) **සීපීඑස්ටීඑල්**, ලංකා බණිජ තෙල් සංස්ථාව සහ ලංකා ඉන්දීය තෙල් සමාගමෙ හි ව්‍යාපාරික කටයුතු වලට වසරපුරා ආයතනික සම්පත් සැලසුම් පද්ධතියේ 24 X 7 මෙහෙයුම් වලට සහාය දැක්වීමට ඇත. ප්‍රාථමික දත්ත අංශයේ දෘඩිකාංග උසස් කිරීම, දැනට ඇති සවර් පද්ධති වලින් නව දෘඩිකාංග වලට මෘදුකාංග සංක්‍රමණය කිරීම, ආපදා ප්‍රතිසංවිධාන සහ කළමණාකරන මධස්ථාන ව්‍යාපෘතිය නිශ්චය කිරීමෙන් පසු ටෙන්ඩර් ක්‍රියාදාමය තුලින් තෝරාගනු ලබන නියමිත සත්කාරක පොලක දෘඩිකාංග සහ මෘදුකාංග ස්ථාපනය ව්‍යාපෘතියට ඇතුලත් වේ..

8. කොලොන්නාව නිමාවේ සංඛ්‍යාංක පුද්ගලික ශාඛා දුරකථන හුවමාරුවක් සවිකිරීම

කොලොන්නාව නිමාවේ පැරණි පුද්ගලික ශාඛා දුරකථන හුවමාරුව අවුරුදු 25 කට වඩා පැරණිය. නිරන්තර කඩාවැටීම් ඉවත්කිරීමට සහ ස්ථාපනයේ අභ්‍යන්තර සංනිවේදන ජාලය දියුණු කිරීමට පුද්ගලික ශාඛා දුරකථන හුවමාරුවකින් ප්‍රතිසම්පාදනය කරන ලදි. කොලොන්නාව නිමාවේ අභ්‍යන්තර දුරකථන පද්ධතිය වඩා යහපත් කිරීමට නව සංඛ්‍යාංක පුද්ගලික ශාඛා දුරකථන හුවමාරුවක් ප්‍රසම්පාදනය, ස්ථාපනය සහ නවීකරණය කිරීමට ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලදි, නව පුද්ගලික ශාඛා දුරකථන හුවමාරුවට දිගු අංක 800 කට සේවය සැපයිය හැකිය..

9. කොලොන්නාව තෙල් නිමාවේ ක්‍රීඩාගාරය වැඩි දියුණු කිරීම

සීපීඑස්ටීඑල් හි සේවකයින්ගේ ශාරීරික සුභ සිද්ධිය සඳහා **සීපීඑස්ටීඑල්** හි කලාප අංක 8 හි ක්‍රීඩාගාර පහසුකම දියුණු කෙරේ. නව ක්‍රීඩාගාරය **සීපීඑස්ටීඑල්** හි සේවකයින් ගේ භාවිතය සඳහා ශාරීරික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වන සියලුම අයිතමයන්ගෙන් සූදානම් කෙරේ.

10. කොලොන්නාව තෙල් නිමාවේ ගජබාපුර කසල බැහැර කරන තැන වටකර වැටක් තැනීම සහ වැඩි දියුණු කිරීම

සීපීඑස්ටීඑල් හි නිසි කසල බැහැර කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාවේ යෙදවූ අතර, ඒ අනුව, කසල බැහැර කිරීමේ පහසුකම් දියුණු කිරීමට ව්‍යාපෘතිය කරගෙනයන ලදි. පැරණි බැහැර කිරීමේ පහසුකම් කොලොන්නාව රාජගිරිය ප්‍රධාන මාර්ගය අසලවූ තාවකාලික භූමි භාගයකි. පුද්ගලික බවුසර නැවතුම් ස්ථානය අසල සුදුසු නව ස්ථානයකට එය ගෙනයන ලදි. තවදුරටත් බැහැර කරන තෙක් වෙන්කල කසල දැමීමට වෙන්කල ස්ථාන හතරකින් පහසුකම සමන්විත වේ..

11. සෞඛ්‍ය ආරක්ෂණ පරිසර කාර්යාලය ප්‍රකෘතිමත් කිරීම

ගෝලීය අවශ්‍යතාවයන්ට අනුකූලව සෞඛ්‍ය ආරක්ෂණ පරිසර කටයුතු කරගෙන යාමට **සීපීඑස්ටීඑල්** හි සෞඛ්‍ය ආරක්ෂණ පරිසර ඒකකය පිහිටුවන ලදි. අළුතින් පිහිටුවන ලද සෞඛ්‍ය ආරක්ෂණ පරිසර ඒකකයට කාර්යාල ඉඩකඩ ලබාදීම සඳහා 8 වන කලාපයේ දැනට පවත්නා ගොඩනැගිල්ලක් ප්‍රකෘතිමත් කිරීමට ව්‍යාපෘතිය කරගෙනයන ලදි.



අවදානම් කළමණාකරණය

සංවිධානයක් හා බැඳුණු අවිනිශ්චිත තාවයන් මගහරවා ගැනීමට ක්‍රමවේදයන් සොයා ගැනීම, හඳුනාගැනීම සහ විග්‍රහය කිරීමේ ක්‍රියාවලිය අවදානම් කළමණාකරණය වේ.

ඕනෑම ව්‍යාපාරික පරිසරයක පැන නගින අවිනිශ්චිත තාවයන් හෝ අවදානම් නිසිලෙස කළමණාකරණය නොකලහොත් එමගින් විශාල අලාභ හෝ සැලසුම් නොකල අලාභ ඇතිවිය හැකි අතර කීර්තියටද හානිකරවිය හැක.

සමාගම හා බැඳුණු අවදානම් පිළිබඳ විස්තරයක් සහ එවැනි අවදානම් මගහරවා ගැනීමට ගත් අවදානම් කළමණාකරන ක්‍රායාමාර්ග පහත දැක්වේ.

පාරිසරික අවදානම

වැදගත් බලශක්ති මූලාශ්‍රයක් වීමට අමතරව, බණිජතෙල් කර්මාන්තය, වායු, ජල සහ පස් ඇතුළුව පරිසරයට උපද්‍රව ඇතිකරන ප්‍රධාන හැකියාවන් දරා සිටියි. වායු, ජල සහ පස් දූෂණය මිනිස් ජීවිත වලට සහ ජීව පද්ධතියට ප්‍රධාන බලපෑම් ඇතිකරයි.

පරිබාහිර පරිසරයට වියහැකි අහිතකර බලපෑම් අවම කිරීමට මෙහෙයුම් ක්‍රියාපටිපාටි නිර්මානය කර ඇත. මධ්‍යම පරිසර අධිකාරිය මගින් පනවා ඇති මගපෙන්වීම් සහ බණිජතෙල් කර්මාන්තයේ ආරක්ෂණ ව්‍යවහාරයන්ට අනුව ජනිතකරන සියලු අපද්‍රව්‍ය සහ බැහැරකිරීම් (ද්‍රව සහ ගෑස්) හසුරුවනු ලැබේ.

සීපීඑස්ටීඑල් මෙහෙයුම් කටයුතු වලින් ජනිතවන අපතේයන වතුර ප්‍රමාණය, වර්ෂා කාලවලදී ස්ථාපනයන් තුල කුණාටු ජල එකතුවීම හා සසඳන විට ඉතා කුඩාය. ස්ථාපනයන් තුල කුණාටු ජලය මුදාහැරීමට ප්‍රථම, ස්වාභාවික ජල මූලාශ්‍ර දූෂණය වීම වැලැක්වීමට, ගුරුත්වාකර්ෂණ වෙන්කිරීමේ මූලධර්මය යටතේ ක්‍රියාත්මක වන ජල වෙන්කිරීමේ ඒකක වන තෙල් පෙරහන් කුටීර පද්ධති (Interceptors) භාවිත කෙරේ..

වායු ගුණාත්මක භාවය පරීක්ෂා කිරීම මගින් වායු දූෂණ හැකියාවන් කලින් කලට මනියි. පරිසරයට බණිජතෙල් ද්‍රව්‍යමාලය නිරාවරණය වීම අඩුකිරීමට ඉංජිනේරු පාලනයන් යොදාගන්නා අතර බණිජතෙල් ද්‍රව්‍යමාලයට නිත්‍යානුකූලයෙන් නිරාවරණය වන සියලුම සේවකයිනට සේවක ආරක්ෂණ උපකරණ ලබාදී ඇත..

පැටවීමේ සහ බෑමේ ක්‍රියාවලියේ දී ඉහිරීම පාලනය මගින් බණිජතෙල් නිෂ්පාදිත වලින් වන පස් දූෂණය අවම කෙරේ. හදිසි තෙල් අඩංගුවීමක් ස්දුවුවහොත්, පසේ තෙල් කොටස් අඩංගුවීම පැතිරීම වැලක්වීමට වහා පියවර ගනුලැබේ. ඉහිරීම කාන්දුවීම විශාල පරිමානයෙන් සිදුවන්නේ නම්, රික්ත පොම්ප මගින් තෙල් ඉවත්කරන අතර පසට එකතු වීම වැලක්වී සඳහා උරාගන්නා ද්‍රව්‍ය භාවිතා කෙරේ.

ආර්ථික අවදානම

ශ්‍රී ලංකාව ආනයන මත රඳාපවතින බණිජතෙල් නිෂ්පාදිත පාරිභෝගිකයෙකි. සමාගම වෙළඳපොල නායකත්වය දරණ සම්පූර්ණයෙන් රජය සතු ආයතනයක් වන ලංකා බණිජතෙල් සංස්ථාව මගින් ආනයනය කරනු ලබන බණිජතෙල් නිෂ්පාදිත ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ නියුක්තව ඇත. එනිසා සමාගම ජාත්‍යන්තර සහ දේශීය ආර්ථික අවදානමට නිරාවරණය වී ඇත. ප්‍රවාහනය, විදුලිබල නිෂ්පාදනය, ධීවර, කෘෂිකර්මය ආදී ආර්ථිකයේ වෙනත් බොහෝ කර්මාන්ත බණිජතෙල් කර්මාන්තය මත විශාල බලපෑමක් ඇත.

අප විසින් අවදානම් කළමණාකරනය කරන ආකාරය ශක්තිමත් කිරීම

උපක්‍රමික අවදානම් කළමණාකරනය අපගේ උපක්‍රමික අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය මූලික කාරණයක් බව අපි පිලිගන්නෙමු.

අවදානම් කළමණාකරනය අපගේ අවධි ව්‍යාපාරික කටයුතු, ක්‍රියාවන් සහ ක්‍රියාවලි වල ගිලී ඇත.

වැදගත්භාවය සහ අවදානම් සඳහා අපේ රිස්සූම අපගේ තීරණ ගැනීමේ ක්‍රියාදාමයේ මූලික සලකා බැලීම් වේ.

ද්‍රවශීලතා අවදානම

සමාගමේ සම්පත් වගකීම් ගෙවාදැමීමට භාවිතා කිරීමේ දී මූල්‍ය අවදානම පැනනගී. කරගෙන යන ව්‍යාපාර මෙහෙයුම්, ප්‍රාග්ධන ව්‍යාපෘති සහ අනෙකුත් ආයෝජන වලටද ප්‍රමාණවත් අරමුදල් සම්පාදනය කර ගැනීමට නොහැකි වුවහොත් සමාගට විශාල වශයෙන් අහිතකර බලපෑම් ඇතිවිය හැකිය.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක වූ අභ්‍යන්තර ක්‍රියාවලි, මිනිසුන් හෝ පද්ධති හෝ බාහිර සිද්ධීන් නිසා පැනනගින අලාභ ඇතිවීමේ අවදානම වේ. ක්‍රියාවලි, මේවා අප ක්‍රියාත්මකවන මිනිසුන්, පද්ධති හෝ ක්‍රියාවලි වලට අදාල වන අවදානම වේ. ආයතනයේ කීර්තිය කෙරෙහි ද එයින් විශාල බලපෑමක් ඇතිවේ. **සීපීඑස්ටීඑල්** හි තත්ව සහතික කිරීමේ ක්‍රියාවලිය අවසන් පාරිභෝගිකයාට බෙදාහරින නිෂ්පාදිත ලෝක ඉන්ධන ප්‍රඥප්තියේ තාක්ෂණ කමිටුවෙන් නියමකර ඇති පිරිවිතර හා අනුකූල වන බවත්, ප්‍රමාදයකින් තොරව නිෂ්පාදිත තත්‍ය ප්‍රමාණය ගෙනගොස් දෙන බවත් සුරක්ෂිත කරයි.

නෛතික හා දේශපාලන අවදානම

ව්‍යාපාරික ආයතනයක් වශයෙන් නෛතික හා රටේ දේශපාලන රාමුවෙන් සහ සංවර්ධනයෙන් සමාගමට බලපෑම් ඇතිවිය හැකිය. ශ්‍රී ලංකාවේ අදාල නීති සහ රෙගුලාසි වලට සමාගම අනුකූල වන බවට සමාගමේ නීති අංශය සහතික කරයි. රෙගුලාසිවලට යටත් ප්‍රධාන අවකාශය අතරට සේවයේ යෙදවීම, බදු නීති සහ පරිසර ගැටලු ඇතුලත් වේ.







අවදානම ඉතා ඉහලයි

පර්යන්තවල බණිජතෙල් නිෂ්පාදන තොග ලබාගැනීම, ගබඩාකිරීම හා බෙදාහැරීම සහ පර්යන්ත උපකරණ නඩත්තු කිරීම වැදගත් ආරක්ෂණ අවදානම් වලට තුඩුදෙන කාර්යයන් වේ. එමනිසා නිසි ආරක්ෂණ ක්‍රියාපටිපාටි පිහිටුවා අනුගමනය කිරීම අවශ්‍ය වේ.

(අ) බණිජතෙල් නිෂ්පාදන ලබාගැනීමේ සංඛ්‍යාතය සහ ක්‍රමය
(ආ) ගබඩාකිරීමේ ධාරිතාව සහ ක්‍රමය
(ඇ) බණිජතෙල් නිෂ්පාදිත පටවන සහ ගොඩබාන වාහන සංඛ්‍යාව
(ඈ) පර්යන්තය තුල සහ අවට නිතිපතා සිටින සේවකයින් සහ මාර්ග ටැංකි රථ රියදුරන් සංඛ්‍යාව
(ඉ) උපකරණ වල වයස සහ වර්ගය.
(ඊ) පර්යන්තයේ වෙනත් කටයුතු සහ පහසුකම් වලට (පටවන අට්ටාල, ගිනි ආරක්ෂණ උපකරණ, ඒඑස්ටී, නල මාර්ග ආදිය) සාපේක්ෂව පර්යන්ත උපකරණ පිහිටි තැන.
(උ) වාහන ඇතුල්වීම, පිටවීම සහ සංසරණයට සාපේක්ෂව පර්යන්තයේ සැකැස්ම
(ඒ) භූමි තත්වයන්, ජලාශ්‍ර සහ කැඩියාම් ආදී ස්ථානයට ආවේනික සාධක.



පුහුණුව අත්‍යවශ්‍යය

සිද්ධීන් වැලැක්වීමට සහ ඒවා ඇතිවුවහොත් ප්‍රතිවිපාක අවම කිරීමට සහායවීම සඳහා පුහුණුව අත්‍යවශ්‍ය වේ.



විශේෂිත වගකීම් සහිත සේවකයිනට විශේෂිත පුහුණුව අවශ්‍යය.:
(අ) නිෂ්පාදිත ලබාගැනීම
(ආ) පැටවුම් බාහුව ක්‍රියාත්මක කිරීම සහ පාලනය කිරීම
(ඇ) ආරක්ෂාකාරී පැටවුම් ක්‍රියාපටිපාටි
(ඈ) කාන්දුවීම පාලනය සහ හදිසි අවස්ථා ක්‍රියාපටිපාටි.
(ඉ) බණිජතෙල් තොග කළමණාකරනය සහ පරීක්ෂා කිරීම
(ඊ) සහන සේවකයන්ගේ නිපුනතාව
(උ) ස්ථානය තුල ආපදා සහ අවදානම්
(ඒ) අවදානම් කළමණාකරන පියවරයන් සහ ක්‍රියාපටිපාටි
(ඌ) හදිසි අවස්ථා ක්‍රියාපටිපාටි
(ඌ) පිටස්තර කොන්ත්‍රාත්කරුවන් පාලනය



සමාජ වගකීම

මූල්‍යමය වශයෙන් පමණක් නොව, සමාජීය වශයෙන් ද තිරසාර වර්ධනය නොනැසී පැවතිය යුතු බව අපි දැනුවත්ව සිටිමු. එනිසා, සේවකයනට සහ මහජනතාවට උදව් කිරීමේදී **සීපීඑස්ටීඑල්** ව්‍යවස්ථාපිත වගකීම් වලින් ඔබ්බට ගොස් කටයුතුකර ඇත.

රටේ සියලු භූගෝලීය, ජනගහන කලාප ආවරණය කරමින්, සියලු ජන වර්ගයන් සහ සමාජ මට්ටම් වලට සමාගම සේවය කරයි. දිවයිනේ ප්‍රජාවගේ හදගැස්ම තේරුම් ගෙන සමාජ වගකීම තේරුම් ගනිමින්, ජාතියට සේවය කිරීම **සීපීඑස්ටීඑල්** හි කණ්ඩායම වන අපට ආඩම්බරයකි.



ගංවතුර උපද්‍රවයට ගොදුරුවූවන්ට සහාය දැකිවීම

2016 දී ඇතිවූ භදිසි විනාශකාරී ජල ගැල්මෙන් ප්‍රකෘති තත්වයට පත්වීමට රටට උදව් කිරීමට අවතැන්වූ දහස් සංඛ්‍යාත පවුල්වලට පිසූ ආහාර, වියලි සලාක සහ ගෘහ අවශ්‍යතා සපයාදෙමින් **සීපීඑස්ටීඑල්** විසින් සහය ලබා දීමට කටයුතු කර ඇත.



ලේ දන්දීමේ ව්‍යාපාරය

සීපීඑස්ටීඑල් ආයතනයේ මෙහෙයවීමෙන් ලේ දන්දීමේ ව්‍යාපාරය වාර්ෂිකව පවත්වයි.



ඩෙංගු පැතිරීම වැලැක්වීමේ ශ්‍රමදාන ව්‍යාපාරය

සීපීඑස්ටීඑල් ආයතනයේ මෙහෙයවීමෙන් සියලුම තොග ගබඩා ද ආවරණය වන පරිදි ඩෙංගු පැතිරීම වැලැක්වීමේ ශ්‍රමදාන ව්‍යාපාරයන් කිහිපයක් වසර තුලදී පවත්වා ඇත..



ටැංකි රථ රියදුරන් සඳහා පුහුණු පාඨමාලාව

ආරක්ෂාකාරී රියපැදවීම සහ මාර්ගවල රියපැදවීමේ විනය පිළිබඳව 2016 දී ටැංකි රථ රියදුරන්ට පුහුණු පාඨමාලා කිහිපයක් **සීපීඑස්ටීඑල්** විසින් පවත්වා ඇත.



පවිත්‍ර කිරීමේ සේවා සේවකයින්ට වියලි සලාක පරිත්‍යාග

සීපීඑස්ටීඑල් හි පවිත්‍ර කිරීමේ සේවා වල නියැලි අඩු ආදායම් ලාභී ජනතාවට වියලි සලාක බෙදාදුනි.



මහරගම පිළිකා රෝහලේ ලමා අංශයට පරිත්‍යාග

සමාජ වගකීම් කාර්යවල කොටසක් ලෙස, "මහරගම පිළිකා රෝහල" හි නේවාසික රෝගී දරුවන් බැලීමට ගොස් ඔවුන්ගේ මුහුණේ සිනහවක් ඉපිදවීමට, ඉතාම වැදගත් කොටස වූ වහාම අවශ්‍යකරන බෙහෙත් සහ අනෙකුත් ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කලෙමු..



ලුණුගම්වෙහෙර ශිෂ්‍යයනට සහ දහම්පාසැල් වලට පරිත්‍යාග

ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ වෙසෙන වරප්‍රසාද අඩු දරුවන්ට පොත් සහ වෙනත් ලිපි ද්‍රව්‍ය ප්‍රදානය කෙරිනි. ඊට අමතරව දහම්පාසැල් වලට ලී බඩු සහ දහම්පාසැල් ගුරුවරියන්ට සාරි ද ප්‍රදානය කෙරිනි.



ගංවතුරින් හානියට පත්වූ ගෙවල් ශුද්ධකිරීම

සේවකයන්ගේ ගංවතුරින් හානියට පත්වූ නිවාස පවිත්‍ර කිරීමට **සීපීඑස්ටීඑල්** ආයතනය සහාය ලබාදී ඇත.

.

ගුණාත්මකභාවය සහතික කිරීම අපගේ වගකීමයි



සංස්ථාපිත යහපාලනය



සංස්ථාපිත යහපාලනය

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කළමනාකරණයේ ගිණුම්කටයුතුභාවය ශක්තිමත්කරණ සහ සංවිධානයට මහජන විශ්වාසය ගොඩනගන යහපාලනයට කැපවී ඇත. ආයතනික යහපාලනයේ අරමූණ වන්නේ සමාගමේ දිගුකල් සාර්ථකත්වය ගෙනදිය හැකි ඵලදායී, ව්‍යවසායාත්මක සහ විචක්ෂණ කළමනාකරණය පහසු කිරීමයි. එයට ව්‍යවස්ථා, නීතිරීති සහ ස්වයං ව්‍යවහාරයන් ඇතුලත්ය..

ශ්‍රී ලංකාවේ බණිජතෙල් නිෂ්පාදිත ගබඩාකිරීම සහ බෙදාහැරීමට ප්‍රධාන පහසුකම් සපයන්නා ලෙස, ආර්ථික කාර්යක්ෂමතාවය, නොනැසී පවතන වර්ධනය සහ මූල්‍ය ස්ථාවරත්වයට උරදීම පෙරදැරි කරගෙන සංවිධානයේ සහ ඉලක්ක සහ අරමුණු සපුරාගැනීමට යහපාලන මූලධර්ම ව්‍යවහාර කිරීමට සංවිධානය සහතිකවෙයි..

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත්කොට ඇති ආයතනික යහපාලනය පිළිබඳ හොඳම නීති මාලාව සහ 2003 දී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව මගින් නිකුත් කල යහපාලනය සඳහා වූ ආයතනික මගපෙන්වීම් වල අවශ්‍යතාවයන් සංවිධානය ස්ථිරව පිළිපදියි.

අධ්‍යක්ෂ මණ්ඩලය

මව් සමාගම් විසින් පත්කරන අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් **සිපිඑස්ටිඑල්** පාලනය වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය මහා භාණ්ඩාගාරයේ (මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ) නියෝජිතයෙකු ඇතුළුව 8 කි. සභාපති සහ කළමණාකරණ අධ්‍යක්ෂ හැර අනෙක් සියළුම අධ්‍යක්ෂකවරු විධායක නොවන අධ්‍යක්ෂකවරුය.

යලි පත්වීමට යටත්ව අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික ධුරකාලයක් නොමැත. තීරණ ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය ආයතන කළමණාකරනයෙන් අදාල තොරතුරු ලබාගන්නා අතර, අවශ්‍ය වුවහොත් බාහිර වෘත්තිකයන්ගෙන් තොරතුරු ලබාගනී..

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

ආයතනික උපක්‍රමික මගපෙන්වීම සමග කළමණාකරන කාර්යසාධනය විමර්ෂණය කිරීමට සහ බදු, ශ්‍රමය, පරිසරය, සම අවස්ථා, සෞඛ්‍යය සහ ආරක්ෂණය ඇතුලු අදාල නීතිරීති වලට අනුකූලතාවය සහතික කරමින් මනෝමූලික සහ ස්වාධීන විනිශ්චයන් කරමින් කොටස් හිමියන්ට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලඟාකරදීමට අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන වශයෙන්ම වගකිව යුතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල උප කමිටු රැස්වීම් වලට සහභාගි වෙමින් ද චක්‍රලේඛ යෝජනාවලි මගින් තීරණ ගනිමින් ද අධ්‍යක්ෂවරු සංවිධානයේ කටයුතු වලට කැපවේ.

සංවිධානයේ ආචාර ධර්ම මාතෘය පිහිටුවීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයෙන් පමණක් නොව ප්‍රධාන තනතුරු වලට පත්කිරීම් සහ පත්කිරීම් බලාගැනීම, උසස් කිරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස පොදුවේ කළමණාකරනය තුලින් ද සංවිධානයේ දිගුකල් යහපත සලසන දිගුකල් බැඳීම් සම්බන්ධයෙන් විශ්වාසනීය සහ භාරධූර කලහැකි බවට පත්කිරීමට ප්‍රධාන කාර්යභාරය ඉටු කරයි. ප්‍රධාන ක්‍රියාකාරී සැලසුම්, අවදානම් කළමණාකරන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි, වාර්ෂික අයවැය සහ ව්‍යාපාර සැලසුම්, ආයතනික ක්‍රියාකාරිත්වය විමර්ශණය කොට අනුමැතිය ලබාදීම සහ ප්‍රධාන ප්‍රාග්ධන වියදම්, අත්පත්කරගැනීම් සහ විවේච්ඡනය කිරීම් වලට තවදුරටත් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නිතිපතා මාසිකව පැවැත්වෙන අතර විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍ය වූ විට කැඳවනු ලැබේ. ඇරයුම් කිරීම් මත ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන්ද රැස්වීම් වලට සහභාගි වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත් න්‍යාය පත්‍රයකට අනුව පවත්වන අතර රැස්වීම් වලට පෙර අදාල විස්තීර්ණ පසුබිම් තොරතුරු ආයතන කළමණාකරනය විසින් අධ්‍යක්ෂ වරුන්ට ලබාදෙයි. සමාලෝචිත වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දහතුනක් පැවැත්විනි.

අනුකූලතාව සහ විනිවිදභාවය

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් තම සියලුම ගණුදෙනු වලදී විනිවිදභාවය පවත්වාගැනීමට කැපවී සිටී. ගිණුම්කටයුතුභාවය සහතික කිරීමට නව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත (SLFRS/LKAS) සහ අදාල රෙගුලාසිවලට සංවිධානය අනුකූලතාව දක්වයි. සංවිධානයේ දෛනික කටයුතු වලට අභ්‍යන්තර පාලන අනුකූලතා කරුණු සංකලනය කොට ඇත. 1971 අංක 38 දරණ මූල්‍ය පනත අනුව මූල්‍ය වාර්තා වාර්ෂිකව ප්‍රසිද්ධ කරනු ලබන අතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරේ. මූල්‍ය පනත හා අනුකූලතාව දක්වමින් විගණකාධිපති සංවිධානයේ භාහිර විගණනය කරයි.

ආයතන කළමණාකරනය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කලට අනුමත කරන ලද උපක්‍රමික විධානයන්, ප්‍රතිපත්ති සැකසුම් සහ ක්‍රියාපටිපාටි මත පදනම් ව සංවිධානයේ දෛනික කටයුතු සභාපති/කළමණාකරන අධ්‍යක්ෂ විසින් කරනු ලැබේ. **සීපීඑස්ටීඑල්** හි මෙහෙයුම් උප කාණ්ඩ වලට, එනම්, කොලොන්නාව නිමාවේ මෙහෙයුම්, මුතුරාජවෙල පර්යන්තයේ මෙහෙයුම්, කොළඹ වරායේ තෙල් පහසුකම් කාර්යාලය සහ දිවයින පුරා ඇති තොග ගබඩා මෙහෙයුම් ලෙස බෙදිය හැක. , මුතුරාජවෙල පර්යන්තයේ ප්‍රධානියා පර්යන්ත කළමණාකරු (මුතුරාජවෙල) ය. මෙහෙයුම් කළමණාකරු (තෙල් පහසුකම්) කොළඹ වරායේ තෙල් පහසුකම් කාර්යාලයේ ප්‍රධානියා ය. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) ගේ හා බෙදාහැරීම් කළමණාකරුගේ සුපරීක්ෂණය යටතේ තොග තෙල් ගබඩා අධිකාරීවරු ලංකා තොග ගබඩා ප්‍රධානීන් වේ..

සභාපති/කළමණාකරන අධ්‍යක්ෂ වරයාට සංවිධානයේ දෛනික ක්‍රියාකාරීත්වය සඳහා සහාය වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හෝ කළමණාකරු කොලොන්නාව නිමාවේ එකිනෙක අංශයේ ප්‍රධානියා වේ. ආයතන කළමණාකරුවන් ඉතා හොඳින් අධ්‍යයන උපාධි හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් ක්ෂේත්‍රයේ අදාල වෘත්තීය සුදුසුකම් ලබා ඇත.

විගණන කමිටුව

විගණන කමිටුවේ සංයුතිය

සීපීඑස්ටීඑල් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගෙන් සැදි සාමාජිකයන් 04 දෙනෙක් ගෙන් විගණන කමිටුව සමන්විතවේ. විගණන කමිටුවේ සංයුතිය හා කාර්යයන් වාර්ෂික වාර්තාවේ 38 වන පිටුවේ දක්වා ඇත.

තොග සමාලෝචන කමිටුව

සීපීඑස්ටීඑල් හි කාර්ය මණ්ඩලය, බණිජ තෙල් සංස්ථාව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගමේ නියෝජිතයන් සමග සතිපතා පැවැත්වේ. තොග තත්වය සමාලෝචනය කොට අවශ්‍යතා මාස තුනක අනාගත කාලයක් සඳහා කලින් සැලසුම් කෙරේ. රටේ අවශ්‍යතා පිරිපහදු නිෂ්පාදන සමග සැලකිල්ලට ගෙන ආනයනය කලයුතු ප්‍රමාණය හඳුනා ගන්නා අතර ලබාගතහැකි ටැංකි ගබඩා ධාරිතාවය සැලකිල්ලට ගෙන නැව්ගත කිරීම් සැලසුම් කෙරේ. නිතිපතා කරන ආසන්න විමර්ශන මගින් සංස්ථාවට රටේ බාධාවකින් තොර ඉන්ධන සැපයුම සහතික කිරීමට හැකිය.

තොරතුරු තාක්ෂණ හැසිරවීම් කමිටුව

සංවිධානයේ උපක්‍රමික ඉලක්ක අනුව ප්‍රධාන තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සමාලෝචනය, විමර්ශනය සහ ප්‍රමුඛතා දක්වන පරිපාලනමය මණ්ඩලය එයයි. බණිජ තෙල් සංස්ථාව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගමේ සහ **සීපීඑස්ටීඑල්** හි සාමාජිකයන්ගෙන් කමිටුව සමන්විතවන අතර සියලුම පාර්ශවකරුවන්ගේ යහපත පිණිස තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගි වෙමින් **සීපීඑස්ටීඑල්** හි පොදු තොරතුරු තාක්ෂණ කේන්ද්‍රස්ථානය සංවර්ධනයට සහ නඩත්තුවට ධනාත්මකව දායක වේ.

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

ජාතික ප්‍රසම්පාදන ඒජන්සිය නිෂ්පාදිත, භාණ්ඩ, සේවා සහ වැඩ මිලටගැනීම සඳහා මගපෙන්වීම් මාලාවක් නිකුත්කොට ඇත. අදාල තාක්ෂණ ඇගයීම් කමිටුව සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විනිවිද භාවය තහවුරු කිරීමට, ප්‍රමාදනාවයන් අඩුකිරීමට සහ සමාගමට මූල්‍යමය වශයෙන් වඩාත් වාසිදායක ගුණාත්මක වශයෙන් හොඳම සේවා සහ සැපයුම් ලබාගැනීමට ජාතික ප්‍රසම්පාදන ඒජන්සිය නිකුත් කල මගපෙන්වීම් මාලාව යටතේ ක්‍රියාත්මක වේ. **සීපීඑස්ටීඑල්** හි සභාපති/කළමණාකරන අධ්‍යක්ෂ වරයා කමිටුවේ ප්‍රධානියා වන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මෙහෙයුම් සහ බණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජිතයකුගෙන් කමිටුව සමන්විත වේ.

මූල්‍ය හෙළිදරව්කිරීම්

මූල්‍ය වාර්තා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත්කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු වේ. මූල්‍ය වාර්තා SLFRS/LKAS ලෙස දක්වා ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත (SLAS) හා අනුකූලව පිළියෙල කරන අතර විගණන කමිටුව මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත හා අනුකූලතාව දක්වන ප්‍රමාණය, ගිණුම් ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සහ වෙනස්වීම් සහ වැදගත් නිශ්චයකිරීම් වලට අදාල කරුණු සමාලෝචනය කොට කළමණාකරනය සහ බාහිර විගණකවරු සමග සාකච්ඡා කර ඇත.

අභ්‍යන්තර පාලන

මෙහෙයුම්වල ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය සාක්ෂාත් කරගැනීම, මූල්‍ය වාර්තා මත රඳාසිටිය හැකිබව සහ අදාල නීති හා රෙගුලාසි සමග අනුකූලතාව දැක්වීම පිළිබඳව ප්‍රමාණවත් සහතිකවීමක් සැපයීම සඳහා

සමාගම හොඳ සහ ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් තහවුරු කරයි. මූල්‍ය සහ ගිණුම් තොරතුරුවල සංකලනිත භාවය සහතික කර, මෙහෙයුම් හා ලාභදායී ඉලක්ක ලඟාකර දෙමින්, කළමනාකරන ප්‍රතිපත්ති සංවිධානය පුරා පතුරුවා හරියි. සාධාරණ කාල පරිච්ඡේදයක් තුලදී වැරදි හෝ විශමතාවයන් ඉදිරිපත්වීම හෝ සොයාගැනීම පිළිබඳ නිරපේක්ෂ නොව සාධාරණ සහතිකයක් පමණක් අභ්‍යන්තර පාලන පද්ධතිය තුලින් ලබාගත හැකිබව කියාසිටීම වැදගත් ය.

සීපීඑස්ටීඑල් හි ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන පද්ධතිය තුල සංවිධානය කාර්ය්‍යක්ෂමව මෙහෙයවෙන බව අභ්‍යන්තර විගණන කාර්යය මගින් සහතික වේ.

අභ්‍යන්තර විගණනය

සංවිධානයේ පනවා ඇති ක්‍රියාපටිපාටි, නියමයන් සහ රෙගුලාසි අනුව සංවිධානය තුල නිසි පාලන පද්ධතියක් පවත්වාගෙන යාමට ඇගයීමේ සහ වාර්තාකිරීමේ අරමුණ ඇතිව පහත දැක්වෙන අවකාශය තුල . අභ්‍යන්තර විගණන කාර්ය්‍ය කටයුතු කරයි;

I. දැනට ඇති නියමයන් සහ රෙගුලාසි අනුව සියලුම ව්‍යාපාරික ගණුදෙනු කිරීමට පෙර නිසිලෙස අනුමැතිය ලබාගන්නා බව සහතික කිරීම.

II. ප්‍රාථමික වාර්තා මෙන්ම SAP තුලත් සියලු ගිණුම් තොරතුරු නිවැරදිව පවත්වාගන්නා බව සහ කාර්ය්‍යක්ෂම කළමනාකරනයක් සහතික කිරීම සඳහා අදාල සංඛ්‍යාන සහ පාලන දත්ත නිසිලෙස නිර්මානය කල බව සහතික කිරීම.

III. මූල්‍ය වාර්තා ව්‍යාපාර ආයතනයේ තත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙනහැර දක්වන බව සහතික කිරීම.

IV. ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන පද්ධතිවල කාර්‍යක්ෂමතාව තක්සේරු කිරීම.

V. අභ්‍යන්තර විගණන ඒකකය පොදුවේ පද්ධති පදනම් කරගත් ඵලඹුමක් යොදාගතයුතු අතර මූලික අරමුණු පහත දේ සමාලොචනය හා ඇගැයීම විය යුතුය;

- ප්‍රතිපත්ති අරමුණු සාක්ෂාත්කර ගැනීමේ දී අංශය විසින් යෙදවූ වැඩසටහන් සහ අනෙකුත් ක්‍රියාවන් සාර්ථක වී ඇති ප්‍රමාණය මැනීමට කළමනාකරනය විසින් භාවිතා කරන අංශයක මෙහෙයුම් පාලනය සඳහා අදහස්කර ඇති පද්ධති සහ ක්‍රියාපටිපාටි (මූල්‍ය, කළමනාකරන ආදී) නිර්මානය සහ ක්‍රියාත්මක වීම.
- තීරණ ගැනීම සහ ගිණුම්කටයුතුභාවය සඳහා සපයන තොරතුරුවල ප්‍රමාණවත් බව, විශ්වාසකටයුතු බව සහ සංකලනිත බව සහ එම තොරතුරු භාවිතකරන ප්‍රමාණය.
- නීතිරීති සහ පනවා ඇති අනෙකුත් අවශ්‍යතා, කළමනාකරන සැලසුම්, ක්‍රියාපටිපාටි හා ප්‍රතිපත්ති සමග අනුකූලභාවය දක්වන ප්‍රමාණය.
- වත්කම් අත්කරගැනීම සහ ඉවත්කිරීම, දූෂණ, වැරදි ක්‍රියා සහ අක්‍රමිකතා නිසා පැන නගින ඒවා ඇතුලුව ඇල්ම සහ පාඩුවලින් ආරක්ෂා කිරීම.
- ආර්ථික සහ කාර්‍යක්ෂම ලෙස සම්මත් භාවිතය සඳහා සහ නාස්තිය වැලක්වීමට ඇති වැඩපිලිවෙලවල්.
- සමහර අවස්ථාවලදී ගනුදෙනු පරීක්ෂා කිරීමේ ඵලඹුමක් යොදාගැනීම වඩා සුදුසුවිය හැක.

සමාගමේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව

2007 අංක 7 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදනයන්ට අනුව පිළියෙළ කල 2016 දෙසැම්බර් 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ කටයුතු පිළිබඳව වූ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන්නේ සතුටිනි.

මේවා අධ්‍යක්ෂවරුන් 2018 මාර්තු 7 දින අනුමත කරන ලදි.

ප්‍රධාන කටයුතු

සමාගමේ ප්‍රධාන කටයුතු වන්නේ ශ්‍රී ලංකාවේ බණිජ තෙල් තොග ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ කටයුතු පහසු කිරීම සඳහා පිහිටුවන ලද පොදු භාවිත පහසුකම් සහ 2003 ඔක්තෝබර් 13 දිනැති අංක 1318/8 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති තෙල් පර්යන්තය, ගබඩා පහසුකම්, නළ මාර්ග සහ ඉන්ධන ප්‍රවාහන වාහන යනාදියෙන් සමන්විත ලංකා බණිජතෙල් සංස්ථාවේ ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ යටිතල පහසුකම් අයිතිකාරත්වය සහ ක්‍රියාත්මකකිරීමත් ලංකා බණිජතෙල් සංස්ථාව විසින් භුක්තිවිඳින මුතුරාජවෙල සහ කොලොන්නාවේ ස්ථාපනයන්, දිවයින පුරා පිහිටි තොග ගබඩා සහ අදාල පහසුකම්, කොළඹ වරායේ පිහිටි තෙල් පයසුකම්, භාවිතා කිරීමට අයිතිය සහ/හෝ බදු අයිතිය, එකස්ථාන පාවෙන බෝයාව සිට මුතුරාජවෙල ස්ථාපනයනය දක්වා වූ, කොළඹ වරායේ සිට කොලොන්නාව ස්ථාපනය දක්වා නළමාර්ගය, ශාඛා සිට පාරිභෝගිකයන්ගේ සීමා දක්වා, ගාලු වරායේ සිට මාගාල්ල තොග ගබඩාව දක්වා නළමාර්ගය, ඉහත සඳහන් කල ස්ථාපන සහ තොග තෙල් ගබඩා තුල පිහිටි නළමාර්ගයන් අයිතිය සහ/ හෝ කාර්යයන් සහ/ හෝ ලංකා බණිජතෙල් සංස්ථාවේ අයිතින් ය.

මෙහෙයුම් සමාලෝචනය සහ මූල්‍ය ඵලදායීතා දැක්වීම්

රු. බි. 1.7 ක ශුද්ධ ලාභයක් සමග රු. බි. 12.6 අයභාරයක් මෙහෙයුම් වලින් පෙන්වා ඇත.

විස්තරය	31-12-2016 රු.	31-12-2015 රු.
පිරිවැටුම	12,663,444,509	11,687,263,147
බදු පෙර ඉපයුම්	2,330,073,120	1,715,646,470
බදු පසු ලාභය / (අලාභය) (PAT)	1,738,629,426	1,373,983,761

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2016 දෙසැම්බර් 31 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 7,500,000,000/=. කොටස් අයිතිය බෙදියාම පහත දැක්වෙන පරිදිය.

	සාමාන්‍ය කොටස්
ලංකා බණිජතෙල් සංස්ථාව	500,000,000
ලංකා අයිඕසී ලිමිටඩ්	250,000,000

දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ වල වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 10 යටතේ දක්වා ඇත.

ලාභාංශ

2016 දෙසැම්බර් 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා කොටසකට රු. 0.54 අතුරු ලාභාංශයක් අධ්‍යක්ෂවරු යෝජනා කරති.

ආයතනික පරිත්‍යාග

වර්ෂය තුලදී රු. 5,657,434/- ක පරිත්‍යාග සහ ශිෂ්‍යත්ව ගෙවීම් සමාගම සිදුකර ඇත.

2016 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂවරුන්

2016 දෙසැම්බර් 31 දිනට සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි විය;

දේවානමුනි චමින්ද ඡෙහාන් **සෙනෙවිරත්න**

දුමින්ද වීරසිංහ **රාජපක්ෂ**

ටර්පින් ගුනපාල **ජයසිංහ**

කකුල්තොටුවගේ දෝන රෝස්මේරි **ඔල්ගා**

ලලිත් චන්දන කුමාර **ලියනගේ**

එෂාන් ප්‍රියදෙව් **පෙරේරා**

ෂ්‍යාම් **බෝරා**

අනුජ් **ජයින්**

රන්දිර් **සිං**

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

අධ්‍යක්ෂවරු ලබාගත් ගෙවීම්. මූල්‍ය ප්‍රකාශවල විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

සම්බන්ධතා ලේඛනය

2007 අංක 7 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදනයන්ට අනුව, සමාගම සම්බන්ධතා ලේඛනයක් පවත්වාගෙන යයි. 2007 අංක 7 දරණ සමාගම් පනතේ 192(2) වගන්තියේ ප්‍රතිපාදනය කර ඇති ආකාරයට සියලුම අධ්‍යක්ෂවරු හෙළිදරව් කර ඇත. සමාලෝචිත වර්ෂයේදී අදාල සටයන් සම්බන්ධතා ලේඛනයේ තබා ඇත..

ව්‍යවස්ථාපිත ගෙවීම්

දැනුමේ සහ විශ්වාසයේ තරමට, රජය සහ සේවකයින් සම්බන්ධයෙන් සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවාදමා හෝ පොත්වල ප්‍රතිපාදනය කර ඇති බවට අධ්‍යක්ෂවරු තෘප්තිමත් වෙති.

අබණ්ඩ පැවැත්ම

ව්‍යාපාර මෙහෙයුම් කරගෙන යාමට සමාගමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂවරුන්ට විශ්වාසය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා අබණ්ඩ පැවැත්ම පදනම යොදා ගැනීම යෝග්‍ය බව අධ්‍යක්ෂවරු සලකා ඇත.

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

සමාගම වෙත ප්‍රමාණවත් බලපෑම් ඇතිකරන, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයකල යුතු ගැලපීම් අවශ්‍ය කරන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 30 යටතේ දක්වා ඇති ඒවා හැර,.ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවූ වැදගත් සිදුවීම් නොමැත.

විගණකවරු

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව සමාගමේ විගණකවරු වශයෙන් විගණකාධිපති හෝ ඔහු නම්කල අයෙකු සමාගම පත්කිරීම අවශ්‍යවේ.

2016 දෙසැම්බර් 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණය අර්නස්ට් යං වරලත් ගණකාධිකාරී සමාගමේ සහයෝගය ඇතිව විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් කරගෙනයන ලදි. මූල්‍ය ප්‍රකාශවල විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ විගණකවරුන්ට ගෙවනලද ගාස්තු හෙළිදරව් කර ඇත.

අධ්‍යක්ෂවරුන් දැනුවත්ව සිටින පරිදි, ඉහත හෙළිදරව් කර ඇති පරිදි හැර, විගණකවරුන් සමාගම සමග කිසිම (විගණකවරුන් වශයෙන් හැර) සම්බන්ධතාවයක් නොමැත. විගණකවරුන්ට සමාගමේ හෝ සමූහයේ සමාගම් වල අයිතියක් නොමැත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආචාර ධර්ම මාලාව අනුව ඔවුන් ස්වාධීන බවට තහවුරුකර ඇත.

මහා සභා රැස්වීම

සමාගමේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් 2018 මාර්තු 15 දින **සිපිඑස්ටිඑල්** හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේ දී පැවැත්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්

ධම්මික රණතුංග
සභාපති

කේ ඩී ආර් ඔල්ගා
අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

ACCOUNTING SYSTEMS SECRETARIAL SERVICES (PRIVATE) LIMITED - PV 4190

Accounting Systems Secretarial Services (Private) Limited
Secretaries to the Company

සමාගමේ ලේඛ්මිවරු

විගණන කමිටු වාර්තාව

සංයුතිය

සීපීඑස්ටීඑල් හි විගණන හා කළමණාකරන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කල පහත දැක්වෙන විධායක නොවන අධ්‍යක්ෂවරු 03 දෙනාගෙන් සමන්විත වේ.

කේ ඩී ආර් ඔල්ගා මිය (භාණ්ඩාගාර නියෝජිත)	-	සභාපතිනි
අනුජ් ජයින් මහතා (ලංකා අයි ඕ සී නියෝජිත)	-	සාමාජික
ටී ජී ජයසිංහ මහතා (ලංකා බණිජතෙල් සංස්ථාවේ නියෝජිත)	-	සාමාජික

රාජ්‍ය වාණිජ ආයතනවල විගණන කමිටු පවත්වා ගෙනයාමට අදාල ව නිකුත් කර ඇති භාණ්ඩාගාර චක්‍රලේඛ වල නියමකර ඇති වගකීම්, බලතල සහ විශේෂිත යුතුකම් වල අවකාශය ආවරණය වන පරිදි විගණන කමිටු විධිපත්‍රය සකස්කොට ඇත.

විගණන කමිටුවේ කාර්යයන්

කමිටුව මූල්‍ය වාර්තාකිරීමේ ක්‍රියාවලිය, අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි අභ්‍යන්තර පාලන, පරීක්ෂා කරන අතර බාහිර විගණකවරු සහ අභ්‍යන්තර විගණන අංශය විසින් මතුකරන ලද වැදගත් ගිණුම්කරන සහ වාර්තාකිරීමේ ගැටලු මෙන්ම සමාගමේ මෙහෙයුම් සහ එයින් මූල්‍ය ප්‍රකාශවලට ඇතිවිය හැකි බලපෑම අවබෝධකර ගැනීමට මෑතදී නිකුත්කරන ලද වෘත්තීයස හ රෙගුලාසිමය මතප්‍රකාශකිරීම් සමාලෝචනය කරයි.

රැස්වීම්

ඉහත සඳහන් කර ඇති පරිදි පවරා ඇති කාර්යයන් කරගෙන යාමට සමාලෝචිත වර්ෂය තුලදී විගණන කමිටුවේ රැස්වීම් පහක් (5) පැවැත්විය.

වර්ෂය තුලදී විගණන කමිටුවේ රැස්වීම් වලට සහභාගී වූ සාමාජිකයන් පහත දැක්වේ.

අනු අංකය.	දිනය	කමිටුවේ ශක්තිය	සහභාගී වූ සාමාජිකයන් ගණන	සහභාගී වූ සාමාජිකයන්ගේ නම්
01.	04.05.2016	03	03	කේ ඩී ආර් ඔල්ගා මිය. අනුජ් ජයින් මහතා ටී ජී ජයසිංහ මහතා
02.	13.06.2016	03	02	කේ ඩී ආර් ඔල්ගා මිය. අනුජ් ජයින් මහතා
03.	09.08.2016	03	02	කේ ඩී ආර් ඔල්ගා මිය. අනුජ් ජයින් මහතා
04.	16.08.2016	03	02	කේ ඩී ආර් ඔල්ගා මිය. අනුජ් ජයින් මහතා
05	25.11.2016	03	02	කේ ඩී ආර් ඔල්ගා මිය. අනුජ් ජයින් මහතා

විගණන කමිටුවේ කාර්යභාරය

සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට උපක්‍රමික ගැටලු පිළිබඳව නිර්දේශ කිහිපයක් විගණන කමිටුව සකස්කර ඇත.

කළමණාකරණය, බාහිර සහ අභ්‍යන්තර විගණකවරු සමග අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් භාවය පිළිබඳ සමාලෝචනය

මූල්‍ය ප්‍රකාශවල අනුකූලතාවය, විනිවිදභාවය සහ විශ්වාසවන්ත භාවය සහතික කරමින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සහතික කිරීමට මූල්‍ය වාර්තාකිරීමේ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම.

වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන සමාලෝචනය

කළමණාකරන ලිපිය සහ අභ්‍යන්තර විගණන වාර්තා මත පදනම්ව අවදානම් කළමණාකරන ක්‍රියාවලිය විස්තීර්ණ සහ කරගෙන යන බව සහතික කරමින්, පිළිගතහැකි මට්ටමකට අවදානම අඩුකිරීම සඳහා අවදානම සහ පිලියම් කටයුතු හඳුනාගැනීම.

ඉහල මාත්‍රයෙන් සිට ජනිතකරමින් ශක්තිමත් සහ පළදායී අභ්‍යන්තර පාලන සඳහා සංවිධානය පුරා කැපවීමක් ඇතිකිරීම.

නීති සහ රෙගුලාසි, ආචාර ධර්ම, සම්බන්ධතා ගැටුම, අකටයුතු හෝ වංචා පිළිබඳව ආයතනික ප්‍රතිපත්ති සමාලෝචනය.

තත්වය, ප්‍රගතිය නව සංවර්ධන පිළිබඳව කළමණාකරණයට අබන්ඩව සංනිවේදනය කිරීම.



කේ ඩී ආර් ඔල්ගා
සභාපතිනි
විගණන කමිටුව



සම්මාන සහ ප්‍රදානයන්

අපගේ කැපවීම නැවත තහවුරුකරමින් මූල්‍ය වර්ෂය පුරාම ගෞරව ප්‍රදානයන් කිහිපයක් සමග අපව පිළිගෙන ඇත.



අපගේ කැපවීම නැවත තහවුරුකරමින් මූල්‍ය වර්ෂය පුරාම ගෞරව ප්‍රදානයන් කිහිපයක් සමග අපව පිළිගෙන ඇත.

ලංකා ජාතික කර්මාන්ත මණ්ඩල අබන්බව 15වන වරටත් සංවිධානය කල ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලයේ කර්මාන්ත අනර්ගත්ව සම්මාන උත්සවයේදී අති විශාල කර්මාන්ත බාණ්ඩයේදී ජාතික ලෝකඩ සම්මානය සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් දිනාගත්තේය.

සමාජ සංවාදය හා වැඩබිමෙහි සහයෝගීතාව පිළිබඳ ලෝකඩ සම්මානය

කම්කරු හා වෘත්තීය සමිති සම්බන්ධතා අමාත්‍යාංශයේ කම්කරු දෙපාර්තමේන්තුවේ වැඩබිමෙහි සහයෝගීතා ඒකකය සංවිධානය කල සමාජ සංවාදය හා වැඩබිමෙහි සහයෝගීතාව පිළිබඳ විශාල පරිමාන සේවා අංශයේ ලෝකඩ සම්මානය සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් දිනාගත්තේය.


SD EXCELLENCE AWARDS
Social Dialogue & Workplace Cooperation Awards 2016
Service Sector
Large Scale
Bronze Award
CEYLON PETROLEUM STORAGE TERMINAL LIMITED
KOLONNAWA
Organized by
Social Dialogue & Workplace Cooperation Unit
Human Resource Development Division
Department of Labour
Ministry of Labour and Trade Union Relations

මූල්‍ය තොරතුරු

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. | පිඵට/ඒ/සිපිඑස්ටිඑල්/06/16/4 මඟේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date | 2017 සැප්තැම්බර් 29

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල් ලිමිටඩ් හි
කොටස් හිමියන් වෙත

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල් ලිමිටඩ් සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල් ලිමිටඩ් සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල (3 සිට 37 දක්වා පිටුවල දක්වා ඇති පරිදි) සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය සිදුකරන ලදී. මෙම විගණනය කරගෙන යාමේදී වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක සහය මා විසින් ලබා ගැනුනි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. සදාචාර ධර්මවල අවශ්‍යතාවන්ට අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ නහවිරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 naggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාන්මක කිරීම් විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

(අ). සීමාසහිත ලංකා බනිජතෙල් සංස්ථා සකසුරුවම් සමිතිය (සකසුරුවම් සමිතිය) සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල් ලිමිටඩ් හි සේවකයින්ට (සාමාජිකයින්ට) විශ්‍රාම ප්‍රතිලාභ සහ වෛද්‍ය ප්‍රතිලාභ ගෙවයි. සකසුරුවම් සමිතිය එහි සාමාජිකයින් විශ්‍රාම යන අවස්ථාවේදී සේවය කල සෑම අවුරුද්දක් සඳහාම මාස භාගයක අතිරේක වැටුපක් ගෙවනු ලබයි. ඒ අනුව සකසුරුවම් සමිතිය සමාගමේ සේවකයන්ට විශ්‍රාම ප්‍රතිලාභ ලබාදෙන සැලසුමක් වන පතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19, විශ්‍රාම ප්‍රතිලාභ, අනුව විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් ලෙස සුදුසුකම් ලබයි. සමාගම් විසින් ඉහත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 අනුව ආයුගණන ක්‍රමයට අගයකර ගිණුම්ගතකර නොනිබුණි.

(ආ). වෙළඳ හා අනෙකුත් ලැබියයුතු දෑ තුළ ලංකා බනිජතෙල් සංස්ථාවෙන් ලැබියයුතු රු. මිලියන 4,857.2 ක් අන්තර්ගතවේ. ලංකා බනිජතෙල් සංස්ථාවෙන් ලද තහඩුරු කිරීම් අනුව ඉහත වටිනාකම් තුළ රු. මිලියන 652 (2015: රු. මිලියන 336) ක එකඟ නොවූ ශේෂයක් නිබුණද හානිකරණ දලාභ ලෙස වෙන්කර නිබුණේ රු. මිලියන 163.5 (2015: රු. මිලියන 165.5) ක් පමණි. ඒ අනුව හානිකරණ අලාභය රු. මිලියන 489 (2015: රු. මිලියන 173) කින් අඩුවෙන් දක්වා තිබේ.

(ඇ). 2017 සැප්තැම්බර් 07 දින පාර්ලිමේන්තුවේ සම්මතකරගන්නාලද දේශීය ආදායම් පනත් කෙටුම්පත අනුව 2018 අප්‍රේල් 01 දින සිට සමාගමට ඇදාළ බදු අනුපාතිකය සියයට 28 වේ. ගරු කථානායකතුමාගේ සහතිකය ලබාදීමෙන් පසු එකී කෙටුම්පතේ විධිවිධාන බලාත්මක

වනු ඇත. පහත් කෙටුම්පතේ විධිවිධාන හේතුකොටගෙන ඇතිවියහැකි බලපෑම් මෙම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නැත.

තත්ත්වාගණනය කරන ලද මතය

තත්වාගණනය කල විගණන මතයට පදනම් යන ඡේදයේ දක්වා ඇති කරුණුවල බලපෑම් හැර, 2016 දෙසැම්බර් 31 දිනට සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල් ලිමිටඩ් සමාගමේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු නරන බව මා දරන්නා වූ මතය වේ.

වෙනත් කරුණු

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල් ලිමිටඩ් සමාගමේ මූල්‍ය ප්‍රකාශන වෙනත් විරලුන් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් විසින් විගණනය කර එම මූල්‍ය ප්‍රකාශන මත 2016 සැප්තැම්බර් 13 දින තත්ත්වාගණනය කරනලද මතයක් ප්‍රකාශකර තිබුණි.

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරණ සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත කරුණු දක්වමි.

අ. මතය සඳහා පදනම් හා විගණනයේ විෂය පථය හා සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

ආ. - තත්වාගණනය කල විගණන මතයට පදනම් යන ඡේදයේ දක්වා ඇති කරුණුවල බලපෑම් හැර විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

ජාත්‍යනුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ඒ/ක. එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

මූල්‍ය තත්ව ප්‍රකාශය
2016 දෙසැම්බර් 31 දිනට

වත්කම්	සටහන	2016	2015
		රු	රු
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	10	16,799,855,205	16,687,409,915
අස්පෘශ්‍ය වත්කම්	11	7,609,019	17,349,661
වෙනත් මූල්‍ය වත්කම්	14.1	441,724,050	390,385,357
		17,249,188,274	17,095,144,933
ජංගම වත්කම්			
තොග	12	413,049,408	328,836,430
වෙළඳ සහ වෙනත් ලැබියයුතු	13	6,021,067,151	7,203,170,013
වෙනත් මූල්‍ය වත්කම්	14.2	1,920,169,313	1,894,647,582
මුදල් සහ මුදල් හා සමාන දෑ	15.1	2,455,417,182	747,965,921
		10,809,703,053	10,174,619,946
මුළු වත්කම්		28,058,891,327	27,269,764,879
හිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	16	7,500,000,000	7,500,000,000
ප්‍රාග්ධන සංචිතය	16.1	979,000,000	979,000,000
රඳවාගත් ඉපයීම්		14,371,811,934	12,910,228,106
මුළු හිමිකම්		22,850,811,934	21,389,228,106
ජංගම නොවන වගකීම්			
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්	17	1,234,070,802	1,385,634,331
විලම්බිත බදු වගකීම්	8.1	1,005,757,215	608,969,586
පොලී සහිත ණය සහ ණය ගැනීම්	18	911,050,854	1,398,850,855
		3,150,878,871	3,393,454,772
ජංගම වගකීම්			
වෙළඳ සහ වෙනත් ගෙවියයුතු දෑ	19	1,311,033,498	1,649,445,903
පොලී සහිත ණය සහ ණය ගැනීම්	18	599,114,311	781,660,127
ගෙවියයුතු ආදායම් බදු		147,052,713	55,975,971
මුළු වගකීම්		2,057,200,522	2,487,082,001
මුළු හිමිකම් සහ වගකීම්		28,058,891,327	27,269,764,879

මෙම මූල්‍ය වාර්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූල වනබව සහතික කරමි.

නියෝජ්‍ය සමානයාධිකාරී - මූදල්

මෙම මූල්‍ය වාර්තා පිළියෙලකිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරනු ලැබුයේ

අධ්‍යක්ෂක

සභාපති/අධ්‍යක්ෂක

පිටු අංක 52 සිට 79 දක්වා ඇති සටහන් සහ ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය වාර්තා වලම අඩංගු කොටසක් වේ.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	2016 රු.	2015 රු.
ආදායම	3	12,663,444,509	11,687,263,147
සෘජු වියදම්		(6,661,689,016)	(6,415,412,679)
දළ ලාභය		6,001,755,493	5,271,850,468
වෙනත් මෙහෙයුම් ආදායම්	4	483,200,474	302,700,470
පරිපාලන වියදම්		(4,071,225,562)	(3,653,706,188)
විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්		(7,251,684)	(3,952,141)
මෙහෙයුම් ලාභය		2,406,478,721	1,916,892,609
මූල්‍ය ආදායම්	5.1	90,369,796	32,314,172
මූල්‍ය වියදම්	5.2	(166,775,397)	(233,560,311)
බදු පෙර ලාභය	6	2,330,073,120	1,715,646,470
ආදායම් බදු වියදම්		(591,443,694)	(341,662,709)
වර්ෂය සඳහා ලාභය	7.1	1,738,629,426	1,373,983,761
පසුකාල පරිච්ඡේදයන් වල දී ලාභ හෝ අලාභ වලට නැවත වර්ගීකරණය නොකලයුතු වෙනත් විස්තීර්ණ ආදායම්			
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත වූ ආයුගණක ලාභ	17	243,863,733	37,093,073
වෙනත් විස්තීර්ණ ආදායම් මත බදු		(33,409,331)	(3,709,307)
බදු අඩුකරන ලද වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම		210,454,402	33,383,766
බදු අඩුකරන ලද වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		1,949,083,828	1,407,367,527
කොටසක ඉපයුම	9.2	2.32	1.83

පිටු අංක 52 සිට 79 දක්වා ඇති සටහන් සහ ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය වාර්තා වලම අඩංගු කොටසක් වේ.

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිතය	රඳවාගත් ඉපයීම්	එකතුව
	රු.	රු.	රු.	රු.
2015 ජනවාරි 01 දිනට ශේෂය	7,500,000,000	979,000,000	11,502,860,579	19,981,860,579
වර්ෂය සඳහා ලාභය	-	-	1,373,983,761	1,373,983,761
වෙනත් විස්තීර්ණ ආදායම්	-	-	33,383,766	33,383,766
මුළු විස්තීර්ණ ආදායම	-	-	1,407,367,527	1,407,367,527
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	7,500,000,000	979,000,000	12,910,228,106	21,389,228,106
වර්ෂය සඳහා ලාභය	-	-	1,738,629,426	1,738,629,426
වෙනත් විස්තීර්ණ ආදායම්	-	-	210,454,402	210,454,402
මුළු විස්තීර්ණ ආදායම	-	-	1,949,083,828	1,949,083,828
ගෙවූ ලාභාංශ	-	-	(487,500,000)	(487,500,000)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	7,500,000,000	979,000,000	14,371,811,934	22,850,811,934

පිටු අංක 52 සිට 79 දක්වා ඇති සටහන් සහ ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය වාර්තා වලම අඩංගු කොටසක් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	2016	2015
		රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ (භාවිතා කරනලද) මුදල් ප්‍රවාහයන්			
ආදායම් බදු වියදම් වලට පෙර ලාභය		2,330,073,120	1,715,646,470
ගැලපුම්			
මූල්‍ය ආදායම	5.1	(90,369,796)	(32,314,172)
මූල්‍ය වියදම්	5.2	166,775,397	233,560,311
සේවක ණය හානිකරනය සඳහා ඉඩහැරීම්		2,203,697	1,416,487
තොග සහ වෙනත් ලැබියයුතු දෑ හානිකරනය සඳහා ඉඩහැරීම්		(41,257,622)	34,628,048
දේපල පිරියත හා උපකරණ විකිණීම මත අලාභ/ (ලාභ)	4	(51,245,219)	(8,312,102)
නිශ්චිත ප්‍රතිලාභ සැලසම් සඳහා වෙන්කිරීම		204,224,090	179,691,609
ක්ෂයවීම්	10.2	800,940,058	824,903,822
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	11.2	9,740,642	30,007,859
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලටපෙර මෙහෙයම් ලාභ (අලාභ)		3,331,084,367	2,979,228,331
තොගවල වැඩිවීම (අඩුවීම)		(33,513,691)	39,256,808
වෙළඳ සහ වෙනත් ලැබියයුතු වල වැඩිවීම (අඩුවීම)		1,172,661,197	1,070,517,763
වෙනත් මූල්‍ය වත්කම් වල වැඩිවීම (අඩුවීම)		(79,064,121)	(698,944,564)
වෙළඳ සහ වෙනත් ගෙවියයුතු වල වැඩිවීම (අඩුවීම)		(338,412,405)	(2,286,945,501)
මෙහෙයුම් වලින් උත්පාදනය වූ (භාවිතා කළ) මුදල්		4,052,755,347	1,103,112,837
ගෙවූ ආදායම් බදු		(136,988,654)	-
ගෙවූ මූල්‍ය වියදම්		(174,930,901)	(233,560,311)
ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ		(111,923,886)	(99,268,514)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහයන්		3,628,911,907	770,284,012
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
දේපල පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම්		(913,411,535)	(223,888,948)
දේපල පිරියත හා උපකරණ වලින් ලද මුදල්		51,271,409	8,312,102
මූල්‍ය ආදායම්	5.1	90,369,796	32,314,172
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ (භාවිතා කල) ශුද්ධ මුදල් ප්‍රවාහයන්		(771,770,330)	(183,262,674)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
ණය ආපසු ගෙවීම්		(773,504,627)	(1,061,751,794)
ගෙවූ ලාභාංශ		(487,500,000)	(687,500,000)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ(භාවිතා කල) ශුද්ධ මුදල් ප්‍රවාහයන්		(1,261,004,627)	(1,749,251,794)
මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම			
වර්ෂය මුල මුදල් හා මුදල් සමාන දෑ		747,965,921	1,910,196,377
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		2,344,102,871	**747,965,921**

පිටු අංක 52 සිට 79 දක්වා ඇති සටහන් සහ ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය වාර්තා වලම අඩංගු කොටසක් වේ.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. සංස්ථාපිත තොරතුරු

1.1 පොදු

2003 ඔක්තෝබර් 08 වන දින සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සීමාසහිත වගකීම ඇති සමාගමක් වන අතර සමාගම ශ්‍රී ලංකාව තුල නිත්‍යව ස්ථාපනය කර ඇත. සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව යන ස්ථානයෙහිය.

1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතු වල ස්වභාවය

වර්ෂය තුල, සමාගමේ මූලික ක්‍රියාකාරකම් වූයේ බණිජ තෙල් නිෂ්පාදිතයන් ගබඩා කිරීම සහ බෙදාහැරීමයි.

1.3 මව් අස්තිත්වය සහ අවසාන පාලන පාර්ශවය

අධ්‍යක්ෂ වරුන්ගේ මතය අනුව, සමාගමෙහි අවසාන මව් ව්‍යාපාරය වනුයේ ශ්‍රී ලංකාව තුල සංස්ථාපනය කරන ලද ලංකා බණිජතෙල් නීතිගත සංස්ථාවයි.

1.4 නිකුත්කිරීම සඳහා බලය පවරන දිනය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් මූල්‍ය ප්‍රකාශණ නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය අනුව 2017 සැප්තැම්බර් 07 දින බලය පවරනු ලැබිය.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය තත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් වලින් සමන්විතවූ සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියමකරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (**SLFRSs & LKASs**) වලට අනුව සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත්කර ඇත.

2.1.1 මැනීමේ පදනම

මූල්‍ය තත්ව ප්‍රකාශයේ පහත අයිතමයන් හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත:

- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වන වගකීම ආයුගණක ක්‍රම අනුව තක්සේරු කර වර්තමාන අගයට හඳුනාගෙන ඇත.

2.1.2 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් තක්සේරුවක් ලබා දී ඇති අතර අනාගතයේ දැකිය හැකි නිශ්චිත කාලයක් සඳහා ව්‍යාපාරයේ අඛණ්ඩව රැඳී සිටීමට සම්පත් තිබීම පිළිබඳව තෘප්තිමත් භාවයට පත්ව ඇත. එසේම අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු මට්ටමේ සැකයක් ඇතිකල හැකිව තිබෙන යම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත්ව නොමැති අතර ඔවුන් ඈවර කිරීමට හෝ සමාගමේ මෙහෙයුම් කටයුතු නවතාලීමට අදහස් නොකරයි. එමනිසා මූල්‍ය ප්‍රකාශන දිගටම අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කරනු ඇත.

2.2 ක්‍රියාකාරී සහ ඉදිරිපත්කිරීමේ මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරන මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

2.3 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතභාවයෙන් යුක්තව යොදාගෙන ඇති අතර, ඒවා පසුගිය වර්ෂයේ දී භාවිතා කළ ඒවා සමග සංගතතාවයෙන් යුක්ත වේ. මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 24 දී ඇති තොරතුරු ද ඇතුලත්ව පසුගිය වසරේ සංඛ්‍යා සහ වාක්‍යාංශ වත්මන් ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය විට නැවත සකස් කර ඇත.

2.4 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන

ගිණුම්කරණ ප්‍රතිපත්ති වල භාවිතයට සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වල වාර්තා කරන ලද ගණන්වලට බලපාන විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන කළමණාකරණය විසින් සිදු කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අවශ්‍ය වේ. මෙම උපකල්පනයන් හා ඇස්තමේන්තු වල අවිනිශ්චිතතාවයන් වත්කම් සහ වගකීම් වල ධාරණ වටිනාකම් වලට අනාගත කාලසීමාවන් සඳහා බලපාන සැලකියයුතු ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵල ඇතිකිරීමට හේතු වනු ඇත.

ඇස්තමේන්තු සහ උපකල්පනයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදුකරන වෙනස් කිරීම් ඇස්තමේන්තුවට වෙනස්කිරීම් සිදුකල කාලසීමාවේදී සහ එය බලපාන ඕනෑම අනාගත කාලවලදී හඳුනාගනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ දී, සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගන්නා ලද වටිනාකම් මත වඩාත්ම සැලකියයුතු බලපෑමක් ඇති ඇස්තමේන්තු කිරීමේ, අවිනිශ්චිතතාවයේ සහ තීරණාත්මක විනිශ්චයන් සම්බන්ධ ක්ෂේත්‍රයන් පහත පරිදි වේ.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(අ) නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීම

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් පාරිතෝෂික වල පිරිවැය මෙන්ම වර්තමාන අගය ආයුගණක මිණුම් ක්‍රම භාවිතා කරමින් නිශ්චය කරනු ලැබේ. වට්ටම් අනුපාතයන්, අනාගත වැටුප් වැඩිවීම් සහ වෙනත් අදාල දත්තයන් පිළිබඳව උපකල්පන සිදුකිරීම ආයුගණක මිණුම් ක්‍රමය තුල ඇතුලත් වේ. සේවක ප්‍රතිලාභයන් ගේ දීර්ඝ කාලීන ස්වභාවය හේතුවෙන් එකී ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිත තාවයකට යටත්වේ. එසේම තවදුරටත් උපකල්පනයන්ගේ විස්තරත් සමගම ඉහත මූලික උපකල්පනයන් සම්බන්ධයෙන් කලමණාකරනය විසින් ඒවායේ සංවේදීතාවය පිළිබඳව සිදුකරන ලද විශ්ලේෂණයක් සහ සංවේදීතා විශ්ලේෂණයේ ප්‍රතිපල සටහන් 17.2 සහ 17.4 දක්වා ඇත.

(ආ) වෙළඳ ලැබිය යුතු දෑ හානිකරනය

මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනට වෙළඳ ලැබිය යුතු දෑ හානිකරනය වී ඇති බවට විෂය මූලික සාක්ෂි පවතින්නේ ද යන්න සමාගම තක්සේරු කර බලයි. දැනට පවතින ලැබිය යුතු දෑ වල දැනට පවත්නා තත්වය සහ ණය අයකරගැනීම පිලිබඳ අතීත අත්දැකීම් පදනම් කරගෙන හානිකරන අලාභය ගණනය කරයි. වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ හානිකරන අලාභය සටහන් 2. 5. 11 සහ 13 හි හෙළිදරව් කර ඇත.

(ඇ) ආදායම් බදු සහ විලම්බිත බදු

සමාගම ආදායම් බදු යටත් වේ. ආදායම් බදු සඳහා වෙන් කිරීම තීරණය කිරීමේ දී සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය වේ. අවසාන බදු තීරණය විනිශ්චිත වන බොහෝ ගණුදෙනු ඇත. අතිරේක බදු ගෙවීමට සිදුවේද යන ඇස්තමේන්තුව මත පදනම්ව අපේක්ෂිත බදු ගැටලු මත ආයතනය බදු වගකීම් හඳුනාගනී. මෙම කරුණුවල අවසාන ප්‍රතිඵලය මුල් අවස්ථාවේ දී වාර්තාකල ගණාන් වලින් වෙනස් වන විට, එවැනි වෙනස් කම් ප්‍රංගම මෙන්ම එවැනි තීරණයක් ගන්නා කාල පරිච්ඡේදයේ විලම්බිත බදු වත්කම් සහ වගකීම් වලට බලපායි. වැඩිදුර තොරතුරු සටහන් 07 සහ 08 හි හෙළිදරව් කර ඇත.

2.5 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය

2.5.1 විදේශ විනිමය පරිවර්තනය

සමාගමේ ක්‍රියාත්මක සහ වාර්තා කිරීමේ මුදල වන රුපියල් වලින් මෙම මූල්‍ය වාර්තා ඉදිරිපත් කරයි. විදේශ විනිමය වලින් සිදුවෙන ගනුදෙනු, ගනුදෙනුව සිදුවන දිනයේ පැවති අනුපාතයට ක්‍රියාත්මක මුදලින් මූලිකව වාර්තා කරයි. විදේශ විනිමය වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයේ පවතින අනුපාතයට ක්‍රියාත්මක මුදලට හරවයි. සියලු වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගනී. විදේශ විනිමයකින් ඓතිහාසික පිරිවැයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් මූලික ගනුදෙනුව දිනයේ පැවති විනිමය අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ. විදේශ විනිමයකින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් සාධාරණ අගය තීරණය කල දිනයේ පැවති විනිමය අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ.

2.5.2 අයභාරය හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒම නිශ්චිත විට සහ ආදායම විශ්වාසවන්ත ලෙස මැනිය හැකි විට අයභාරය හඳුනාගනී. ලබාගත් හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරන අගයෙන් වෙළඳ වට්ටම්, ආපසු එවුම්, ප්‍රතිදාන සහ විකුණුම් බදු (එකතු කල අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද) අඩු කොට අයභාරය මනිනු ලැබේ.

ආදායම් ප්‍රමාණය විශ්වාසවන්තව මැනිය හැකිවිට, අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලාඒමේ සම්භාවිතාවයක් ඇතිවිට සහ පහත විස්තරකර ඇති ආකාරයට සමාගමේ සෑම ක්‍රියාකාරකමක් සඳහාම අදාල විශේෂිත ගති ලක්ෂණයන් සපුරා ඇතිවිට, සමාගම විසින් ආදායම හඳුනාගනී. විකිණීමට අදාල සියලු අවිනිශ්චිතතාවයන් විසඳන තුරු, ආදායම් ප්‍රමාණය විශ්වාසවන්තව මැනිය හැකි සේ නොසලකයි.

අ) සේවාවන් සැපයීම

සේවාවන් සැපයූ හෝ ඉටුකල ගිණුම් කාලපරිච්ඡේදය තුල සේවාවන් සැපයීමෙන් ජනිතවන ආදායම හඳුනාගනී.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

පර්යන්ත ගාස්තුව

ලංකා ඛණිජතෙල් සංස්ථාව, ලංකා ඉන්දියන් තෙල් සමාගම සහ භාණ්ඩාගාරය අතර 2003 වර්ෂයේ දී අත්සන් කල, පසුව 2011 වර්ෂයේ දී සංශෝධනය කල, පොදු භාවිතාකරන්නන්ගේ ගිවිසුම අනුව අලෙවිකරණ සමාගම් වලින් අයකරවාගත් මෙහෙයුම් පිරිවැය වලින් සමන්විත වේ. එය ඔවුන්ට හිමි ඛණිජතෙල් නිෂ්පාදිතයන් හුවමාරුවන අවස්ථාවේදී හඳුනාගැනේ. විකුණනු ලබන ඛණිජතෙල් නිෂ්පාදිතයන් ලීටරයකට යන අනුපාතය යටතේ මනිනු ලැබේ.

මෙහෙයුම් ආන්තිකය

මිල සූත්‍රයේ පූර්ව නිශ්චිත අනුපාතයන් මත පදනම්ව මෙහෙයුම් දායකත්වය හඳුනාගැනේ. විකුණනු ලබන ඛණිජතෙල් නිෂ්පාදිතයන් ලීටරයකට යන අනුපාතය යටතේ මෙහෙයුම් දායකත්වය මනිනු ලැබේ.

ප්‍රවාහන ආදායම

දුම්රිය, වාහන, නළමාර්ග සහ බවුසර් ගණුදෙනුකරුවන් වෙනුවෙන් දරණ ලද ප්‍රවාහන පිරිවැය අයකර ගැනීමයි. ලීටර් පරිමාව සහ ගමන්කරන ලද දුර ප්‍රමාණය මත පදනම්ව ආදායම හඳුනාගැනේ.

ණය පොළිය

මිල සූත්‍රයේ පූර්ව නිශ්චිත අනුපාතයන් මත පදනම්ව, සමාගම විසින් දරන ලද පොළිය යලි අයකරගැනීම මත ගණනය කරමින් ණය පොළිය හඳුනාගැනේ. විකුණනු ලබන ඛණිජතෙල් නිෂ්පාදිතයන් ලීටරයකට යන අනුපාතය යටතේ ණය පොළිය මනිනු ලැබේ.

ආ) **මූල්‍ය ආදායම**

පොලිය උපචිත වනවිට, සඵල පොළි ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායම හඳුනාගැනේ.

ඇ) **වෙනත්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගැනේ.

දේපල, පිරියත සහ උපකරණ සහ ආයෝජන ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් හටගන්නා අයභාර ස්වභාවයේ ශුද්ධ ලාභ සහ අලාභ, විකිණීමෙන් ලද මුදල් වලින් වත්කම් වල ධාරණ අගය සහ ආශ්‍රිත විකිණීමේ වියදම් අඩු කිරීමෙන් පසු ආදායම් ප්‍රකාශයේ ගිණුම් තබනු ලැබේ.

අමතර ක්‍රියාකාරකම්වල සිට ප්‍රධාන ආදායම් උත්පාදනය කරන ක්‍රියාකාරකම් දක්වා සහ ප්‍රමාණාත්මක නොවන සමාන ගණුදෙනු සමූහයකින් යටගන්නා ලාභ සහ අලාභයන්, ශුද්ධ පදනම මත එකට එකතුකර වාර්තාකොට ඉදිරිපත් කරනු ලබයි.

2.5.3 වියදම් හඳුනාගැනීම

ව්‍යාපාරය පවත්වා ගැනීමේ දී සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්වයෙන් නඩත්තු කිරීමේ දී දරන ලද සියළු වියදම් කාලපරිච්ඡේදයේ ආදායම් ප්‍රකාශයට අයකරනු ලැබේ.

2.5.4 බදුකරණය

කාලපරිච්ඡේදය සඳහා වන බදු වියදම ප්‍රවර්තන සහ විලම්බිත බදු වලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ සෘජුවම ස්කන්ධයට අදාලව හඳුනාගන්නා අයිතමයන් සම්බන්ධයෙන් හැරෙන්නට බදු කාලපරිච්ඡේදය සඳහාවන ලාභයට හඳුනාගනී. මෙහිදී බදු, පිලිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායම සහ සෘජුවම ස්කන්ධයට ද හඳුනා ගනී.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ප්‍රවර්තන බදු

ප්‍රවර්තන සහ පෙර කාලපරිච්ඡේදයන් සඳහා ප්‍රවර්තන ආදායම් බදු වත්කම් සහ වගකීම් බදු අධිකාරීන්ගෙන් අයකරගැනීමට අපේක්ෂිත හෝ බදු අධිකාරීන්ට ගෙවීමට ඇති ප්‍රමාණයන්ට මනිනු ලැබේ. ප්‍රමාණය ගණනය කිරීමට යොදාගන්නා බදු අනුපාතයන් සහ බදු නීති, වාර්තාකරන දින ක්‍රියාත්මකව පවතින හෝ ප්‍රමාණවත්ව නීතිගතකර ඇති ඒවා වේ.

ආදායම් බදු වෙන්කිරීම පදනම් ව ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති පරිදි සහ අදාල බදු රෙගුලාසි වලට අනුකූලව ගණනය කරන ලද ආදායම් සහ වියදම් මූලිකාංග මතය.

සෘජුවම ස්කන්ධයට හඳුනාගන්නා ලද අයිතමයන්ට අදාල ප්‍රවර්තන ආදායම් බද්ද ස්කන්ධය තුලම හඳුනාගත යුතු අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා නොගත යුතුය.

විලම්භිත බදු

වත්කම් සහ වගකීම් වල බදු පදනම සහ මූල්‍ය වාර්තා කරන පරමාර්ථ සඳහා වන ධාරණීය අගයන් අතර, වාර්තා කරන දිනට පවතින තාවකාලික වෙනස මත, වගකීම් ක්‍රමය භාවිතා කරමින්, විලම්භිත බදු වෙන්කිරීම සිදුකරයි.

ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී, වත්කමක් සහ වගකීමක් මූලික හඳුනාගැනීමකින් හටගන්නා විලම්භිත ආදායම් බදු වගකීම් ඇතිවිට සහ ගණුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම්කරන ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩු වලට බල නොපාන, තාවකාලික වෙනස්කම් ඇති විට හැර සියලුම බදු අයවන තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වගකීම් හඳුනාගනු ලබයි.

අඩුකල හැකි තාවකාලික වෙනස්කම් වලට අදාල විලම්භිත බදු වත්කම ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී වත්කමක් සහ වගකීමක් මූලික හඳුනාගැනීමකින් හටගන්නේ නම් සහ ගනුදෙනුව සිදුවන කාලයේදී ගිණුම්කරන ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩු වලට බල නොපාන්නේ නම්, අඩුකල හැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ භාවිතා කිරීම සඳහා බදු අයවන ලාභ ඇතිවීම සිදුවිය හැකි වන විට, සියලුම අඩුකල හැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලබයි.

විලම්භිත බදු වත්කම් වල ධාරණ අගය සෑම වාර්තා කරන දිනටම සමාලෝචනය කරන අතර භාවිතා කල යුතු විලම්භිත බදු වත්කම මුළුමනින්ම හෝ කොටසක් ඉඩදීම සඳහා ප්‍රමාණවත් බදු අයවන ලාභයක් පවතින බවට තවදුරටත් සම්භාවිතාවක් නොමැති විට විලම්භිත බදු වත්කම අඩුකල යුතුය.

වත්කම උපලබ්ධිවන විට හෝ වගකීම පියවන විට වාර්තා කරන දිනට ක්‍රියාත්මකව පවතින හෝ ප්‍රමාණවත්ව නීතිගතකර ඇති බදු අනුපාතයන් (සහ බදු නීති) පදනම් කරගත් වර්ෂය සඳහා යොදාගන්නා බදු අනුපාතයන්ට අනුව විලම්භිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලැබේ.

විකුණුම් බදු (එකතු කල අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද)

අධිකාරීන්ගෙන් අයකරගත නොහැකි, වත්කම් හෝ සේවාවන් මිලදී ගැනීමේ දී දරන ලද, අදාල පරිදි විකුණුම් බදු ඇතුලත් අගයට වත්කමේ පිරිවැයෙහි හෝ වියදම් අයිතමයෙහි කොටසක් ලෙස සහ ලැබිය යුතු සහ ගෙවිය යුතු ලෙස හඳුනාගන්නා විට හැර, අනෙකුත් විකුණුම් බදු අඩුකිරීමෙන් පසු ආදායම්, වියදම් සහ වත්කම් හඳුනාගනු ලබයි. බදු අධිකාරීන් වෙනුවෙන් ලැබිය යුතු සහ ගෙවිය යුතු විකුණුම් බදු ගණන මූල්‍ය තත්ව ප්‍රකාශයේ ලැබිය යුතු සහ ගෙවිය යුතු දෑ වල ඇතුලත් කරනු ලබයි.

2.5.5 මූල්‍ය සාධන පත්‍ර - මූලික හඳුනාගැනීම සහ පසුකාලීන මැනීම

2.5.5.1 මූල්‍ය වත්කම්

සමාගමේ මූල්‍ය වත්කම් වලට මුදල් සහ කෙටිකාලීන තැන්පතු, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ ආශ්‍රිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ගණන් ඇතුලත් වේ.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූලික හඳුනාගැනීම සහ මැනීම

ශ්‍රීලගිප්‍ර 39 හි විෂය පථය තුල ඇති මූල්‍ය වත්කම් ලාභාලාභ තුලින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු මුදල්, කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හෝ ඵලදායී ඉදිරි රැකුමක ඇති ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස යොදවා ඇති ව්‍යුත්පන්න ලෙස සුදුසු පරිදි වර්ගීකරණය කරයි. සමාගම විසින් එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය මූලික හඳුනාගැනීමේ දී තීරණය කරයි.

සියලු මූල්‍ය වත්කම් ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනාගන්නා අතර, ලාභාලාභ තුලින් සාධාරණ අගයට නොදක්වන වත්කම් සම්බන්ධයෙන් සෘජුවම හඳුනාගත හැකි ගණුදෙනු පිරිවැයද ඊට එකතු කරයි.

වෙළඳපොලේ රෙගුලාසි හෝ සම්ප්‍රදායන්ට (සාමාන්‍ය ආකාරයේ වෙළදාම්) අනුව පිහිටුවා ගන්නාලද, කාල පරාසයක් තුල වත්කම් බෙදාහැරීම අවශ්‍යවන මූල්‍ය වත්කම් ගැනීම් හෝ විකිණීම් වලදී, ඒවා වෙළඳ දිනට, එනම් සමාගම වත්කම් මිලට ගැනීම් හෝ විකිණීම් සිදුකරන දිනට, හඳුනාගනු ලබයි.

පසුකාලීන මැනීම

මූල්‍ය වත්කම් පසුකාලීනව මැනීම, පහත දැක්වෙන ආකාරයට ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ:

අ) ණය සහ ලැබිය යුතු

ණය සහ ලැබිය යුතු මුදල් ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර සක්‍රීය වෙළඳ පොළක් තුල ලයිස්තුගත නොකල ස්ථාවර හෝ නිර්ණය කල හැකි ගෙවීම් සහිත වේ. මූලික මැනීමෙන් පසු එවැනි මූල්‍ය වත්කම් පසුකාලීනව සඵල පොලී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට හානිකරනය අඩුකර මිනුම් කරයි. අත්පත්කර ගැනීම මතවූ යම් වට්ටමක් හෝ අධිමිලක් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය තීරණය කරනු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් තුල ඇතුලත් කර හානිකරන අලාභ ආදායම් ප්‍රකාශය තුල මූල්‍ය පිරිවැයෙහි ඇතුලත් කරයි.

ඉවත් කිරීම

මූල්‍ය වත්කමක් (හෝ අදාල වන විටදී මූල්‍ය වත්කමකින් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක්) ඉවත්කරනු ලබන්නේ:

- වත්කමෙන් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති හිමිකම කල් ඉකුත්ව ගොස් ඇති විට.
- සමාගම විසින් මුදල් ප්‍රවාහයන් ලැබීමට සමාගමට ඇති අයිතිය පවරා ඇති විට, හෝ මාරුකිරීම් වැඩපිලිවෙලක් යටතේ ලබාගත් මුදල් ප්‍රවාහයන් මුළු මනින්ම සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශවයක් වෙත ගෙවීමට බැඳීමක් ඇතිනරගෙන ඇතිවිටක සහ එක්කෝ (අ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා ඇති විට, නැතහොත් (ආ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා හෝ රඳවා තබාගෙන නොමැති වුවද වත්කමෙහි පාලනය පවරා ඇති විට.

සමාගම විසින් වත්කමෙන් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය පවරා ඇති විට හෝ මාරුකිරීම් වැඩ පිලිවෙලකට එළඹ සැලකිය යුතු ලෙස වත්කම සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා හෝ රඳවා තබාගෙන නොමැතිව හෝ එහි පාලනය පවරා නොමැතිව ඇති විට වත්කම හඳුනාගනු ලබන්නේ ඒ සඳහා සමාගමේ අඛණ්ඩ මැදිහත්වීම් මට්ටම අනුවය.

එවැනි විටදී, සමාගම විසින් ආශ්‍රිත වගකීමක්ද හඳුනාගනු ලබයි. සමාගම විසින් රඳවා තබාගත් හිමිකම් සහ බැඳීම් පෙන්නුම් වන පදනමක් මත පවරන ලද වත්කම සහ ආශ්‍රිත වගකීම මිණුම් කරනු ලබයි.

අඛණ්ඩ මැදිහත්වීම පවරන ලද වත්කම මත ඇපයක ස්වරූපයක් ගන්නා අතර, එය වත්කමෙහි මුල් ධාරණ අගය සහ ආපසු ගෙවීමට සමාගමට අවශ්‍යවන, උපරිම මුදල් ප්‍රමාණය යන අගයන්ගෙන් වඩා අඩු අගයට මිණුම් කරයි.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය වත්කම් වල අගය හානිකරනය

මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයක අගය හානිකරනය වී තිබේ ද යන්න පිළිබඳව විෂයානුකූල සාක්ෂි තිබේද යන්න, සමාගම සෑම වාර්තාකරන දිනකටම තක්සේරු කරයි. වත්කමෙහි මූලික හඳුනාගැනීමට පසුව සිදුව ඇති සිදුවීම් එකක් හෝ කිහිපයක ප්‍රතිඵලයක් වශයෙන් (සිදුව ඇති අලාභ සිද්ධියක්) ඇතිවීමත්, එකී අලාභ සිද්ධිය සිදුවීම මගින් මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් සමූහයේ, විශ්වාස වන්තව මිණුම් කලහැකි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත බලපෑමක් ඇතිකරනවිට, හානිකරනය පිළිබඳ විෂයානුකූල සාක්ෂි ඇත්නම් පමණක්, මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක හානිකරනය සිදුවී ඇතැයි සලකනු ලබයි. ණයගැතියන් හෝ ණයගැතියන් සමූහයක් සැලකියයුතු මූල්‍ය දුෂ්කරතාවයන් අත් විඳමින් සිටිනවිට, පොලිය හෝ මුල් මුදල නොගෙවීම ගෙවීම පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට හෝ වෙනත් මූල්‍ය අසංවිධානාත්මක තාවයන්ට පත්වනු ඇති විට, සහ පැහැර හැරීම් සමග සහසම්බන්ධවන හිගවල හෝ ආර්ථික තත්වයන්ගේ වෙනසක් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ මැනියහැකි අඩුවීමක් නිරීක්ෂණ දත්ත මගින් පෙන්නුම් කරන අවස්ථාවලදී, වැනි ඇඟවීම්, හානිකරනය වීම පිළිබඳ සාක්ෂි වලට ඇතුලත් කල හැක.

ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගන්නා මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගන්නා මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සමාගම විසින් පළමුව තක්සේරු කරනු ලබන්නේ, තනිතනිව සුවිශේෂවන මූල්‍ය වත්කම් සඳහා තනි තනිව හානිකරනය වීම පිළිඹඳ විෂයානුකූල සාක්ෂි පවතින්නේද යන්න පිළිඹඳ හෝ තනිතනිව සුවිශේෂී නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව ය හානිකරනය වීම පිළිබඳ විෂයානුකූල සාක්ෂි පවතින්නේද යන්න පිළිබඳවයි. තනිතනිව තක්සේරු කළ මූල්‍ය වත්කම් සඳහා හානිකරනය_වීම පිළිබඳ විෂයානුකූල සාක්ෂි නොමැති බවට සමාගම විසින් නිශ්චය කරන්නේ නම්, ඒවා සුවිශේෂී වුවත්, නැතත්, සමාන ණය අවදානම් ගතිලක්ෂණ පවතින මූල්‍ය වත්කම් සමූහයක් එයට ඇතුලත් කොට, හානිකරනය වීම සඳහා එකී වත්කම් සාමූහිකව තක්සේරු කිරීම සිදුකර, අගය අඩුවීම සඳහා තනිතනිව ඇස්තමේන්තු කල වත්කම් සඳහා හානිකරන අලාභයක් ඇත්නම් හෝ එය අඛන්ඩව පවතින බව හඳුනාගත්තේ නම්, එකී වත්කමේ හානිකරනය වීම පිළිබඳ සාමූහික තක්සේරුවට ඇතුලත් නොකරයි.

හානිකරනය වීමේ අලාභයක් ඇති බවට විෂයානුකූල සාක්ෂි ඇති විට අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ගේ (තවමත් ඇතිවී නොමැති අනාගත අපේක්ෂිත ණය අලාභ හැර) වර්තමාන අගය අතර වෙනස මගිනි. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ගේ වර්තමාන අගයන්, මූල්‍ය වත්කමේ සඵල පොළී අනුපාතයට වට්ටම් කරනු ලැබේ. ණයක් සඳහා විචල්‍ය පොළී අනුපාතිකයන් නැත්නම්, ඕනෑම හානිකරනය වීමේ අලාභයක් මිනුම් කිරීම සඳහා වන වට්ටම් අනුපාතය වන්නේ ප්‍රවර්තන සඵල පොළී අනුපාතයයි.

ඉඩහැරීමේ ගිණුමක් භාවිත කිරීම හරහා වත්කමේ ධාරණ අගය අඩුවන අතර අලාභය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. පොළී ආදායම, අඩුවූ ධාරණ අගය මත අඛණ්ඩව උපචිත වන අතර, හානිකරනය මැනීමේ කර්‍යය අනාගත මුදලු ප්‍රවාහයන් වට්ටම් සඳහා භාවිතකල පොළී අනුපාතය භාවිතයෙන් පොලිය උපචිත කිරීම සිදු කරයි. පොළී ආදායම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වාර්තා කරයි. අනාගත අයකරගැනීම සම්බන්ධයෙන් යථාර්තවාදී අපේක්ෂාවක් නොමැතිවිට සහ සියලු අතිරේක ඇප උපලබ්ධිවී හෝ සමාගමට පැවරී ඇති විට, ණය සහ ණය ආශ්‍රිත ඉඩහැරීම් සමාගම ලියාහරියි. හානිකරනය හඳුනාගත් පසු ඇති වූ සිදුවීමක් නිසාවෙන්, පසු වසරකදී හානිකරන අලාභය ඉහලයාමක් හෝ පහල යාමක් සිදුවෙයි නම්, ඉඩහැරීමේ ගිණුමට ගැලපීම මගින්, කලින් හඳුනාගත් හානිකරන අලාභය ඉහලයාම හෝ පහල යාම සිදුවෙයි. අනාගත ලියාහැරීමක් පසුව නැවත අයකරගතහොත්, අයකරගැනීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට බැර කරයි.

2.5.5.2 මූල්‍ය වගකීම්

වෙළඳ ගෙවිය යුතු දෑ, ආශ්‍රිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු දෑ, බැංකු අයිරා සහ පොළී සහිත ණය ගැනීම් සමාගමේ මූල්‍ය වගකීම් වලට ඇතුලත් වේ.

මූලික හඳුනාගැනීම සහ මැණීම

ශ්‍රීලගිප්‍ර 39 යේ විෂය පථය තුල වූ මූල්‍ය වගකීම් , ලාභාලාභ තුලින් සාධාරණ අගයට තබාගන්නා මූල්‍ය වගකීම්, ණය සහ ණයට ගැනීම් සහ ඵලදායී ඉදිරි රැකුමක් සඳහා යොමුකරන ලද ව්‍යුත්පන්නයන්, සුදුසු පරිදි, වර්ග කෙරේ. සමාගම මූලික හඳුනාගැනීමේ දී මූල්‍ය වගකීම් වර්ග කිරීම තීරණය කරයි.

සියලුම මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයට හඳුනාගන්නා අතර, ණය සහ ණයට ගැනීම් ක්‍රමක්ෂය පදනමට තබාගනී. සෘජුව හඳුනාගතහැකි ගනුදෙනු පිරිවැය මීට ඇතුලත් වේ. මූලික සාධාරණ අගය සහ නාමික අගය අතර යම් වෙනසක් ඇත්නම්, එය මෙහෙයුම් කල්බදු ආදායමේ කොටසක් වශයෙන් ඇතුලත් කරන අතර, අදාල කාලසීමාව පුරාවට සරල මාර්ග ක්‍රමයට හඳුනාගනු ලබයි.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

පසු කාලීන මැණීම
පහත සඳහන් පරිදි මූල්‍ය වගකීම් මැණීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී:

අ) ණය සහ ණය ගැනීම්
මූලික හඳුනාගැනීමට පසුව පොලි සහිත ණය සහ ණය ගැනීම් සඵල පොලි අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට පසු කාලීනව මණිනු ලැබේ. සඵල පොලි අනුපාත ක්‍රමක්ෂය පිරිවැය ක්‍රියාවලිය තුල මෙන්ම, වගකීම් ඉවත්කිරීම සිදුකරන විට ආදායම් ප්‍රකාශය තුල ලාභ අලාභ හඳුනාගැනේ.

අත්පත් කරගැනීමේ දී ඇති වූ යම් වට්ටමක් සහ අධිමිලක් සහ සඵල පොලි අනුපාතයේ සංකලනිත කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. සපල පොලි අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුල ඇතුලත් කරයි.

ඉවත්කිරීම්
වගකීම යටතේ ඇති බැඳියාව පියවා ඇති විට හෝ අවලංගුකර ඇතිවිට හෝ කල් ඉකුත්ව ඇතිවිට මූල්‍ය වගකීමක් ඉවත් කෙරේ. සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත එම ණය දෙන්නාගෙන්ම හෝ පවතින වගකීමක කොන්දේසි සැලකිය යුතුලෙස නවීකරණය කිරීමෙන් හෝ දැනට පවතින මූල්‍ය වගකීමක් වෙනකක් මගින් ප්‍රතිසම්පාදනය කලවිට, එවැනි හුවමාරුවක් හෝ නවීකරනයක් මුල් වගකීම ඉවත්කිරීමක් ලෙස සහ නව වගකීමක් හඳුනාගැනීමක් ලෙස සලකනු ලබන අතර අදාල ධාරණ අගයන්ගේ වෙනස ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

2.5.6 සාධාරණ අගය මැනීම

මැනීම කරන දිනට නිසිලෙස කරන ගනුදෙනුවකදී වෙළඳපොල පාර්ශවකරුවන් අතර වත්කමක් විකිණීමට ලැබෙන මුදල් හෝ වගකීමක් පැවරීමට ගෙවනු ලබන මිල සාධාරණ අගය වේ. වත්කමක් විකිණීම හෝ වගකීම පැවරීමට වන ගණුදෙනුව:

- වත්කම හෝ වගකීම සඳහා වන ප්‍රධාන වෙළඳපොලේ දී
- ප්‍රධාන වෙළඳපොළක් නොමැතිවිටදී වත්කම හෝ වගකීම සඳහා වන වඩාත්ම වාසිදායක වෙළඳපොලේ දී

සිදුවේය යන පූර්ව නිගමනය මත, සාධාරණ අගය මැනීම රඳා පවතී.

ප්‍රධාන හෝ වාසිදායක වෙළඳපොළ සමාගමට ඇතුලත් විය හැකි වෙළඳපොළක් වියුතුය.

වෙළඳපොළට සහභාගිවන්නන් තමන්ට ආර්ථික වශයෙන් වඩාත්ම වාසිදායක ලෙසට හැසිරේය යන උපකල්පනය කරමින්, වත්කම හෝ වගකීම මිල කිරීමේදී වෙළඳපොළට සහභාගිවන්නන් කරනු ලබන උපකල්පන මත පදනම්ව, සාධාරණ අගය මනිනු ලැබේ.

ඉහලම සහ හොඳම භාවිතය යොදා ගනිමින් හෝ ඉහලම සහ හොඳම භාවිතය යොදා ගනු ඇතැයි සැලකෙන වෙනත් වෙළඳපොළට සහභාගිවන්නෙකුට විකිණීමෙන් වෙළඳපොළට සහභාගිවන්නෙකුට ඇති ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමේ හැකියාව මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේදී සැලකිල්ලට ගනු ලැබේ..

ඇගයුම් කිරීමේදී අදාල නිරීක්ෂණය කලහැකි යෙදවුම් භාවිතය උපරිම කරමින් සහ නිරීක්ෂණය කලනොහැකි යෙදවුම් භාවිතය අවම කරමින් අවස්ථාවට යෝග්‍ය ශිල්පක්‍රම සමාගම යොදාගනී.

සාධාරණ අගය මනිනු ලැබූ හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කරනු ලැබූ සියලුම වත්කම් හා වගකීම්, සාධාරණ අගය මැනීමට සමස්තයක් වශයෙන් වැදගත් පහළම මට්ටමේ යෙදවුම් මත පදනම්ව, සාධාරණ අගය ධූරාවලිය තුල පහත සඳහන් පරිදි වර්ග කරනු ලබයි.:

- මට්ටම 1 - සමාන වත්කම් හෝ වගකීම් සඳහා ක්‍රියාකාරී වෙළඳ පොළෙහි ලයිස්තුගත (නොගැලපූ) මිල ගණන්

- මට්ටම 2 - සාධාරණ අගය මැනීමට වැදගත් සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කල හැකි පහළම මට්ටමේ යෙදවුම සඳහා වන ඇගයීම් ක්‍රම

- මට්ටම 3 - සාධාරණ අගය මැනීමට වැදගත් සාධාරණ අගය හෙලිදරව් කිරීම සඳහා නිරීක්ෂණය කල නොහැකි පහළම මට්ටමේ යෙදවුම ඉහත විස්තරකර ඇති ආකාරයට, ස්වභාවය, ගුණාංග, වත්කම් හා වගකීම් වල අවදානම් සහ සාධාරණ අගය ධූරාවලියේ මට්ටම පදනම් කරගෙන සමාගම, වත්කම් හා වගකීම් පන්තීන් තීරණය කර ඇත.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

2.5.7 තොග

යල් පැනගිය සහ සංසරණය අඩු අයිතමයන් සඳහා ප්‍රමාණවත් පරිදි වෙන්කිරීමක් කල පසු, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට තොග ආගණනය කෙරේ. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුල තොග සහ විකිණිය හැකි මිලෙන් නිම කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අත්‍යවශ්‍ය වන ඇස්තමේන්තුගත පිරිවැය අඩුකල පසු ශුද්ධ උපලබ්ධි අගය වේ..

තොග වර්තමාන තත්වයට සහ ස්ථානයට ගෙන ඒමේ දී දරන ලද පිරිවැය, පහත පිරිවැය සූත්‍රය භාවිතා කිරීමෙන් ගිණුම්ගත කරනු ලැබේ.:

පාරිභෝජන ද්‍රව්‍ය, මෝටර් රථ අමතර කොටස් සහ අළුත්වැඩියාව සඳහා වන සාමාන්‍ය ද්‍රව්‍ය	- බරතැබූ සාමාන්‍ය පදනම මත ගැනුම් පිරිවැයට
නිමි තොග	- සත්‍ය ගැනුම් පිරිවැයට

2.5.8 දේපල, පිරියත සහ උපකරණ

ඒදිනෙදා නඩත්තු කිරීමේ පිරිවැය හැර, පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණය අඩුකල පසු අගයට, දේපල, පිරියත සහ උපකරණ දක්වා ඇත. හඳුනාගැනීමේ නිර්මාපකය සපුරාලන්නේ නම් දේපල, පිරියත සහ උපකරණ වල කොටසක් ප්‍රතිසම්පාදනය කිරීමේ පිරිවැය, එවැනි පිරිවැය දැරුවිට එවැනි පිරිවැයට ඇතුලත් වේ.

තව දුරටත් අසම්පූර්ණ තත්වයේ පවතින, භාරගත් කාර්යයන් මත ගෙවන ලද, සියලුම අගයන් කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩවලින් පෙන්නුම් කරයි..

අවිනිශ්චිත ජීව කාලයක් පවතින බවට සැලකෙන නිසාවෙන් ඉඩම් ක්ෂය නොකරයි. සෑම වත්කමකම පිරිවැය, එකී වත්කම්, භාවිතා කිරීමට හැකි තත්වයට පත්වූ දින සිට ඇරඹෙන පරිදි වන ඒවායේ ඵලදායී ජීවිත කාලය පුරා, ඒවායේ සුන්බුන් අගයට දක්වා බෙදාහැරීම සඳහා සරල මාර්ග ක්‍රමය මත ක්ෂයවීම් ගණනය කරයි. වත්කම් විකිණීමේ දී වත්කම ඉවත්කරන දින සිට ක්ෂයවීම් අවසාන කරයි.

වත්කම්වල සුන්බුන් අගය, ඵලදායී ජීවිත කාලයන් සහ ක්ෂය ක්‍රමය සමාලෝචනය කොට යෝග්‍ය වන්නේ නම්, අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම ගලපනු ලබයි..

වත්කමක ධාරණ අගය එහි අපේක්ෂිත අයකරගත හැකි අගයට වඩා වැඩි වන්නේ නම්, වත්කමක ධාරණ අගය වහාම එහි අයකර අගය දක්වා කපා හරිනු ලබයි..

විකිණීමෙන් ලද මුදල් ධාරණ අගය සමග සැසඳීමෙන් විකිණීම මත ලාභ අලාභ තීරණය කරනු ලබන අතර ඒවා ආදායම් ප්‍රකාශයෙහි ඇතුලත් කරනු ලබයි.

2.5.9 අස්පෘශ්‍ය වත්කම්

a) ආයතන සම්පත් සැලසුම්කරන (ERP) පද්ධතිය සහ ආයතන සම්පත් සැලසුම්කරන (ERP) බලපත්‍ර ගාස්තු

මිලට ගත් මෘදුකාංග සඳහා බලපත්‍ර ලබාගැනීමේ දී දරණ ලද පිරිවැය බලපත්‍ර ගාස්තු මගින් පෙන්නුම් කරයි. බලපත්‍ර ගාස්තු පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකොට ගෙන යයි. බලපත්‍ර වල පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය වන වසර 5 පුරා බෙදාහැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය ගණනය කරයි.

2.5.10 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කල හැකි සහ වටිනාකම වෙනස්වීම සම්බන්ධයෙන් නොසැලකියයුතු තරමේ අවදානමක් සහිත, ඉහල ද්‍රවශීලතාවයක් ඇති කෙටිකාලීන ආයෝජන වශයෙන් මුදල් හා මුදල් සමාන දෑ අර්ථකථනය කරනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අතැති මුදල් සහ පියවිය යුතු බැංකු අයිරාව අඩුකල පසු ඉතිරිවන බැංකු තැන්පතු වලිනි. මාස තුනක් හෝ ඊට අඩු කල්පිරීම් සහිත ආයෝජනද මුදල් හා මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

2.5.11 මූල්‍ය නොවන වත්කම් හානිකරනය

අවිනිශ්චිත ජීව කාලයක් සහිත වත්කම් ක්‍රමක්ෂය වීමට භාජනය නොකරන අතර, හානිකරනයවීම සම්බන්ධව පරීක්ෂා කරනු ලබයි. ධාරණ අගය අයකරගැනීමට නොහැකි වනු ඇති බවට සිදුවීම් හෝ අවස්ථාවන්ගේ වෙනස්කම් පෙන්නුම් කරන විටදී, ක්‍රමක්ෂය සඳහා භාජනය වන වත්කම් හානිකරනය සඳහා සමාලෝචනය කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගය ඉක්මවන ප්‍රමාණයට, හානිකරන අලාභය හඳුනාගනු ලැබේ. ආපසු අයකරගත හැකි අගය වන්නේ වත්කමේ සාධාරණ අගයෙන් එය විකිණීමට යන පිරිවැය අඩුකල පසු ලැබෙන අගය සහ භාවිත අගය යන දෙකෙන් වඩා වැඩි අගයයි. හානිකරනය තක්සේරු කිරීම සඳහා වෙන් වෙන්ව හඳුනාගත හැකි මුදල් ප්‍රවාහයන් (මුදල් ජනනය කරන ඒකක) ඇති පහළම මට්ටම් වලට වත්කම් කාණ්ඩ කරනු ලැබේ.

2.5.12 වෙන්කිරීම්

සමාගමට, අතීත සිදුවීමක ප්‍රතිපලයක් වශයෙන් වර්තමාන බැඳීමක් (නීතිමය හෝ සම්ප්‍රයුක්ත) පවතින විට, මෙම බැඳීම් නිරාකරණය කිරීමට ආර්ථික ප්‍රතිලාභ හි බැඳුණු සම්පත් පිටතට ගලායාමේ සම්භාවිතාවක් ඇති විට සහ බැඳීමේ ප්‍රමාණය පිළිඹඳව විශ්වාසදායක ලෙස ඇස්තමේන්තුවක් කලහැකි විටක, වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. වෙන්කිරීම මුලුමනින්ම හෝ කොටසක් ප්‍රතිපූර්ණ කිරීමට සමාගම අපේක්ෂා කරනවිට, එම ප්‍රතිපූර්ණය සැබවින්ම නිශ්චිත නම් පමණක්, ප්‍රතිපූර්ණය වෙනම වත්කමක් ලෙස හඳුනාගනු ලැබේ. ඕනෑම වෙන්කිරීමකට අදාල වියදම යම් ප්‍රතිපූර්ණයක් ඇත්නම්, එය අඩුකල පසු ලැබෙන අගයට ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ. මුදලේ කාල වටිනාකම සැලකිය යුතු වන්නේ නම්, වෙන්කිරීම් තීරණය කරනු ලබන්නේ, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් මුදලේ කාල වටිනාකම පිළිඹඳ ප්‍රවර්ථන වෙළඳපොල තක්සේරුකිරීම් සහ යෝග්‍ය විටදී වගකීමට විශේෂිත වන අවදානම පෙන්නුම් කරන බදු පෙර අනුපාතයට වට්ටම් කිරීමෙනි. වට්ටම් කිරීම භාවිතා කරනවිට, කාල පරාසය හේතුවෙන් වෙන්කිරීමෙහි සිදුවන ඉහලයාම, පොලී වියදමක් ලෙස හඳුනා ගැනේ.

2.6 සේවක ප්‍රතිලාභ

අ) නිශ්චිත ප්‍රතිලාභ බැඳීම - පාරිතෝෂික

"ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිතා කරමින්, සෑම මූල්‍ය වර්ෂයකදීම, ආයුගණකයෙකුගේ අවවාද අනුව සමාගම විසින් නිශ්චිත සැලසුමක් ලෙස සලකනු ලබන පාරිතෝෂික බැඳීම්වල පොරොන්දුවූ විශ්‍රාම ප්‍රතිලාභ වල වර්තමාන අගය ගිණුම් කරනු ලබයි. ආයුගණක ලාභ සහ අලාභ ඒවා හටගන්නා කාලසීමාව තුලදී වෙනත් විස්තීර්ණ ආදායම් තුල හඳුනාගනු ලබයි. වගකීම මූල්‍යනය කරනු නොලැබේ.

ආයුගණක ලාභ සහ අලාභ හඳුනාගැනීම
ආයුගණක ලාභ සහ අලාභ ඒවා හටගන්නා වර්ෂය තුලදී වෙනත් විස්තීර්ණ ආදායම් තුල හඳුනාගනු ලබයි..

ආ) නිශ්චිත දායක සැලසුම්
සමාගම නිර්වචිත දායක සැලසුමක් ද ක්‍රියාත්මක කරයි. නිශ්චිත දායක සැලසුම සඳහා ගෙවිය යුතු දායකය, සේවකයන් විසින් සමාගමට සැපයූ සේවයට සමානුපාතික වන අතර, එය "කාර්ය මණ්ඩල වියදම්" යටතේ වාර්තා කරයි. නොගෙවූ දායක මුදල් වගකීමක් ලෙස වාර්තා කරයි. සමාගම පහත සඳහන් යෝජනාක්‍රම සඳහා දායක වේ:

සේවක අර්ථසාධක අරමුදල
සමාගම සහ සේවකයා විසින් පිළිවෙලින් සේවකයාගේ මාසික දල වැටුපෙන් (අතිකාල රහිතව) 15% සහ 10% බැගින් සේවක අර්ථසාධක අරමුදලට දායක වේ.

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් පවත්වාගෙන යන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සේවකයාගේ මාසික දල වැටුපෙන් (අතිකාල රහිතව) 3% ක් සමාගම දායක වේ.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ඇ) සකසුරුවම් සමිති අරමුදලට දායකත්වය

සමිති ආඥාපණතේ 123 (3) (අ) වගන්තිය යටතේ ලියාපදිංචි කර ඇති සීමාසහිත ලංකා බණිජතෙල් සංස්ථාවේ සකසුරුවම් සමිතිය ලාභ-අරමුණුකර-නොගත් සංවිධානයකි. සි. පී. එස්. ටී. එල් හි සේවකයින්ගේ වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය සකසුරුවම් සමිතිය විසින් කළමණාකරණය කරනු ලැබේ. සමාගම විසින් සකසුරුවම් සමිතියට කාර්තුවකට කරනු ලබන දායකත්වය වර්ෂය තුල දී වියදමක් ලෙස හඳුනාගනු ලබයි.

2.7 නිකුත් කරන ලද නමුත් තවම බලාත්මක නොවන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවල බලපෑම

නව ගිණුම් ප්‍රමිත සමහරක් සහ පවතින ප්‍රමිත වලට සංශෝධන/වැඩි දියුණු කිරීම් ප්‍රකාශයට පත්කොට ඇති වුවත්, 2017 මාර්තු 31 ගිණුම් කාලපරිච්ඡේදය සඳහා අනිවාර්ය නොවේ. ඒවායින් කිසිවක් සමාගම විසින් පෙර භාවිත කර නොමැත.

ශ්‍රීලමූවාප්‍ර 9 මූල්‍ය සාධන පත්‍ර

2014 දෙසැම්බර් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින්, මූල්‍ය සාධන පත්‍ර ව්‍යාපෘතිවල සියලුම අවධීන් ප්‍රතිබිම්බනය කරන **ශ්‍රීලමූවාප්‍ර** 9 මූල්‍ය සාධන පත්‍ර, වල අවසාන පිටපත නිකුත්කර ඇති අතර, එය මූල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම සහ මැණීම සඳහා වන ශ්‍රීලගිප්‍ර 39 වෙනුවට ඉදිරිපත් කර ඇත. හානිකරනය වර්ගීකරණය සහ මැණීමේ සහ මතු සුරක්ෂණ ගිණුම්කරණය පිළිබඳ නව අවශ්‍යතාවයන් ප්‍රමිතිය මගින් හඳුන්වා දී ඇත. පෙර භාවිතයට අවසර ලබාදෙමින්, 2018 ජනවාරි 01 දායින් පසුව ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා බලාත්මක වේ. අතීතයට බලපාන ලෙස භාවිත කිරීම අවශ්‍ය වේ. නමුත් සංසන්දනාත්මක තෙරතුරු අනිවාර්ය නොවේ. **ශ්‍රීලමූවාප්‍ර** 9 මගින් වියහැකි බලපෑමේ ප්‍රමාණය කළමණාකරණය විසින් තීරණය කල යුතුව ඇත..

ශ්‍රීලමූවාප්‍ර 15 ගණුදෙනුකරුවන් සමග ඇති ගිවිසුම් වලින් අයභාරය

ගණුදෙනුකරුවකු සමග ඇති ගිවිසුම් මගින් ජනනය වන අයභාරයේ සහ මුදල් ප්‍රවාහයන්ගේ ස්වභාවය, ප්‍රමාණය, කාලය සහ අවිනිශ්චිතතාවය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට ප්‍රයෝජනවත් තොරතුරු වාර්තා කිරීම සඳහා ආයතනයක් විසින් අනුගමනය කලයුතු මූලධර්ම සකස්කිරීම මෙම ප්‍රමිතියේ අරමුණ වේ. **ශ්‍රීලමූවාප්‍ර** 15 2018 ජනවාරි 01 දින බලාත්මක වන අතර **ශ්‍රීලමූවාප්‍ර** 15 මගින් වියහැකි බලපෑමේ ප්‍රමාණය කළමණාකරණය විසින් තීරණය කල යුතුව ඇත..

ශ්‍රීලමූවාප්‍ර 16 කල්බදු

2016 ජනවාරියේ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් කල්බදු ගිණුම්කරනය සඳහා **ශ්‍රීලමූවාප්‍ර** 16 කල්බදු බව ප්‍රමිතය නිතුත්කර ඇත. නව ප්‍රමිතය මගින් කල්බදු දීමනාකරුවන් සඳහා කල්බදු ගිණුම් කරණය සැලකියයුතු ලෙස වෙනස් කර නැත. කෙසේ නමුත් කල්බදු ගැණුම් කරුවන්ට ඔවුන්ගේ ශේෂපත්‍ර වල පාවිච්චි කිරීමට ඇති අයිතිය අනුරූපිත වත්කමක් ලෙස ගෙන, වගකීම් ලෙස හඳුනාගැනීමට අවශ්‍ය වේ. සියලුම හඳුනාගත් කල්බදු සඳහා කල්බදු ගැණුම් කරුවන් විසින් එක් ආකෘතියක් යොදාගත යුතු නමුදු, "කෙටිකාලීන" කල්බදු සහ "අඩු වටිනාකම්" සහිත වත්කම් හඳුනා නොගැනීමට, තෝරාගැනීමක් කල හැක. සාමාන්‍යයෙන් හඳුනාගත් කල්බදු සඳහා ලාභ හෝ අලාභ හඳුනාගැනීමේ රටාව, වර්තමානයේ මූල්‍ය කල්බදු ගිණුම්කරනයට සමානවනු ඇති අතර, පොලී සහ ක්ෂය වියදම් ලාභාලාභ ප්‍රකාශයේ වෙන් වෙන්ව හඳුනාගනු ලබයි..

2019 ජනවාරි 01 දායින් පසුව ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා ශ්‍රීලමූවාප්‍ර 16 බලාත්මක වේ. පෙර භාවිතයට අවසර ඇති නමුදු අස්තිත්වය විසින් ජාමූවාප්‍ර 15 භාවිතයට පෙර නොවිය යුතුය. අතීතයට බලපාන ලෙස භාවිත කිරීම හෝ වැඩි දියුණු කරන ලද ක්‍රමවේදයක් යොදාගනිමින් ප්‍රමිතය භාවිත කිරීම සඳහා කල්බදු ගැණුම් කරුට තෝරාගත හැක. ප්‍රමිතයේ සංක්‍රාන්ති ප්‍රතිපාදනයන් යම් සහනයක් සලසයි..

ශ්‍රීලමූවාප්‍ර 16 මගින් වියහැකි බලපෑමේ ප්‍රමාණය කළමණාකරණය විසින් තීරණය කල යුතුව ඇත.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ශ්‍රීලගිප්‍ර 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශය ට සංශෝධන

මූල්‍ය ක්‍රියාකාරකම් වල හෙළිදරව් කිරීම් වැඩිදියුණු කිරීමේ සහ වාර්තාකරන අස්ථිත්වයේ ද්‍රවශීලතා තත්වය පිළිබඳව භාවිතාකරන්නන්ට හොඳින් වටහාගැනීමට උදව් කිරීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2016 සැප්තැම්බර් මස ශ්‍රීලගිප්‍ර 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශය ට සංශෝධනයන් නිකුත් කර ඇත. නව අවශ්‍යතාවයන් යටතේ මුදල් ප්‍රවාහයන් සහ මුදල් නොවන අයිතමයන්ගේ වෙනස්කම් වැනි මූල්‍ය ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් වශයෙන් අස්ථිත්වයන්ගේ මූල්‍ය වගකීම්වල සිදුවන වෙනස්කම් අස්ථිත්වයන් විසින් හෙළදරව් කල යුතුය. (උදා: විදේශ විනිමය චලනයන් හේතුවෙන් ඇතිවන ලාභ සහ අලාභ) සංශෝධනයන් 2017 ජනවාරි 01 දින බලාත්මක වේ..

අගිප්‍ර 12 ආදායම් බදු ට සංශෝධන

2016 සැප්තැම්බර් මස්දී අගිප්‍ර 12 ට සංශෝධනයක් ඉදිරිපත් කිරීම තුලින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ගිණුම් කරණය සඳහා සාධාරණ අගයටත්, බදු කටයුතු සඳහා පිරිවැයටත් මනින ලද ණය සාධන පත්‍රවල විලම්බිත බදු වත්කම් සඳහා වන ගිණුම්කරණ ක්‍රමය පැහැදිලි කරයි. සංශෝධනයන් 2017 ජනවාරි 01 දින බලාත්මක වේ. සංශෝධනය යොදාගැනීමෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශ වලට බලපෑමක් ඇතිවනු ඇතැයි අපේක්ෂා නොකෙරේ..

2.7.1 පොදු භාවිත පහසුකම් -කොටස් හිමියන්ගේ ගිවිසුම සහ කොටස් විකුණුම් මිලට ගැනීමේ ගිවිසුම කල් ඉකුත්වීම

ලංකා බණිජතෙල් සංස්ථාව, ලංකා ඉන්දියන් තෙල් සමාගම පීඑල්සී, සිලෝන් පෙට්‍රොලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් කොටස් හිමියන්ගේ ගිවිසුම සහ කොටස් විකුණුම් මිලට ගැනීමේ පොදු භාවිත පහසුකම් ගිවිසුම 2008 දෙසැම්බර් 31 දා කල් ඉකුත් විය. එම ගිවිසුම අළුත් කිරීම හෝ දීර්ඝ කිරීම තවම අවසන් කොට නොමැති අතර එම ගිවිසුමේ කොන්දේසි සහ සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලද යම් පසුකාලීන වෙනස්කම් සැලකිල්ලට ගැනීමෙන් පසු, මෙම ගිවිසුමට අදාල ආදායම් වියදම් මෙම මූල්‍ය ප්‍රකාශ වල ගිණුම්ගත කර ඇත.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2016 රු.	2015 රු
3.	**අයභාරය**		
3.1	**ප්‍රධාන අයභාරය**		
	පර්යන්ත ආදායම	6,622,880,272	6,098,040,636
	මෙහෙයුම් ආන්තිකය	2,958,442,733	2,695,361,782
	ප්‍රතිපූර්ණ කල හැකි පොලිය	642,628,413	578,629,916
		10,223,951,417	9,372,032,334
	සේවා සැපයීම		
	ප්‍රවාහන ආදායම	2,439,493,091	2,268,679,970
	තෙල් නැව් මෙහෙයුම්	-	46,550,843
		2,439,493,091	2,315,230,813
	මුළු අයභාරය	12,663,444,509	11,687,263,147

		2016 රු.	2015 රු
4	**වෙනත් මෙහෙයුම් ආදායම්**		
	කාර්ය මණ්ඩල ණය සහ වෙනත් දෑ මත පොලිය	315,980,353	214,374,623
	දේපල, පිරියත සහ උපකරණ විකිණීම මත ලාභය	51,245,219	8,312,102
	කුලි ආදායම්	9,557,417	9,072,085
	නිදහස් කිරීමේ ගාස්තු	2,700,000	4,630,000
	විවිධ ආදායම්	99,670,252	63,566,925
	සංචාරක බංගලා ආදායම	882,205	667,200
	ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු	3,165,029	2,077,535
		483,200,474	302,700,470

		2016 රු.	2015 රු
5.	**මූල්‍ය ආදායම් සහ වියදම්**		
	මූල්‍ය ආදායම්		
5.1	ප්‍රති ආයෝජන **(REPO)** මත පොලිය	84,761,790	25,810,176
	ස්ථාවර තැන්පත් ආයෝජන මත පොලිය	5,608,006	6,503,996
		90,369,796	32,314,172

		2016 රු.	2015 රු
5.2	**මූල්‍ය වියදම්**		
	බැංකු ණය පොලිය	166,775,397	233,560,311
		166,775,397	233,560,311

		2016 රු.	2015 රු
6.	**බදු පෙර ලාභය**		
	පහත දෑ අයකිරීමෙන්/බැර කිරීමෙන් පසු		
	සෘජු වියදම් තුල ඇතුලත් දෑ		
	කාර්යමණ්ඩල පිරිවැය	2,329,533,369	2,288,315,179
	වර්ෂය සඳහා ක්ෂයවීම්	694,018,639	725,724,503
	පරිපාලන වියදම් තුල ඇතුලත් දෑ		
	අධ්‍යක්ෂ පාරිශ්‍රමික	5,322,273	1,166,634
	අධ්‍යක්ෂ ගාස්තු	2,030,000	1,165,000
	කාර්යමණ්ඩල පිරිවැය	3,130,050,416	2,759,854,088
	නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් : වර්ෂය සඳහා අයකිරීම	204,224,090	179,691,609
	විගණන ගාස්තු - ප්‍රවර්තන වර්ෂය	1,766,371	1,310,000
	වර්ෂය සඳහා ක්ෂයවීම්	106,921,418	99,179,320
	වර්ෂය සඳහා ක්‍රමක්ෂය	9,740,641	30,007,859
	වෙළඳ සහ අනෙකුත් ලැබියයුතු දෑ හානිකරන දීමනාව	11,645,362	30,681,810
	තොග අඩි ප්‍රතිපාදන ප්‍රතිවර්තන	(50,699,287)	-

7. බදු වියදම්

2016 දෙසැම්බර් 31 සහ 2015 දෙසැම්බර් 31 දායින් අවසන් වර්ෂ සඳහා වන බදු වියදමෙහි ප්‍රධාන අංගයන් :

		2016 රු.	2015 රු
7.1	**ආදායම් ප්‍රකාශය**		
	ප්‍රවර්තන ආදායම් බද්ද:		
	ප්‍රවර්තන බදු වියදම	182,283,884	213,260,299
	පෙර වර්ෂය වෙනුවෙන් ප්‍රවර්තන බදු ඌන / (අධි) වෙන්කිරීම	45,781,512	16,124,288
	විලම්බිත බදු:		
	විලම්බිත බදු අයකිරීම / (බැර) (සටහන 8)	363,378,298	112,278,122
	ආදායම් ප්‍රකාශයේ වාර්තා කරන ලද ආදායම් බදු වියදම/ (බැර)	591,443,694	341,662,709

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

7. බදු වියදම් (පසු සිදුවීම්)

7.2 2016 දෙසැම්බර් 31 සහ 2015 දෙසැම්බර් 31 දායින් අවසන් වර්ෂ සඳහා වන බදු වියදම සහ ගිණුම්කරණ ලාභය ව්‍යවස්ථාපිත බදු අනුපාතයෙන් ගුණ කිරීමෙන් ලද ඵලය අතර සැසඳුම පහත දැක්වේ :

	2016 රු.	2015 රු.
බදු පෙර ගිණුම්කරණ ලාභය	2,330,073,120	1,715,646,470
ඉඩ නොදෙන ලද සමස්ත අයිතමයන්	1,277,272,984	1,163,452,486
ඉඩ දෙන ලද සමස්ත අයිතමයන්	(1,591,594,363)	(1,457,744,572)
	2,015,751,741	1,421,354,384
පොළි ආදායම	406,350,149	351,081,689
මුළු ව්‍යවස්ථාපිත ආදායම	2,422,101,890	1,772,436,073
අඩුකළා: ඉදිරියට ගෙන ආ නාවිතකල බදු අලාභ	(847,735,662)	(620,352,625)
බද්දට යටත්වන ලාභය	1,574,366,228	1,152,083,448
බද්දට යටත්වන ලාභය සඳහා ආදායම් බදු	182,283,884	115,208,345
බෙදාහැරිය හැකි ලාභය මත බදු	-	98,051,954
ප්‍රවර්තන ආදායම් බදු වියදම	182,283,884	213,260,299

8. විලම්බිත බදු වගකීම්

8.1 විලම්බිත බදු

විලම්බිත බදු වත්කම්, වගකීම් සහ ආදායම් බදු පහත දෑ සමඟ සම්බන්ධ වේ. ;

	මූල්‍ය තත්ව ප්‍රකාශය		විස්තීර්ණ ආදායම් ප්‍රකාශය		වෙනත් විස්තීර්ණ ආදායම්	
	2016 රු.	2015 රු.	2016 රු.	2015 රු.	2016 රු.	2015 රු.
විලම්බිත බදු වගකීම්						
බදු කාර්යයන් සඳහා ප්‍රාග්ධන දීමනා	1,246,080,289	889,659,540	356,420,749	53,136,993	-	-
අස්පෘෂ්‍ය වත්කම්	1,042,436	1,734,966	(692,530)	(3,000,786)	-	-
	1,247,122,725	891,394,506				
විලම්බිත බදු වත්කම්						
තොග වෙන් කිරීම්	18,183,253	19,554,580	1,371,327	265,825	-	-
ප්‍රතිපාදනයන්	25,338,449	17,205,775	(8,132,674)	(3,011,634)	-	-
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්	169,067,700	138,563,433	(63,913,598)	(8,042,309)	33,409,331	3,709,307
බදු අලාභ වල බලපෑම	28,776,108	107,101,133	78,325,025	72,930,033	-	-
	241,365,510	282,424,921				
විලම්බිත ආදායම් බදු - ආදායම			363,378,298	112,278,122	33,409,331	3,709,307
ශුද්ධ විලම්බිත බදු වගකීම් /(වත්කම්)	1,005,757,215	608,969,585				

8.2 ඵලදායී බදු අනුපාතයක් භාවිත කරමින් විලම්බිත බදු ගණනය කර ඇත. බදු අයකලහැකි ආදායමේ වෙනස් මට්ටම් වලට භාවිත කල විවිධ බදු අනුපාත හේතුවෙන්, 2016 දෙසැම්බර් 31 දිනට රු. 271,627,861 ක වැඩි වූ විලම්බිත බදු ඇතිකරමින්, බදු අනුපාතය 10% සිට 13.70% දක්වා වැඩිවිය..

9. කොටසක ඉපයුම

9.1 කොටසක ඉපයුම ගණනය කරනු ලබන්නේ, සාමාන්‍ය ඝකන්ධ ප්‍රාග්ධන හිමිකරුවන්ට ආරෝපිත, කාල පරිච්ඡේදය සඳහා වන ශුද්ධ ලාභය, වර්ෂය තුල බරතැබූ සාමාන්‍ය කොටස් ගණනින් බෙදීමෙනි. ප්‍රසාද නිකුතුවක් වැනි, සම්පත් වල අනුරූපී වෙනසක් රහිතව පවතින සාමාන්‍ය කොටස් ගණන වෙනස් කරන සිදුවීම් සඳහා කාල පරිච්ඡේදය තුල සහ පෙර කාල පරිච්ඡේදවල පවතින බරතැබූ සාමාන්‍ය කොටස් ගණන ගලපනු ලබයි..

9.2 කොටසක ඉපයුම ගණනය කිරීම සඳහා යොදාගත් ආදායම් සහ කොටස් දත්තයන් පහත දැක්වේ.

	2016 රු.	2015 රු.
ලවය වශයෙන් යොදාගත් සංඛ්‍යාවන්		
මූලික කොටසක ඉපයුම සඳහා සාමාන්‍ය කොටස් කරුවනට හිමි ශුද්ධ ලාභය	1,738,629,426	1,373,983,761
හරය වශයෙන් යොදාගත් සංඛ්‍යාවන්:		
මූලික කොටසක ඉපයුමට අදාලවන නිකුත්ව ඇති බරතැබූ සාමාන්‍ය කොටස් ගණන	750,000,000	750,000,000
කොටසක ඉපයුම	2.32	1.83

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

10. දේපල, පිරියත සහ උපකරණ

10.1 දළ ධාරණ ගණන

පිරිවැයට	01.01.2016 දිනට ශේෂය	එකතු කිරීම්	ඉවත් කිරීම්	31.12.2016 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.
සිත්නක්කර ඉඩම්	4,472,982,899	24,018,764	-	4,497,001,663
සිත්නක්කර ගොඩනැගිලි	1,544,180,342	2,220,297	-	1,546,400,639
ගබඩා ටැංකි	6,490,993,653	-	-	6,490,993,653
මෝටර් වාහන	1,211,160,119	101,043,398	(90,363,088)	1,221,840,429
නල මාර්ග	7,386,343,576	-	-	7,386,343,576
ලී බඩු, සවිකිරීම් සහ උපකරණ	1,979,027,186	90,080,734	(1,898,793)	2,067,209,127
පරිගණක	159,569,210	6,082,067	(1,979,320)	163,671,957
තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව	2,800,409,453	-	-	2,800,409,453
පොම්ප සහ ගැන්ට්‍රි	1,396,756,597	57,696,023	-	1,454,452,620
ක්ෂය කලහැකි වත්කම් සඳහා මුළු පිරිවැය	27,441,423,035	281,141,284	(94,241,201)	27,628,323,11
ප්‍රාග්ධන නොනිමි	165,273,617	632,270,251	-	797,543,868
	27,606,696,652	913,411,535	(94,241,201)	28,425,866,986

10.2 ක්ෂයවීම්

පිරිවැයට	01.01.2016 දිනට ශේෂය	වසරට අයකිරීම	ඉවත් කිරීම්	31.12.2016 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.
සිත්නක්කර ගොඩනැගිලි	490,382,033	44,156,309		534,538,342
ගබඩා ටැංකි	2,116,074,608	158,436,677		2,274,511,285
මෝටර් වාහන	1,189,047,766	17,715,252		1,116,399,930
නල මාර්ග	2,381,040,444	273,075,707	(90,363,088)	2,654,116,151
ලී බඩු, සවිකිරීම් සහ උපකරණ	1,736,947,951	54,704,511		1,789,779,856
පරිගණක	142,226,390	8,060,598	(1,872,606)	148,307,668
තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව	1,994,922,995	160,547,288	(1,979,320)	2,155,470,283
පොම්ප සහ ගැන්ට්‍රි	868,644,550	84,243,717		952,888,267
	10,919,286,737	800,940,058	(94,215,014)	11,626,011,781

10.3 ශුද්ධ පොත් වටිනාකම

	2016 රු.	2015 රු.
සිත්නක්කර ඉඩම්	4,497,001,663	4,472,982,899
සිත්නක්කර ගොඩනැගිලි	1,011,862,298	1,053,798,309
ගබඩා ටැංකි	4,216,482,368	4,374,919,045
මෝටර් වාහන	105,440,500	22,112,353
නල මාර්ග	4,732,227,425	5,005,303,132
ලී බඩු, සවිකිරීම් සහ උපකරණ	277,429,271	242,079,235
පරිගණක	15,364,289	17,342,820
තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව	797,543,868	805,486,458
පොම්ප සහ ගැන්ට්‍රි	501,564,353	528,112,047
ප්‍රාග්ධන නොනිමි	644,939,170	165,273,617
දේපල, පිරියත සහ උපකරණ ධාරණ අගය	16,799,855,205	16,687,409,915

10.4 මූල්‍ය වර්ෂය තුලදී, සමස්ථ වටිනාකම රු. 913,411,535/-(2015 : රු. 223,888,948/-) ක් වූ දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගෙන ඇත. දේපල, පිරියත සහ උපකරණ මිලට ගැනීම සඳහා වර්ෂය තුලදී රු. 913,411,535/-(2015 : රු. 223,888,948/-) ක් වන මුදල් ගෙවීම් සිදුකර ඇත.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

10. දේපල, පිරියත සහ උපකරණ (පසු පිටුව සිට.....)

10.5 වත්කම් වල ඵලදායී ජීව කාලයන් පහත පරිදි ඇස්තමේන්තු කර ඇත.:	**2016**	**2015**
නිදහස් ගොඩනැගිලි	වසර 35	වසර 35
ගබඩා ටැංකි	වසර 40	වසර 40
විශාල ටැංකි	වසර 30	වසර 30
නල මාර්ග	වසර 30	වසර 30
පොම්ප	වසර 20	වසර 20
වාහන		
- නව අත්පත්කර ගැනීම්	වසර 5	වසර 5
- පැවරුනූ අයිතමයන්	පලදායී ජීව කාලය තුල	
පිරවුම් ගෑන්ට්‍රි	වසර 15	වසර 15
උපකරණ		
- විද්‍යුත්	වසර 5	වසර 5
- වෙනත්	වසර 10	වසර 10
ලී බඩු, සවිකිරීම්		
- දැඩි	වසර 5	වසර 5
- වෙනත්		
මුතුරාජවෙල වෙනත් වත්කම්		
- තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව	වසර 10	වසර 10
- PLEM	වසර 10	වසර 10
- නල මාර්ග	වසර 20	වසර 20
පරිගණක	වසර 04	වසර 04

11. අස්පෘශ්‍ය වත්කම්

11.1 දළ ධාරණ ගණන්	**ERP පද්ධතිය**	**SAP ERP බලපත්‍රය**	**අක්වෙරල නල මාර්ග ස්වයංක්‍රියාකරන පද්ධතිය**	**එකතුව**
පිරිවැයට	**රු.**	**රු.**	**රු.**	**රු.**
01.01.2016 දිනට	412,496,596	9,380,250	37,793,560	459,670,406
එකතු කිරීම්	-	-	-	-
ඉවත් කිරීම්	-	-	-	-
31.12.2016 දිනට	412,496,596	9,380,250	37,793,560	459,670,406

11.2 ක්‍රමක්ෂය	**ERP පද්ධතිය**	**SAP ERP බලපත්‍රය**	**අක්වෙරල නල මාර්ග ස්වයංක්‍රියාකරන පද්ධතිය**	**එකතුව**
පිරිවැයට	**රු.**	**රු.**	**රු.**	**රු.**
01.01.2016 දිනට	411,609,815	6,110,811	24,600,119	442,320,745
වර්ෂය සඳහා අය කිරීම	304,492	1,876,329	7,559,821	9,740,642
31.12.2016 දිනට	411,914,307	7,987,140	32,159,940	452,061,387
11.3 31.12.2015 දිනට ශුද්ධ පොත් අගය	886,781	3,269,439	13,193,441	17,349,661
11.4 31.12.2016 දිනට ශුද්ධ පොත් අගය	582,289	1,393,110	5,633,620	7,609,019

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

12. තොග	2016 රු.	2015 රු.
ඇළුත්වැඩියා සඳහා වන සාමාන්‍ය ද්‍රව්‍ය	281,082,833	261,435,077
මෝටර් රථ අමතර කොටස්	235,671,113	227,051,760
පාරිභෝජන ද්‍රව්‍ය	23,843,424	21,335,323
නිමි භාණ්ඩ		
ලංකා පෙට්‍රල් LP-95	788,088	788,088
ලංකා පෙට්‍රල් LP-92	998,244	285,363
ලංකා ඔටෝ ඩීසල් -LAD	3,390,178	6,860,983
ගබඩා ඉවතලන අයිතමයන් (වෙන්දේසි ගුදම)	-	6,625,632
	545,773,881	524,382,226
භාවිතය අඩු තොග සඳහා වෙන් කිරීම	(132,724,473)	(195,545,796)
	413,049,408	328,836,430

13. වෙළඳ සහ වෙනත් ලැබිය යුතු	2016 රු.	2015 රු.
වෙළඳ ලැබිය යුතු - ආශ්‍රිත පාර්ශවයන්ගෙන් (සටහන 13.1)	4,959,265,019	6,242,682,261
වෙනත් ලැබිය යුතු	86,651,420	15,988,434
(-) වෙනත් ලැබිය යුතු - හානිකරනය	(10,956,035)	(1,514,370)
	75,695,385	14,474,064
තැන්පත්, අත්තිකාරම් සහ ඉදිරියට කල ගෙවීම් සටහන (සටහන 13.3)	986,106,746	946,013,688
	6,021,067,151	7,203,170,013

13.1 වෙළඳ ලැබිය යුතු - ආශ්‍රිත පාර්ශවයන්ගෙන්	සම්බන්ධතාවය	2016 රු.	2015 රු.
ලංකා බණිජතෙල් සංස්ථාව	මව් සමාගම	4,857,213,146	6,164,223,128
(-) වෙළඳ ලැබිය යුතු - හානිකරනය		(163,620,550)	(163,620,550)
ලංකා බණිජතෙල් සංස්ථාව හානිකරනයෙන් පසු (සටහන 13.2)		4,693,592,596	6,000,602,578
ලංකා ඉන්දියන් තෙල් සමාගම	වෙනත් ප්‍රධාන කොටස් හිමියෙකි	266,162,561	242,569,821
(-) වෙළඳ ලැබිය යුතු - හානිකරනය		(490,138)	(490,138)
ලංකා ඉන්දියන් තෙල් සමාගම හානිකරනයෙන් පසු (සටහන 13.2)		265,672,423	242,079,683
		4,959,265,019	6,242,682,261

13.2 2016 දෙසැම්බර් 31 දිනට වෙළඳ ලැබිය යුතු වයස් විශ්ලේෂණය පහත දක්වා ඇත..

	එකතුව	දින 0-30	දින 61-90	දින 91-180 days	දින 181-365	දින 365 වැඩි
ලංකා බණිජතෙල් සංස්ථාව	4,857,213,146	885,745,643	2,784,543,227	418,986,582	201,012,177	566,925,518
හානිකරනය	(163,620,550)	-	-	-	-	(163,620,550)
	4,693,592,596	885,745,643	2,784,543,227	418,986,582	201,012,177	403,304,968
ලංකා ඉන්දියන් තෙල් සමාගම	266,162,561	106,669,124	30,127,373	(137,900,010)	102,709,038	164,557,036
හානිකරනය	(490,138)	-	-	-	-	(490,138)
	265,672,423	106,669,124	30,127,373	(137,900,010)	102,709,038	164,066,898

13.3 තැන්පත්, අත්තිකාරම් සහ ඉදිරියට කල ගෙවීම්	2016 රු.	2015 රු.
තැන්පත්, ඉදිරියට කල ගෙවීම් සහ අත්තිකාරම්	164,204,803	207,446,798
ඉදිරියට ගෙවූ සේවක ප්‍රතිලාභ	821,901,943	738,566,890
	986,106,746	946,013,688

14. වෙනත් මූල්‍ය වත්කම් සමාගමේ නිළධාරීන්ට ණය	2016 රු.	2015 රු.
මෝටර් වාහන	180,560,299	198,327,521
නිවාස ණය	1,029,539,880	1,098,612,144
ආපදා ණය	832,415,029	746,725,332
වෙනත් ණය	329,263,616	249,315,006
ණය	2,371,778,824	2,292,980,003
(-) හානිකරනය සඳහා දීමනාව	(9,885,461)	(7,947,064)
	2,361,893,363	2,285,032,939

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

14. වෙනත් මූල්‍ය වත්කම් (පසු පිටුව සිට.....)

14.1 ජංගම නොවන මූල්‍ය වත්කම්

	2016 රු.	2015 රු.
මෝටර් වාහන ණය	101,160,148	122,835,720
නිවාස ණය	350,449,363	275,496,701
(-)හානිකරනය සඳහා දීමනාව	(9,885,461)	(7,947,064)
	441,724,050	390,385,357

14.2 ජංගම මූල්‍ය වත්කම්

	2016 රු.	2015 රු.
මෝටර් වාහන ණය	79,400,152	75,491,801
නිවාස ණය	679,090,517	823,115,443
ආපදා ණය	832,415,029	746,725,332
වෙනත් ණය	329,263,615	249,315,006
	1,920,169,313	1,894,647,582

15. මුදල් සහ මුදල් සමාන ද්‍ය

	2016 රු.	2015 රු.
15.1 වාසි සහගත මුදල් සහ මුදල් සමාන ද්‍ය		
මුදල් සහ බැංකු ශේෂ	8,751,382	33,481,069
කෙටි කාලීන ආයෝජන	2,446,665,800	714,484,852
	2,455,417,182	747,965,921
15.2 අවාසි සහගත මුදල් සහ මුදල් සමාන ද්‍ය		
බැංකු අයිරාව (සටහන 18)	(111,314,311)	-
මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා එකතු මුදල් සහ මුදල් සමාන ද්‍ය	2,344,102,871	747,965,921

16. ප්‍රකාශිත ප්‍රාග්ධනය

	2016		2015	
	සංඛ්‍යාව	රු.	සංඛ්‍යාව	රු.
සම්පූර්ණයෙන් ගෙවූ සාමාන්‍ය කොටස්	750,000,000	7,500,000,000	750,000,000	7,500,000,000

16.1 ප්‍රාග්ධන සංචිත

සංස්ථාපනය කරන අවස්ථාවේ සහ ලංකා ඛණිජතෙල් සංස්ථාවෙන් වත්කම් පවරන අවස්ථාවේ රු. 979,000,000 ක ප්‍රාග්ධන සංචිතයක්, ප්‍රාග්ධනීකරන ක්‍රියාවලියේ කොටසක් ලෙස ගොඩනැගී ඇත..

17. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්

	2016 රු.	2015 රු.
ජනවාරි 01 දිනට ශේෂය	1,385,634,331	1,342,304,309
ප්‍රවර්තන සේවා පිරිවැය පොලිය	65,220,386	76,765,263
පිරිවැය	139,003,704	102,926,346
ආයුගණක (ලාභ) / පාඩු	(243,863,733)	(37,093,073)
ගෙවූ ප්‍රතිලාභ	(111,923,886)	(99,268,514)
දෙසැම්බර් 31 දිනට ශේෂය	1,234,070,802	1,385,634,331

17.1 2016 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ප්‍රතිලාභ බැඳීමෙහි ආයුගණක තක්සේරුකරනය වෘත්තීය ආයුගණක ආයතනයක් වන සී/ස මැනේජ්මන්ට් කොන්සල්ටන්ට් (පුද්) විසින් ශ්‍රීලංකීප්‍ර 19 "සේවක ප්‍රතිලාභ" මගින් නිර්දේශකර ඇති පරිදි "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිතාකරමින් සිදුකර ඇත. 2016 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සූත්‍ර ක්‍රමය භාවිතාකරමින් නිශ්චය කර ඇත.

17.2 ප්‍රධාන ආයුගණක උපකල්පන

තක්සේරුකරණයට පාදක වූ ප්‍රධාන ආයුගණක මූල්‍ය උපකල්පන මෙසේය.:

	2016	2015
වට්ටම් අනුපාතය	12.80%	10%
වැටුප් වර්ධක අනුපාතය	වර්ෂ තුනකට වරක් 30%	10%
සේවක පිරිවැටුම	1%	1%

17.3 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සැලසුමෙහි කල්පිරීමේ ආකෘතිය

	2016 රු.
වසර 1 ට වඩා අඩු	113,673,011
වසර 1 2 අතර	154,386,941
වසර 2 5 අතර	309,075,055
වසර 5 ට වඩා වැඩි	656,935,794
	1,234,070,801

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

17. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් (පසු පිටුව සිට.....)

වාර්තාකරන කාලපරිච්ඡේදය අවසානයේ දී නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සැලසුමෙහි සාමාන්‍ය කාලසීමාව විධායක සේවකයින් සඳහා වර්ෂ 6. 3 ක් සහ විධායක නොවන සේවකයින් සඳහා වර්ෂ 7. 2 ක් විය. ඉතිරිව පවතින සාමාන්‍ය සේවාකාලය විධායක සේවකයින් සඳහා වර්ෂ 11. 08 ක් සහ විධායක නොවන සේවකයින් සඳහා වර්ෂ 12. 33 ක් විය.

17.4 ආයුගණක තක්සේරුකරනයේ දී යොදාගත් උපකල්පන වල සංවේදීතාවය

අනෙකුත් සියලුම විචල්‍යයන් ස්ථාවරව පවතින විට, 2016 වර්ෂය සම්බන්ධයෙන් සේවක ප්‍රතිලාභ වගකීම් මිනුම් කිරීමේ දී යොදාගත් ප්‍රධාන උපකල්පනයන්ගේ සිදුවිය හැකි සාධාරණ වෙනස්කම්වලට සංවේදීතාවය පහත වගුව මගින් ගෙනහැර දක්වයි.

සංවේදීතා මට්ටම	වර්ධම් අනුපාතය වැඩිවීම	අඩුවීම	අනාගත වැටුප් වර්ධක අනුපාතය වැඩිවීම	අඩුවීම
	1%	-1%	1%	-1%
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත ඇති බලපෑම	(1,159,917,535)	1,317,266,407	1,257,751,474	(1,210,953,719)

18. පොළී සහිත ණය සහ ණය ගැනීම්

	2016 වර්ෂයක් තුල ආපසු ගෙවිය යුතු	2016 වර්ෂයකට පසු ආපසු ගෙවිය යුතු	2016 එකතුව	2015 වර්ෂයක් තුල ආපසු ගෙවිය යුතු	2015 වර්ෂයකට පසු ආපසු ගෙවිය යුතු	2015 එකතුව
	රු	රු	රු	රු	රු	රු
බැංකු ණය (18.1)	487,800,000	911,050,854	1,398,850,854	781,660,127	1,398,850,855	2,180,510,982
බැංකු අධිරා (15.2)	111,314,311	-	111,314,311	-	-	-
	599,114,311	911,050,854	1,510,165,166	781,660,127	1,398,850,855	2,180,510,982

** ඉහත බැංකු අධිරාව මගින් නිරූපනය වන්නේ 2016 දෙසැම්බර් 31 දිනට ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල චෙක්පත්ය..

18.1 බැංකු ණය

	01.01.2016 දිනට	ලබාගත් ණය	ආපසු ගෙවීම්	31.12.2016 දිනට
	රු	රු	රු	රු
එක්සිම් බැංකුව	285,704,627	-	(285,704,627)	-
මහජන බැංකුව	1,894,806,355	-	(487,800,000)	1,398,850,854
	2,180,510,982	-	(773,504,627)	1,398,850,854

18. බැංකු ණය වලට අදාල නියමයන් සහ කොන්දේසි පහත විස්තර කර දක්වා ඇත..

	පහසුකමෙහි ස්වභාවය	පහසුකමෙහි අරමුණ	පොළී අනුපාතය සහ ආපසු ගෙවීමේ නියමයන්	ඇප
එක්සිම් බැංකුවෙන් කාල ණය		මුතුරාජවෙල ටැංකි අංගනය ව්‍යාපෘතිය මූල්‍යනය කිරීමට	වාරික 24 ප්‍රධාන ආදායම් ගාස්තු සහ ප්‍රවාහන ආදායම්	ශ්‍රී ලංකා රජය මගින් ඇපකරය ලබා දී ඇත.
මහජන බැංකුවෙන් කාල ණය (රු බිලියන 4.6)		මුතුරාජවෙල එකස්ථාන ස්ථාපනය කර ඇති පාවෙන බෝයාව සහ අක්වෙරළ ඉන්ධන නලමාර්ග ව්‍යාපෘතිය මූල්‍යනය කිරීමට.	AWPLR +2.5%, රු මිලියන 40.65 බැගින් මාසික වාරික 113, මාස 6 ක අනුග්‍රාහක කාලයක් සහිතව	ඇමරිකා ඩොලර් මිලියන 40.3 සඳහා ශ්‍රී ලංකා භාණ්ඩාගාරය මගින් ඇපකරය ලබා දී ඇත.

19. වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු

	2016 රු	2015 රු
වෙළඳ ගෙවිය යුතු - ආශ්‍රිත පාර්ශවයන්ගෙන් (19.1)	263,209,522	642,802,522
- වෙනත්	408,957,788	438,204,830
වෙනත් වෙනත් යුතු	463,220,694	396,862,863
උපචිත වියදම් ඇතුලුව විවිධ ණය හිමියෝ	175,645,494	171,575,688
	1,311,033,498	1,649,445,903

19.1 වෙළඳ ගෙවිය යුතු - ආශ්‍රිත පාර්ශවයන්ගෙන්

	සම්බන්ධතාවය	2016 රු	2015 රු
ලංකා ඛණිජතෙල් සංස්ථාව	මව් සමාගම	263,209,522	205,302,522
රාජ්‍ය භාණ්ඩාගාරය	වෙනත් ප්‍රධාන කොටස් හිමියෙකි	-	437,500,000
		263,209,522	642,802,522

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

20. ආශ්‍රිත පාර්ශවයන් හෙළිදරව් කිරීම

ගණුදෙනුවේ ස්වභාවය	මව් අස්තිත්වය - ලංකා ඛණිජතෙල් සංස්ථාව 2016 රු.	2015 රු.
ජනවාරි 01 දිනට ලැබියයුතු (ගෙවියයුතු)	5,795,300,056	7,019,703,602
ඉන්ධන ගබඩාකිරීමේ බෙදාහැරීමේ සේවාව සඳහා	13,338,654,470	12,206,438,782
ස්වයං භාවිතය සඳහා ඉන්ධන	(450,289,924)	(444,714,034)
පාරිභෝජනය පොළී ගෙවීම්	(302,846,905)	(657,120,643)
නැව් තෙල් මෙහෙයුම්	-	(50,354,353)
ලාභාංශ ගෙවීම්	-	(1,459,147,574)
වෙනත් වියදම්	(890,028)	(19,551,964)
සේවා සඳහා ලැබීම්/ (ගෙවීම්)	(13,949,544,595)	(10,765,325,712)
බොල් සහ අඩමාන ණය සඳහා අතිරේක වෙන්කිරීම්/ (ප්‍රතිවර්තන)	-	(34,628,048)
දෙසැම්බර් 31 දිනට ලැබියයුතු (ගෙවියයුතු) ගණන	4,430,383,074	5,795,300,056

දෙසැම්බර් 31 දිනට ආශ්‍රිත පාර්ශවයන්ගෙන් ලැබියයුතු හෝ ඔවුනට (ගෙවියයුතු) මුදල් මූල්‍ය ප්‍රකාශනවල සටහන් 13. 2 සහ 19. 1 හි හෙළිදරව් කර ඇත.

20.1 සමාගමේ ප්‍රධාන කළමණාකරණ පුද්ගලයින් සමග ගණුදෙනු

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් ප්‍රධාන කළමණාකරණ පුද්ගලයින් ලෙස සැලකේ. වර්ෂය තුල ප්‍රධාන කළමණාකරණ පුද්ගලයින්ට කල ගෙවීම් පහත පරිදි විය.

	2016 රු.	2015 රු.
අධ්‍යක්ෂවරුන් සඳහා ගාස්තු	2,030,000	1,165,000
අධ්‍යක්ෂ පාරිශ්‍රමිකය	5,322,273	1,166,634
	7,352,273	2,331,634

20.2 ශ්‍රී ලංකා රජය සහ එහි ආශ්‍රිත අස්තිත්වයන් සමග ගණුදෙනු
ශ්‍රී ලංකා රජය සෘජුවම මව් සමාගම පාලනය කරන නිසාවෙන් ශ්‍රී ලංකා රජය සහ රජය මගින් පාලනය කරනු ලබන, බද්ධව පාලනය කරනු ලබන හෝ රජය මගින් සැලකියයුතු බලපෑමක් සිදු කරනු ලබන වෙනත් රජය ආශ්‍රිත අස්තිත්වයන් සමාගම විසින් 24"ආශ්‍රිත පාර්ශව හෙළිදරව් කිරීම්" අනුව ආශ්‍රිත පාර්ශවයන් ලෙස සලකා ඇත.

සමාගම ශ්‍රී ලංකා රජය සහ එහි ආශ්‍රිත අස්තිත්වයන් සමග ගණුදෙනු, වැඩපිලිවෙලවල් සහ ගිවිසුම් වලට එලඹෙන අතර, සුවිශේෂී ගණුදෙනුවල ප්‍රතිපල පහත වාර්තා කර ඇත.

	ගණුදෙනුවේ ස්වභාවය	31.12.2016 දිනට
මහජන බැංකුව	බැංකුවේ ඇති මුදල්	1,799,356
මහජන බැංකුව	කෙටිකාලීන තැන්පතු	2,161,867,837
මහජන බැංකුව	බැංකු ණය	1,398,850,854
ලංකා බැංකුව	බැංකුවේ ඇති මුදල්	(109,763,906)
ලංකා බැංකුව	කෙටිකාලීන තැන්පතු	284,797,963

තවදුරටත් ශ්‍රී ලංකා රජය සහ එහි ආශ්‍රිත අස්තිත්වයන් සමග සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලට අදාලව එළඹ ඇති ගණුදෙනු විස්තරාත්මකව පහත පරිදි වේ.

ලංකා බැංකුව සහ මහජන බැංකුව සමග බැංකු ගිණුම් පවත්වාගෙනයාම සහ බැංකු ගණුදෙනු වලට එලඹීම
ව්‍යවස්ථාපිත වරිපනම් සහ බදු ගෙවීම.
ප්‍රධාන වශයෙන් දුරකථන, විදුලිය සහ ජලය ඇතුලත්වන උපයෝගිති සඳහා ගෙවීම.
සේවක විශ්‍රාම ප්‍රතිලාභ, සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ශ්‍රී ලංකා මහබැංකුවට ගෙවීම.
මෝටර් වාහන රක්ෂණ වාරික සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ගෙවීම.

වෙනත් ප්‍රධාන කොටස් හිමි - ලංකා ඉන්දියන් තෙල් සමාගම		එකතුව	
2016 රු.	**2015** රු.	**2016** රු.	**2015** රු.
242,079,683	447,901,569	6,037,379,739	7,467,605,171
1,176,372,034	837,337,821	14,515,026,504	13,043,776,603
-	-	(450,289,924)	(444,714,034)
-	-	(302,846,905)	(657,120,643)
-	-	-	(50,354,353)
-	(225,000,000)	-	(1,684,147,574)
		(890,028)	(19,551,964)
(1,152,779,295)	(818,159,707)	(15,102,323,890)	(11,583,485,419)
-	-	-	(34,628,048)
265,672,423	242,079,683	4,696,055,496	6,037,379,739

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

21. බැඳීම් සහ අසම්භාව්‍යතාවයන්

21.1 අසම්භාව්‍යතාවයන්
විසඳීමට තිබෙන නඩු

(අ) සමාගමේ නීතිඥයන්ට අනුව, පහත නඩුවල ප්‍රතිඵල, වාර්තාකරන දිනට සාධාරණ වශයෙන් නිශ්චය කර ගැනීමට නොහැක. ඒ අනුව, එම විසඳීමට තිබෙන නඩු සඳහා මෙම මූල්‍ය වාර්තාවල වෙන්කිරීමක් සිදුකර නොමැත. සමාගම, වාර්තාකරන දිනට පහත විසඳීමට තිබෙන නඩුවල ඉල්ලුම්කරුවකු හෝ වගඋත්තරකරුවකු වේ.

වර්තමානයේ පවතින තොරතුරු අනුව සහතිකයක් නොමැති වුවද, මෙම නීතිමය ක්‍රියාදාමයන්ගේ අවසාන නිගමනය, සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵල මත හෝ මූල්‍ය තත්වය හෝ ද්‍රවශීලතාවය මත සැලකියයුතු අවාසිසහගත බලපෑමක් සිදු නොකරනු ඇති බව, කළමණාකරණය විශ්වාස කරයි. ඒ අනුව, මෙම මූල්‍ය වාර්තාවල කිසිදු වගකීමක් සඳහා වෙන්කිරීමක් සිදුකර නොමැත.

2016 දෙසැම්බර් 31 දිනට විසඳීමට ඇති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු

නඩු අංකය	උසාවියේ පිහිටීම	නඩුව පිළිබඳ විස්තර	වියහැකි උපරිම ඉල්ලීමේ ප්‍රතිඵලය (2016 දෙසැම්බර් දක්වා)
SC FR 21/12	කොළඹ	A-7 ශ්‍රේණියට උසස්වීමක් බලාපොරොත්තුවීම	පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංගනයවී ඇති බව ප්‍රකාශයට පත්කිරීම සහ උසාවිය මගින් තීරණය කරන වන්දි
SC FR 275/14	කොළඹ	B-1 ශ්‍රේණියට උසස්වීමක් බලාපොරොත්තුවීම.	පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංගනයවී ඇති බව ප්‍රකාශයට පත්කිරීම සහ උසාවිය මගින් වන්දි තීරණය කිරීම
SC FR 234/15	කොළඹ	A-1 ශ්‍රේණියට උසස්වීමක් බලාපොරොත්තුවීම.	පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංගනයවී ඇති බව ප්‍රකාශයට පත්කිරීම සහ උසාවිය මගින් වන්දි තීරණය කිරීම.
SC FR 431/16	කොළඹ	A-5 ශ්‍රේණියට උසස්වීමක් බලාපොරොත්තුවීම.	පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංගනයවී ඇති බව ප්‍රකාශයට පත්කිරීම සහ උසාවිය මගින් තීරණය කරන වන්දි.
SC FR 68/16	කොළඹ	10% නොඉක්මවන කොටස් ප්‍රමාණයක් නිකුත්කරවා ගැනීමට හෝ ඊට සමාන මුදලක් සේවකයන් අතර බෙදාහැරීමට.	පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංගනයවී ඇති බව ප්‍රකාශයට පත්කිරීම, උසාවිය මගින් වන්දි තීරණය කිරීම සහ 10% නොඉක්මවන කොටස් ප්‍රමාණයක් නිකුත්කරවා ගැනීමට හෝ ඊට සමාන මුදලක් සේවකයන් අතර බෙදාහැරීමට.
SC FR 24/17	කොළඹ	A-5 ශ්‍රේණියට උසස්වීමක් බලාපොරොත්තුවීම.	පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංගනයවී ඇති බව ප්‍රකාශයට පත්කිරීම සහ උසාවිය මගින් තීරණය කරන වන්දි

2016 දෙසැම්බර් 31 දිනට විසඳීමට ඇති අභියාචනාධිකරණ නඩු

නඩු අංකය	උසාවියේ පිහිටීම	නඩුව පිළිබඳ විස්තර	වියහැකි උපරිම ඉල්ලීමේ ප්‍රතිඵලය (2016 දෙසැම්බර් දක්වා)
Writ 332/12	කොළඹ	බේරුම් කිරීමේ ප්‍රදානයකට එරෙහිව CPC මගින් ගොනුකර ඇත.	බේරුම් කිරීමේ ක්‍රියාදාමය තුල සිපිඑස්ටිඑල් පාර්ශවකරුවකු ලෙස යොදාගැනීම යම් වගකීමක් ඇත්නම් එය දැරිය යුතුවීම.
Writ 142/13	කොළඹ	PVC මගින් නිර්දේශිත උසස්වීම් ඉල්ලා සිපිඑස්ටිඑල් හි සේවකයින් 17 දෙනෙකු ගොනුකර ඇත.	සියලුම ඉල්ලුම්කරුවන් සඳහා මුළු ගෙවීම රු.13,936,944.
Writ 375/13	කොළඹ	බේරුම් කිරීමේ ප්‍රදානයකට එරෙහිව සිපිඑස්ටිඑල් මගින් ගොනුකර ඇත.	මුළු ගෙවීම රු. 19,550 X මාස 24 = රු.469,200.
Writ 56/16	කොළඹ	නිළ නිවස ප්‍රතිසේප කිරීම පිළිබඳව සේවය අවසන් කල සේවකයෙකු විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු ඉදිරියට ගෙනයෑම සඳහා ගොනුකල අභියාචනය.	උසාවිය මගින් තීරණය කරන වන්දි

2016 දෙසැම්බර් 31 දිනට විසඳීමට ඇති දිසා අධිකරණ නඩු

නඩු අංකය	උසාවියේ පිහිටීම	නඩුව පිළිබඳ විස්තර	වියහැකි උපරිම ඉල්ලීමේ ප්‍රතිඵලය (2016 දෙසැම්බර් දක්වා)
24247 /M	අනුරාධපුරය	අනතුරකින් සිදුවූ වන්දි ඉල්ලා සිපිඑස්ටිඑල් එරෙහිව ගොනුකර ඇත	රු. 3,000,000/= සහ නෛතික පොලිය , වගකීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත පැවරී ඇත.
26195/M	අනුරාධපුරය	අනතුරකින් සිදුවූ වන්දි ඉල්ලා සිපිඑස්ටිඑල් එරෙහිව ගොනුකර ඇත.	රු..10,000,000/= සහ නෛතික පොලිය වගකීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත පැවරී ඇත.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

21.1 අසම්භාව්‍යතාවයන් (පසු පිටුව සිට.....)

2016 දෙසැම්බර් 31 දිනට විසඳීමට ඇති දිසා අධිකරණ නඩු

නඩු අංකය	උසාවියේ පිහිටීම	නඩුව පිළිබඳ විස්තර	වියහැකි උපරිම ඉල්ලීමේ ප්‍රතිඵලය (2016 දෙසැම්බර් දක්වා)
11736/M	මාතර	අනතුරකින් සිදුවූ වන්දි ඉල්ලා සිපිඑස්ටිඑල් එරෙහිව ගොනුකර ඇත.	රු.1,500,000/= සහ නෛතික පොලිය වගකීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත පැවරී ඇත.
11838/M	මාතර	අනතුරකින් සිදුවූ වන්දි ඉල්ලා සිපිඑස්ටිඑල් එරෙහිව ගොනුකර ඇත.	රු.1,500,000/= සහ නෛතික පොලිය වගකීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත පැවරී ඇත.
11903/M	මාතර	අනතුරකින් සිදුවූ වන්දි ඉල්ලා සිපිඑස්ටිඑල් එරෙහිව ගොනුකර ඇත.	රු..2,000,000/= සහ නෛතික පොලිය වගකීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත පැවරී ඇත.
DMR/00353/13	මහනුවර	අනතුරකින් සිදුවූ වන්දි ඉල්ලා සිපිඑස්ටිඑල් එරෙහිව ගොනුකර ඇත.	රු.5,000,000/= සහ නෛතික පොලිය.
DMR/ 981/15	මහනුවර	අනතුරකින් සිදුවූ වන්දි ඉල්ලා සිපිඑස්ටිඑල් එරෙහිව ගොනුකර ඇත.	රු.113,914 සහ නෛතික පොලිය වගකීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත පැවරී ඇත.
DMR/ 1509/12	කොළඹ	අනතුරකින් සිදුවූ වන්දි ඉල්ලා සිපිඑස්ටිඑල් එරෙහිව ගොනුකර ඇත..	රු.21,000,000/= සහ නෛතික පොලිය වගකීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත පැවරී ඇත..
DMR/ 00062/13	කොළඹ	අනතුරකින් සිදුවූ වන්දි ඉල්ලා සිපිඑස්ටිඑල් එරෙහිව ගොනුකර ඇත..	රු.1,500,000/= සහ නෛතික පොලිය වගකීම යූනියන් ඇෂුවරන්ස් PLC වෙත පැවරී ඇත.
DMR/ 00578/16	කොළඹ	අනතුරකින් සිදුවූ වන්දි ඉල්ලා සිපිඑස්ටිඑල් එරෙහිව ගොනුකර ඇත.	රු..6,000,000 සහ නෛතික පොලිය වගකීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත පැවරී ඇත.
241/L	මිනුවන්ගොඩ	ඔප්පු කිහිපයක් නිෂ්ප්‍රභ කිරීමට.	සිපිඑස්ටිඑල් වෙත උකස්කරන ලද ඉඩම සම්ප්‍රයුක්ත භාරයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සහ උසාවිය මගින් තීරණය කරන වන්දි.

2016 දෙසැම්බර් 31 දිනට විසඳීමට ඇති මහේස්ත්‍රාත් අධිකරණ නඩු

නඩු අංකය	උසාවියේ පිහිටීම	නඩුව පිළිබඳ විස්තර	වියහැකි උපරිම ඉල්ලීමේ ප්‍රතිඵලය (2016 දෙසැම්බර් දක්වා)
33660/ 14	මාලිගාකන්ද	බේරුම්කිරීමේ ප්‍රදානයක් ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගොනුකර ඇත.	වැඩ තහනම් කල කාලසීමාව සඳහා වැටුප රු..469,200.
2868/16	මාලිගාකන්ද	සේවයෙන් නෙරපනලද සේවකයෙකු නිළ නිවසින් ඉවත් කිරීම සඳහා සිපිඑස්ටිඑල් විසින් ගොනුකර ඇත.	ප්‍රතිඵලය නොදනී.

2016 දෙසැම්බර් 31 දිනට විසඳීමට ඇති කම්කරු විනිශ්චය සහා නඩු

නඩු අංකය	උසාවියේ පිහිටීම	නඩුව පිළිබඳ විස්තර	ඉල්ලුම්කරුගේ නම	වියහැකි උපරිම ඉල්ලීමේ ප්‍රතිඵලය (2016 දෙසැම්බර් දක්වා)
1/32/12	කොළඹ	සේවයෙන් නෙරපනලද සේවකයෙකු විසින්, (2012. 03. 28 දින සිට) පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටීමින් ගොනුකර ඇත.	ඊ එම් පී ඒකනායක	පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවීම (47,540+5,250* මාස 57) රු.3,009,030.
1/87/15	කොළඹ	සේවයෙන් නෙරපනලද සේවකයෙකු විසින්, (13. 08. 2010 දින සිට) පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටීමින් ගොනුකර ඇත.	එස් කළුආරච්චි	පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවීම (රු.26,830* මාස 76) රු.2,039,080.
2/600/ 15	කොළඹ	සේවයෙන් නෙරපනලද සේවකයෙකු විසින්, (19. 05. 2011 දින සිට) පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටීමින් ගොනුකර ඇත..	ආර් හෙයියන්තුඩුව	පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවීම (රු.50,000* මාස 67) රු.3,350,000.
1/22/2016	කොළඹ	සේවයෙන් සම්ප්‍රයුක්තව නෙරපනලද සේවකයෙකු විසින්, (22. 04. 2016 දින සිට) පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටීමින් ගොනුකර ඇත..	එස් පී ඒකනායක	පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවීම, උසාවිය මගින් තීරණය පාරිතෝෂික සහ වන්දි. රු.67,676/- x මාස 08 = රු.541,408.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

21.1 අසම්භාව්‍යතාවයන් (පසු පිටුව සිට.....)

2016 දෙසැම්බර් 31 දිනට විසඳීමට ඇති කම්කරු විනිශ්චය සහා නඩු

නඩු අංකය	උසාවියේ පිහිටීම	නඩුව පිළිබඳ විස්තර	ඉල්ලුම්කරුගේ නම	වියහැකි උපරිම ඉල්ලීමේ ප්‍රතිඵලය (2016 දෙසැම්බර් දක්වා)
8/100/ 16	කොළඹ	සේවයෙන් නෙරපනලද සේවකයෙකු විසින්, (12. 08. 2016 දින සිට) පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටීමින් ගොනුකර ඇත..	කේ මන්ගලේස්වරන්	පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවීම, උසාවිය මගින් තීරණය පාරිතෝෂික සහ වන්දි. රු.48,900/-x මාස 04 = රු.195,600 + වන්දි 5,000,000/- = රු.5,195,600/-.
8/100/ 16	කොළඹ	සේවයෙන් සම්ප්‍රයුක්තව නෙරපනලද සේවකයෙකු විසින්, (22. 04. 2016 දින සිට) පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටීමින් ගොනුකර ඇත..	කේ මන්ගලේස්වරන්	පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවීම, උසාවිය මගින් තීරණය පාරිතෝෂික සහ වන්දි. රු.67,676/- x මාස 08 රු.541,408.
1/AD/44/12	කොළඹ	සේවයෙන් නෙරපනලද සේවකයෙකු විසින්, (10. 05. 2012 දින සිට) පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටීමින් ගොනුකර ඇත..	එල් පී ගාමිණී	පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවීම, රු.68,518* මාස 55 රු.3,009,030.
1/AD/ 31/14	කොළඹ	සේවයෙන් නෙරපනලද සේවකයෙකු විසින්, (22. 11. 2013 දින සිට) පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටීමින් ගොනකර ඇත..	එස් පේ ප්‍රනාන්දු	පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවීම, රු.27,390* මාස 37 රු.1,013,430.
2/AD/ 3596/12	බත්තරමුල්ල	සේවයෙන් නෙරපනලද සේවකයෙකු විසින්, (19. 05. 2016 දින සිට) පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටීමින් ගොනුකර ඇත..	එම් ඒ එස් ඩී මුණසිංහ	පසුගිය වැටුප් ද සහිතව නැවත සේවයේ පිහිටුවීම, රු.80,524* මාස 67 රු.5,395,108.

2016 දෙසැම්බර් 31 දිනට විසඳීමට ඇති කම්කරු උසාවි නඩු

නඩු අංකය	උසාවියේ පිහිටීම	නඩුව පිළිබඳ විස්තර	වියහැකි උපරිම ඉල්ලීමේ ප්‍රතිඵලය (2016 දෙසැම්බර් දක්වා)
A /3296	කොළඹ	පසුගිය වැටුප් ඉල්ලා සිටීම.	පසුගිය වැටුප් රු.18,621,568.
A /3439	කොළඹ	ඉල්ලුම් කරුවන් දෙදෙනයි. එක් සේවකයෙකු විශ්‍රාම ගොස් ඇත. උසස්වීම් සහ පසුගිය වැටුප් ඉල්ලා සිටීම.	වැටුප් වෙනස්කම් අනුව පසුගිය වැටුප් ගණනය කල යුතුය.
A /3605	කොළඹ	සේවයේ උසස්වීම් සහ පසුගිය වැටුප් ඉල්ලා සිටීම.	වැටුප් වෙනස්කම් අනුව පසුගිය වැටුප් ගණනය කල යුතුය.

(ආ) මධ්‍යම පරිසර අධිකාරියෙන් ලද එන්තරවාසිය

2015 දෙසැම්බර් 31 දින නළ මාර්ගයකින් කාන්දුවූ සහ ඉහිරුනු තෙල් සඳහා සහ එමගින් තල්දියවත්ත, උස්වැටකෙයියාව ලුනාව කලපුවට සිදුවූ හානිය සඳහා රු. 118,315,876 ක එන්තරවාසියක් මධ්‍යම පරිසර අධිකාරිය මගින් නිකුත් කර ඇත.

(ඇ) තක්සේරු වර්ෂ 2012/2013 සම්බන්ධයෙන් ආදායම් බදු තක්සේරු

T34 (2) (s) වගන්තිය යටතේ සුදුසුකම් ලබන ගෙවීමක් වශයෙන් ඉලුලුම් කල ගණනට එරෙහිව 2012/2013 සහ 2013/2014 කාලපරිච්ඡේද සඳහා ආදායම් බදු තක්සේරු ලැබී ඇත.

තක්සේරුවට අනුව ගෙවිය යුතු ගණන රු. 211,197,259 කි. ඉහත සඳහන් තක්සේරුවට එරෙහිව සමාගම අභියාචනයක් කර ඇති අතර, වැඩිදුර විමර්ෂණ සඳහා ඇත.

21.2 ප්‍රාග්ධන බැඳීම්

පහත ප්‍රාග්ධන බැඳීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 2016 දෙසැම්බර් 31 දිනට අනුමත කර ඇත..

2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණයවර ලිපි

ණයවර ලිපි අංකය	ගණන	මිලදී ගැනීම් විස්තරය
42007160002684	රු.1,937,582 (යුරෝ 12,269)	පොම්ප පුළුල්කිරීමේ සන්ධි / නම්‍ය ලෝහ නළ මිලට ගැනීමට
42004160001036	රු. 23,186,468 (ජපන් යෙන් 17,983,765)	අළුත් ටැංකි රථ මිලට ගැනීමට (ලීටර්6,600)
42004160000723	රු. 115,334,525 (ජපන් යෙන්) 89,455,150)	අළුත් ටැංකි රථ මිලට ගැනීමට (ලීටර් 19,800)

Bank Guarantees as at 31st December 2016

Bank Guarantee No	ගණන	Guarantor issued Party
43501140002346	රු. 280,000	ඉක්විප්මන්ට් ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
43501160003110	රු. 120,000	ඩයිනකොන් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
43501120007655	රු. 182,000	ඩයිනකොන් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
43501120007628	රු. 270,000	ඩයිනකොන් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
43502160001834	රු.157,925	ශ්‍රී ලංකා වරාය අධිකාරිය

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

21.2 ප්‍රාග්ධන බැඳීම් (පසු පිටුව සිට.....)

**පහත සඳහන්කර ඇති ව්‍යාපෘති කොන්ත්‍රාත් වටිනාකම රු. 50,000,000 ට වැඩි ඒවාය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පිරිනැමූ නමුත් සම්පූර්ණ නොකල ව්‍යාපෘති

විස්තරය	කොන්ත්‍රාත් වටිනාකම	2016. 12. 31 දිනට ගෙවූ	ගෙවියයුතු ගණන
	(රු.)	(රු.)	(රු.)
** බවුසර් 20	598,596,523	236,737,276	361,859,247
EPCC - කොලොන්නාව ස්ථාපනයේ ඝණ මීටර්15000 ටැංකිය	400,000,000	3,570,000	396,430,000
රට හරහා නළ මාර්ග ව්‍යාපෘතිය	94,850,000	46,629,068	48,220,932
ආපදාවලින් ගොඩඒමේ සහ කළමණාකරන මධ්‍යස්ථානය	300,000,000	-	300,000,000
අනුරාධපුර දැනට ඇති තොග ඩිපෝ සංවර්ධනය කිරීම	300,000,000	-	300,000,000
නළ මාර්ග පුනරුජ්ජාපන ව්‍යාපෘතිය	260,000,000	262,960,562	(2,960,562)
මුතුරාජවෙල පර්යන්තයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු	182,000,000	-	182,000,000
** කොලොන්නාව නිමාවේ ටැංකි අංක 18, 19, 22, 23 සහ 41 සඳහා අභ්‍යන්තර පාවෙන වහලවල් සවිකිරීම	120,666,000	41,520,442	79,145,558
නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශන සේවා ලබා ගනිමින් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි කොලොන්නාව නිමාවේ ප්‍රතිව්‍යුහගත කිරීම සහ පහසුකම් වැඩිදියුණු කිරීම.	99,000,000	3,179,660	95,820,340
කොලොන්නාව නිමාවේ ප්‍රධාන සහ අතුරු මාර්ග වැඩිදියුණු කිරීම	80,000,000	66,127,949	13,872,051
මුතුරාජවෙල පර්යන්තයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු	182,000,000	1,638,000	180,362,000
ඩීසල් ටැංකි තුනක් - Gasoline At Mt බවට හැරවීම	70,000,000	-	70,000,000
මුතුරාජවෙල පර්යන්තයේ ටැංකි අංක 6, 7 සහ 8 සඳහා අභ්‍යන්තර පාවෙන වහලවල් නිර්මාණය කිරීම, සැපයීම සහ සවිකිරීම	70,000,000	-	70,000,000
CCTV කැමරා සවිකිරීම	50,000,000	-	50,000,000
ව්‍යාපෘති වල මුළු වටිනාකම	2,807,112,523	662,362,957	2,144,749,566

** ගෙවනලද ගණනට අත්තිකාරම් ද ඇතුලුය.

2016. 12. 31 දිනට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද නමුත් පිරිනමා නැති ව්‍යාපෘති

ව්‍යාපෘති නම හෝ විස්තරය	කොන්ත්‍රාත් වටිනාකම (රු.)
නවීන පන්නයේ බණිජතෙල් රසායනාගාරය (කොලොන්නාව)	625,000,000
රට හරහා නළ මාර්ග ව්‍යාපෘතිය- මුතුරාජවෙල - කොලොන්නාව උපදේශන සහ සක්‍යතාව.	150,000,000
රට හරහා නළ මාර්ග ව්‍යාපෘතිය- ඩොල්පින් ජැටිය - කොලොන්නාව උපදේශන සහ සක්‍යතාව.	100,000,000
ගිනි නිවන රථ 01 ක්	90,000,000
උතුරු ඩිපෝව උපදේශන සහ සක්‍යතාව	75,000,000
කලාප 6 හි නළ මාර්ග වැඩි දියුණු කිරීම	180,000,000
අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2015 දී අනුමත කරන ලද නමුත් පිරිනමා නැති ව්‍යාපෘති	**1,220,000,000**

ව්‍යාපෘති නම හෝ විස්තරය	කොන්ත්‍රාත් වටිනාකම (රු.)
මාර්ගයේ, දුම්රිය හරස් මාර්ගයේ සහ පදිංචි ස්ථාන ඇති මහවත්ත ප්‍රදේශයේ විශ්කම්භය 12 වන නළ මාර්ග කොටස් සම්බන්ධව ඉංජිනේරුමය, ඉදිකිරීම්, පරීක්ෂාව සහ ස්ථාපනය	966,600,000
විශ්කම්භය 18 වන නළ මාර්ගයේ අකල් ඇණහිටීම ප්‍රතිරෝධනය කිරීම	148,000,000
තෙල් වෙන්කිරීම් සහ ප්‍රතිසාධන පද්ධතිය සංවර්ධනය කිරීම	52,700,000
බලශක්ති සංරක්ෂණය	50,000,000
අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2016 දී අනුමත කරන ලද නමුත් පිරිනමා නැති ව්‍යාපෘති	**1,217,300,000**

22. උකස්කර ඇති වත්කම්

වාර්තාකරන දිනට කිසිදු වත්කමක් උකස් ලෙස තබා නොමැත.

23. වාර්තාකරන කාලච්ඡේදයට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීම හෙළිදරව් කිරීම අවශ්‍යවන සැලකිය යුතු සිදුවීම් කිසිවක් වාර්තාකරන දිනයට පසු සිදුවී නොමැත..

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

24. පෙර වර්ෂයේ සංඛ්‍යාවන් නැවත වර්ගීකරණය කිරීම

මූල්‍ය ප්‍රකාශනවල තේරුම්ගත හැකි බව පුළුල් කිරීම සඳහා සහ වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා පෙර වර්ෂයේ සංඛ්‍යාවන් නැවත වර්ගීකරණය කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සහ මූල්‍ය වාර්තාවලට ආශ්‍රිත සටහන් වල පහත දැක්වෙන අයිතමයන් වෙනස් කර ඇත.

ප්‍රවර්තන වර්ෂය සමග සංසන්දනාත්මක බව සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල පහත දැ ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කොට ඇත. එසේම මූල්‍ය ප්‍රකාශනවල තේරුම්ගත හැකි බව සහතික කිරීම සඳහා මෙන්ම වඩාත් හොඳ ඉදිරිපත් කිරීම සඳහාත් වේ..

(අ) මූල්‍ය තත්ව ප්‍රකාශය

	පෙර වාර්තා කල පරිදි	වැඩිවීම / අඩුවීම	ප්‍රවර්තන වර්ෂයේ වාර්තා කල පරිදි
	31.12.2015 Rs.	Rs.	31.12.2015 Rs.
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු			
වෙළඳ ගෙවිය යුතු - ආශ්‍රිත පාර්ශවයන්	642,346,312	456,210	642,802,522
වෙළඳ ගෙවිය යුතු - වෙනත්	508,313,350	(70,108,520)	438,204,830
වෙනත් ගෙවිය යුතු	327,210,553	69,652,310	396,862,863
	1,477,870,215	-	1,477,870,215

වෙනත් ගෙවිය යුතු දෑ තුල ඇතුලත්ව තිබූ ආශ්‍රිත පාර්ශවයන්ට ගෙවිය යුතු ප්‍රමාණයක් ආශ්‍රිත පාර්ශවයන්ට ගෙවිය යුතු දෑ යටතේ නැවත වර්ගීකරණය කොට ඇත. තවදුරටත් වෙළඳ ගෙවිය යුතු දෑ තුල ඇතුලත්ව තිබූ වෙනත් ගෙවිය යුතු , වෙනත් ගෙවිය යුතු දෑ යටතේ නැවත වර්ගීකරණය කොට ඇත..

(ආ) ලාභ හෝ අලාභ ප්‍රකාශය

	පෙර වාර්තා කල පරිදි	වැඩිවීම / අඩුවීම	ප්‍රවර්තන වර්ෂයේ වාර්තා කල පරිදි
	31.12.2015		31.12.2015
අයභාරය	Rs.	Rs.	Rs.
මෙහෙයුම් අයභාරය	9,138,472,024	233,560,310	9,372,032,334
ප්‍රවාහන ආදායම	(524,239,295)	2,792,919,265	2,268,679,970
නැව් තෙල් මෙහෙයුම්	986,062	45,564,781	46,550,843
සෘජු වියදම්	(3,576,928,635)	(2,838,484,044)	(6,415,412,679)
දළ ලාභය	5,038,290,156	233,560,312	5,271,850,468
වෙනත් මෙහෙයුම් ආදායම්	454,821,413	(152,120,943)	302,700,470
පරිපාලන වියදම්	(3,803,275,275)	149,569,087	(3,653,706,188)
විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්	-	(3,952,141)	(3,952,141)
මෙහෙයුම් ලාභය	-	(6,503,997)	227,056,315
මූල්‍ය ආදායම්	25,810,176	6,503,996	32,314,172
මූල්‍ය වියදම්	-	(233,560,311)	(233,560,311)
බදු පෙර ලාභය	25,810,176	(227,056,315)	25,810,176
ආදායම් බදු වියදම්	(341,662,709)	-	(341,662,709)
වර්ෂය සඳහා ලාභය	(315,852,533)	-	(315,852,533)

අයභාරයට එරෙහිව හිලව් කරන ලද සෘජු වියදම්, සෘජු වියදම් ලෙස නැවත වර්ගීකරණය කොට ඇත.

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

25. මූල්‍ය අවදානම් කළමණාකරන පරමාර්ථ සහ ප්‍රතිපත්ති

වෙළඳපොල අවදානම, පොලී අනුපාත අවදානම, විදේශ විනිමය අවදානම, ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානමට සමාගම නිරාවරණය වී ඇත. සමාගමේ කළමණාකාරිත්වය මෙම අවදානම් කළමණාකරනය සුපරීක්ෂණය කරයි. මූල්‍ය අවදානම සම්බන්ධයෙන් සහ සමාගම සඳහා සුදුසු මූල්‍ය අවදානම් පාලන ආකෘතියක් පිළිබඳ උපදෙස් සපයමින් විගණන කමිටුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වෙයි..

සමාගමේ මූල්‍ය අවදානම් භාරගැනීමේ ක්‍රියාකාරකම් සහ ඒවා පාලනය කරනු ලබන සුදුසු ප්‍රතිපත්ති හා ක්‍රියාදාමයන් පිළිබඳව සහ සමාගමේ ප්‍රතිපත්ති වලට අනුව සහ සමාගමේ අවදානම් පිළිබඳව රුචිකත්වය අනුව අවදානම් හඳුනාගැනීම, මිනුම් කිරීම සහ කළමණාකරනය කිරීම පිළිබඳව විගණන කමිටුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට මගපෙන්වයි.

25.1 වෙළඳපොල අවදානම

වෙළඳපොල අවදානම යනු, මූල්‍ය සාධන පත්‍රයක අනාගත මූල්‍ය ප්‍රවාහයන්ගේ සාධාරණ අගය, වෙළඳපොල මිල ගණන් වල වෙනස්වීම නිසාවෙන් උච්ඡාවචනය වීමයි.

වෙළඳපොල අවදානම වර්ග දෙකක අවදානම් වලින් සමන්විත වේ:

* පොලී අනුපාත අවදානම
* විදේශ විනිමය අවදානම

වෙළඳපොල අවදානම කළමණාකරනය කිරීමේ පරමාර්ථය වන්නේ, ප්‍රතිලාභය උපරිම කරමින්, පිළිගත හැකි මිනුම් දඩු තුල, වෙළඳපොල අවදානම් නිරාවරණයවීම් කළමණාකරනය කිරීම සහ පාලනය කිරීමයි.

25.1.1 පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු, වෙළඳපොල පොලී අනුපාතයන්ගේ වෙනස්කම් නිසාවෙන්, මූල්‍ය සාධන පත්‍රයක අනාගත මූල්‍ය ප්‍රවාහයන්ගේ සාධාරණ අගය උච්ඡාවචනය වීමයි. වෙළඳපොල පොලී අනුපාතයන් වෙනස්වීමේ අවදානමට සමාගම නිරාවරණයවීම, පාවෙන අනුපාතයන් සහිත සමාගමේ දිගු කාලීන ණය ගැනීම් වලට සම්බන්ධ වේ.

පොලී අනුපාතයන්ගේ සංවේදීතාවය

පහත වගුව මගින් පෙන්නුම් කරන්නේ, අනෙකුත් සියලු විචල්‍යයන් ස්ථාවරව පවතිනවිට, සමාගමේ බදු පෙර ලාභය (පාවෙන අනුපාත දිගු කාලීන ණය ගැනීම් මත වන බලපෑම හරහා) පොලී අනුපාතයන්ගේ සාධාරන විය හැකි වෙනස්කම් වලට දක්වන සංවේදීතාවයයි.)

	මූලික ලකුණුවල වැඩිවීම / (අඩුවීම)	බදු පෙර ලාභය මත බලපෑම රු.
2016	(+)100 මූලික ලකුණු	(1,496,331)
	(-)100 මූලික ලකුණු	1,496,331

පොලී අනුපාත සංවේදීතා විශ්ලේෂණය සඳහා මූලික ලකුණුවල උපකල්පිත පැතිරීම, පදනම්වී ඇත්තේ LIBOR වැනි මූලික අනුපාතයන්ට, ප්‍රවර්තන නිරීක්ෂ්‍ය වෙළඳපොල පරිසර වෙනස්කම් ය.

25.1.2 විදේශ විනිමය අවදානම

විදේශ විනිමය අවදානම යනු, විදේශ විනිමය අනුපාතයන්ගේ වෙනස්කම් නිසාවෙන්, ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර ඇතුලත්ව දෙසැම්බර් 31 දිනට පවතින මූල්‍ය වත්කම් සහ වගකීම් වල සාධාරණ අගයන්ගේ සිදුවන උච්ඡාවචනයන්ය.

පහත වගුව මගින් ගෙනහැර දක්වන්නේ, අනෙකුත් සියලු විචල්‍යයන් ස්ථාවරව පවතිනවිට, ඇමරිකානු ඩොලර් විනිමය අනුපාතයේ සිදුවිය හැකි සාධාරන වෙනස්කම් වලට සංවේදීතාවයයි. සමාගමේ බදු පෙර ලාභය මත වන බලපෑම මූල්‍ය වත්කම් වල සාධාරණ අගය වෙනස්වීම නිසාවෙනි. අනෙකුත් සියලු විදේශ විනිමයන්ට සමාගමේ නිරාවරණයවීම සැලකිය යුතු නොවේ.

	සාමාන්‍ය වටිනාකම	වර්ෂය අවසාන විනිමය අනුපාතය	ඇමරිකානු ඩොලර් අනුපාතයේ වෙනස	බදු පෙර ලාභය මත බලපෑම (රු.)
2016				
මුදල් සහ මුදල් සමාන දෑ - බැංකුවේ මුදල් (ඇමරිකානු ඩොලර්)	895	151.50	+/- 1%	+/-9
මුදල් සහ මුදල් සමාන දෑ - ස්ථාවර තැන්පතු (ඇමරිකානු ඩොලර්)	1,878,130	151.50	+/- 1%	+/- 18,781

මූල්‍ය ප්‍රකාශ වලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

25. මූල්‍ය අවදානම් කළමණාකරන පරමාර්ථ සහ ප්‍රතිපත්ති (පසු පිටුව සිට.....)

25.2 ණය අවදානම

ණය අවදානම යනු, මූල්‍ය අලාභයක් ඇතිකරමින්, මූල්‍ය සාධන පනුයක් හෝ පාරිභෝගික ගිවිසුමක් යටතේ, අනෙක් පාර්ශවය සිය බැඳීම් සපුරා නොගැනීමේ අවදානමයි. සමාගම සිය මෙහෙයුම් කටයුතු වලදී (මූලිකවම වෙළඳ ලැබිය යුතු දෑ සඳහා) සහ බැංකු සහ මූල්‍ය ආයතන සමග ඇති තැන්පතු ඇතුළුව සිය මූල්‍ය කටයුතු වලදී සමාගම ණය අවදානමට නිරාවරණයවී ඇත.

වෙළඳ ලැබිය යුතු

ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් ණය අවදානම කළමණාකරනය කිරීම සඳහා පහත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ඇත:
• වෙළඳ ණයගැති පසු විපරම් රැස්වීම් නිරතුරුව පැවැත්වීමෙන් ගණුදෙනුකරුවන්ගෙන් හිඟ ලැබිය යුතු දෑ නිතිපතා විමසුමට ලක්වේ.

25.3 ද්‍රවශීලතා අවදානම

වාර්ෂික පදනම මත සිය මෙහෙයුම් මුදල් අවශ්‍යතාවයන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මකවන කාලසීමාව අනුව ව්‍යාපෘති මුදල් අවශ්‍යතාවයන් පුරෝකථනය කරමින්, සමාගම සිය අරමුදල් හිඟවීමේ අවදානම අධීක්ෂණය කරයි. සමාගමේ අරමුණ වනුයේ මූල්‍යනය කිරීමේ අඛණ්ඩතාවය සහ බැංකු ණය, බැංකු අයිරා භාවිතය හරහා නම්‍යශීලිභාවය අතර සමබරතාවයක් පවත්වාගෙන යාමයි. සිය ණය ප්‍රතිමූල්‍යකරණය සම්බන්ධයෙන් අවදානම ගොනුවී ඇති ආකාරය සමාගම විසින් තක්සේරුකර ඇති අතර, එය පහත් මට්ටමක පවතින බව නිගමනය කර ඇත. මූල්‍යනය කිරීමේ මූලාශ්‍රයන්ට ප්‍රවේශය ප්‍රමාණවත්ව පවතින අතර, ප්‍රවර්තන මෙහෙයුම් මූල්‍යනය කිරීම දැනටමත් සුරක්ෂිතය.

පහත වගුව මගින් සාරාංශකර දක්වා ඇත්තේ, ගිවිසුම්ගත වට්ටම් නොකල ගෙවීම් පදනම් කරගෙන සමාගමේ මූල්‍ය වගකීම්වල කල්පිරෙන ආකෘතියයි.:

	වර්ෂයකට වඩා අඩු රු.	වර්ෂයකට වඩා වැඩි රු.	එකතුව රු.
පොලි සහිත ණය සහ ණය ගැණීම්	599,114,311	911,050,854	1,510,165,166
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු	1,311,033,498	-	1,311,033,498
	1,910,147,809	911,050,854	2,821,198,663

25.4 ප්‍රාග්ධන අවදානම් කළමණාකරනය

ප්‍රාග්ධන කළමණාකරනය කරන විට සමාගමේ අරමුණ වනුයේ කොටස් හිමියන්ට ප්‍රතිලාභ සැපයීමට සහ අනෙකුත් ඇල්මැති පාර්ශවයන්ට ප්‍රතිලාභ සැලසීම සඳහා අඛණ්ඩභාවයෙන් යුතුව පැවතීමට සමාගමට ඇති හැකියාව සුරක්ෂිත කිරීම සහ ප්‍රාග්ධනයේ පිරිවැය අඩුකිරීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වාගෙන යාමයි. ප්‍රාග්ධන ව්‍යුහය පවත්වාගෙන යාම හෝ ගැලපීම සඳහා සමාගම විසින් කොටස් හිමියන්ට ගෙවූ ලාභාංශ ගැලපීම, කොටස් හිමියන්ට ප්‍රාග්ධනය ආපසු ගෙවීම, නව කොටස් නිකුත්කිරීම හෝ ණය අඩුකිරීම සඳහා වත්කම් විකිණීම සිදු කරනු ලබයි. කර්මාන්තයේ අනෙක් අය සමග යථායෝග්‍ය වී, තෝලන අනුපාතය පදනම් කරගෙන ප්‍රාග්ධනය අධීක්ෂණය කරනු ලබයි.

	2016 රු.	2015 රු.
මුළු ණය ගැණීම් (සටහන 18) ශුද්ධ	1,510,165,166	2,180,510,982
ණය	1,510,165,166	2,180,510,982
මුළු ස්කන්ධය	22,850,811,934	21,389,228,106
මුළු ප්‍රාග්ධනය	24,360,977,100	21,389,228,106
තෝලන අනුපාතය	7%	10%

පසුගිය වසර 5 ක මූල්‍ය සංක්ෂිප්තය (රු. 000's)

මෙහෙයුම් වලින් මූල්‍ය ප්‍රතිඵල	2016	2015	2014	2013	2012
ආදායම	12,663,445	11,687,263	14,998,684	14,873,965	11,672,436
දළ ලාභය	6,001,755	5,271,850	5,303,409	5,162,412	5,570,185
මෙහෙයුම් ලාභය	2,406,478	1,916,893	2,582,550	2,232,550	2,859,637
බදු පෙර ලාභය	2,330,073	1,715,646	2,188,470	1,601,839	2,193,477
බදු පසු ලාභය	1,738,629	1,373,984	1,913,301	1,385,822	2,117,564
කොටසක ඉපයුම	2.32	1.83	2.55	1.85	2.82
මූල්‍ය තත්වය					
ප්‍රකාශිත ප්‍රාග්ධනය	7,500,000	7,500,000	7,500,000	7,500,000	7,500,000
ප්‍රාග්ධන සංචිතය	979,000	979,000	979,000	979,000	979,000
රඳවාගත් ඉපයීම්	14,371,812	12,910,228	11,268,732	9,395,428	7,868,732
මුළු හිමිකම්	22,850,812	21,389,228	19,747,732	17,874,428	16,347,732
ජංගම වත්කම්	10,809,703	10,174,620	12,174,110	10,365,112	7,705,924
ජංගම වගකීම්	2,057,201	2,487,082	5,754,519	5,759,783	5,219,732
කාරක ප්‍රාග්ධනය	8,752,502	7,687,538	6,419,591	4,605,329	2,486,192
ජංගම නොවන වත්කම්	17,249,188	17,095,145	17,335,782	18,112,346	19,285,175
ජංගම නොවන වගකීම්	3,150,878	3,393,455	4,007,641	4,843,247	5,423,635
ශුද්ධ වත්කම්	22,850,812	21,389,228	19,747,732	17,874,428	16,347,732

Ceylon Petroleum Storage Terminals Limited
Kolonnawa,Wellampitiya,Sri Lanka
Tel: 011-2572307 Website: www.cpstl.lk